අ.පො.ස. සාමාන්‍ය පෙළ ඉලක්ක ප්‍රශ්නෝත්තර

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## Bussiness & Accounting Studies



ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනාංශය
කළමනාකරණ අධ්‍යයන පීඨය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

**(අ.පො.ස. සාමාන්‍ය පෙළ)**

# ස්ව අධ්‍යයන අභ්‍යාස වැඩ පොත

**(සෑම පාඩමකටම අදාළව බහුවරණ ප්‍රශ්න රචනා ප්‍රශ්න සහ ආදර්ශ පිළිතුරු සමගින්)**

**Path Finders** කණ්ඩායම් ව්‍යාපෘතිය

**ස්ව අධ්‍යයන අභ්‍යාස වැඩ පොත**

කළමනාකරණ අධ්‍යයන පීඨය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

**ISBN :- ISBN978-624-5884-01-8**

පිටකවරය :- S.P.K. Nadeeshan Kumara

ප්‍රථම මුද්‍රණය :- 2021.08.25

ප්‍රකාශනය :- Rajarata University of Sri Lanka, Mihintale
IS9254

දු.ක :- 025-2266643

E-mail :- info@rjt.ac.lk
Web :- www.rjt.ac.lk

## ව්‍යාපාර කළමනාකරණ අංශාධිපතිතුමාගේ පණිවිඩය

මෑත ඉතිහාසය තුළ මානවයා වෙත පැමිණි දරුණුතම සෞඛ්‍යය වසංගත තත්වයට අප වර්තමානයේ මුහුණ දෙමින් සිටින්නෙමු. මෙම වසංගත තත්වය සමාජ, ආර්ථික ක්ෂේත්‍රයට ඇතිකළ බලපෑම අතිමහත්ය. එවැනි වකවානුවකදී විශ්වවිද්‍යාල ශිෂ්‍යයාගේ වගකීම මැනවින් වටහා ගනිමින් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, කළමනාකරණ අධ්‍යයන පීඨයේ, ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශයේ තුන්වන වසර සිසු කණ්ඩායම විසින් සම්පාදිත මෙම ස්ව අධ්‍යයන ග්‍රන්ථය මහඟු සමාජ සත්කාරයකි. මෙම ග්‍රන්ථය ව්‍යාපාර අධ්‍යයනය සහ ගිණුම්කරණය හදාරණ 10 සහ 11 1වසර සිසු දරු දැරියන්ට ඔවුන්ගේ විෂය දැනුම වැඩිදියුණු කර ගැනීමටත් එම දැනුම ස්වඇගයීමකට ලක් කිරීමටත් මනා පිටුවහලක් වනු ඇත.

මෙම සමාජ සත්කාරයට ප්‍රධාන දායකත්වය සපයන ලද “Path Finders” සිසුන් කණ්ඩායමට මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමන අතර ඔවුන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි. මෙම වටිනා ග්‍රන්ථය සම්පාදනය කිරීමේදී නිසි මඟපෙන්වීම ලබාදුන් ව්‍යාපෘති කළමණාකරන විෂයභාර යශෝදා බණ්ඩාර කථිකාචාර්යතුමියටත් බුද්ධිකා සුරවීර සහකාර කථිකාචාර්යතුමියටත් මාගේ හදපිරි ස්තුතිය පිරිනමමි. මෙම ග්‍රන්ථයේ විමර්ශන කාර්යභාරය මැනවින් ඉටුකළ සිසිර විජේසූරිය ගුරු මහතාටත් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය වෙනුවෙන් මාගේ ගෞරවපූර්වක ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කොට ගනිමි.

අ.පො.ස (සා.පෙළ) ව්‍යාපාර අධ්‍යයනය සහ ගිණුම්කරණය හදාරණ සිසු දරුදැරියන්ට මෙම ග්‍රන්ථය මැනවින් පරිශීලනය කරමින් සිය අනාගත විභාග කඩයිම් සාර්ථකව ජයගතහැකි වේවා යනු අප සියළු දෙනාගේ ඒකායන ප්‍රාර්ථනාවයි.

මහාචාර්ය පී.එම්.බී. ජයතිලක

අංශාධිපති

ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය

කළමනාකරණ අධ්‍යයන පීඨය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

**සැකසුම, මෙහෙයවීම, මගපෙන්වීම හා විමර්ෂණය**

## සැකසුම (ව්‍යාපෘති කණ්ඩායම)



ඊ.ආර්.ඩී. කේ. ප්‍රියදර්ශනී ප්‍රේමතිලක



කේ.කේ.ඩී. ඉසුරිකා පීරිස්



එම්.ඒ.එන්. දිලක්ෂි



යූ.වී.එස්. විජේසූරිය



ආර්.පී.ජේ. එම්. කුමාර

## මෙහෙයවීම හා මඟපෙන්වීම

මහාචාර්ය පී.එම්.බී.ජයතිලක

අධ්‍යයන අංශ ප්‍රධානී

ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

ව්‍යාපෘති කළමනාකරණ විෂය භාර ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සී.එම්.වයි.එස්.එස් බණ්ඩාර

ව්‍යාපෘති කළමනාකරණ විෂය භාර සහය කථිකාචාර්ය එස්.එම්.බී.එල්.සුරවීර

ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

## විමර්ෂණය

සිසිර විජේසූරිය

වාණිජ්‍යවේදී විශේෂ ගෞරව උපාධිදාරී , රුහුණු විශ්වවිද්‍යාලය.

අ.පො.ස. සාමාන්‍ය පෙළ හා අ.පො.ස. උසස් පෙළ විභාග උත්තර පත්‍ර පරීක්ෂක

## පෙරවදන

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨයේ තෙවන වසරට අදාළව සිදුකළ යුතු කණ්ඩායම් ව්‍යාපෘතිය සඳහා “Path Finders” වන අප කණ්ඩායම තෝරා ගනු ලැබුවේ 2019 වසරේ සිට පැවති කොරෝනා වසංගතය හේතුවෙන් 10 සහ 11 වසර සිසුන් සඳහා ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණය විෂයට අදාළව අතපසු වූ විෂය කරුණු අවබෝධ කර ගැනීම සඳහා ඉගෙනුම් ආධාරකයක් වශයෙන් ස්ව අධ්‍යන ඉගෙනුම් කට්ටලයක් සකස් කිරීමයි. 10 සහ 11 ශ්‍රේණි වල ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණය විෂයනිර්දේෂයට අදාළ සියළුම විෂය කරුණු ආවරණය වන ආකාරයෙන් බහුවරණ හා රචනා ප්‍රශ්න හා පිළිතුරු ඇතුලත් කර මෙම පොත සකස් කර ඇත. ඒසේම මෙම පොත මුද්‍රණය කර තාක්ෂණික පහසුකම් අඩු පාසල් කීපයක 10 සහ 11 ශ්‍රේණිවල සිසුන්හට පොත නොමිලයේ බෙදා දීම අපගේ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණයි. එසේම මෙම ග්‍රන්ථය විද්‍යුත් පිටපතක් ලෙස අන්තර්ජාලය හරහා අවශ්‍ය කෙනෙකුට පරිශීලනය කිරීමට අප අවස්ථාව සලසා දෙනු ඇත. එමගින් ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය විෂය සම්බන්ධව අ.පො.ස. සාමාන්‍ය පෙළ විෂය නිර්දේෂයට අදාළ මූලික සංකල්ප හඳුනා ගැනීමට හා විෂය ගැටළු නිරාකරණය කර ගනීමට අවශ්‍ය අයෙකුට හැකියාව ලැබේ.

මෙම පොත අප විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති කළමනාකරණ විෂය භාර ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සි.එම්.වයි.එස්.එස් බණ්ඩාර හා ව්‍යාපෘති කළමනාකරණ විෂය භාර සහය කථිකාචාර්ය එස්.එම්.බි.එල්.සුරවීර යන ආචාර්යවරුන්ගේ හා ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශ ප්‍රධානි මහාචාර්ය පි.එම්.බි.ජයතිලක මහතාගේ පූර්ණ මඟපෙන්වීම හා අධීක්ෂණය යටතේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය විෂය උත්තර පත්‍ර පරීක්ෂක හා විෂය උගන්වන ගුරුභවතුන්ගේද සම්පූර්ණ විමර්ෂණය යටතේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, කළමනාකරණ අධ්‍යයන පීඨයේ තෙවන වසර (2016/2017) අධ්‍යාපනය ලබන අප විසින් පෙළ පොත්, ගුරු අත්පොත් මෙන්ම පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර පරිශීලනය කරමින් සකස් කර ඇත. ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය විෂයෙහි 10 ශ්‍රේණිය සහ 11 ශ්‍රේණියට අදාල සම්පූර්ණ විෂය නිර්දේශය ආවරණය කරමින් සකස් කරන ලද නම්‍යශීලී ප්‍රශ්න රටාව මගින් මගහැරුණු විෂය කරුණු ඉතා පහසුවෙන් ධාරණය කරගත හැකිවීම මෙහි ඇති සුවිශේෂී ගුණාංගයක් ලෙස පෙන්වා දීමට හැකිය.

2019 වසරේ අගසිට ගෝලීය වශයෙන් හටගත් දරුණු කොරෝනා වසංගතය හමුවේ පාසල් අධ්‍යාපන කටයුතු ඇණහිටිය නමුදු 2021 වසරට අදාළ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය 2022 වසරේ පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. ශ්‍රී ලංකාවේ දියුණු නාගරික ප්‍රදේශ වල අන්තර්ජාල තාක්ෂණය භාවිතා කරමින් පාසල් අධ්‍යාපන කටයුතු සිදුකලද දුෂ්කර ප්‍රදේශයන්හී පවතින දිළිඳුකම සහ අන්තර්ජාල තාක්ෂණය භාවිතා කරමින් පාසල් අධ්‍යාපන කටයුතු කිරීමට පහසුකම් නොමැතිවීම ආදී වූ විවිධ ගැටළු හමුවේ එම ප්‍රදේශයන්හී සිසුනට මෙම විෂය කාණ්ඩය යටතේ මගහැරුණු විෂය කරුණු නැවත ලබාගෙන විභාගයට සාර්ථකව මුහුණදීමට අවස්ථාව මෙමගින් උදාවේ.

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය විෂයේ මගහැරුණු විෂය කොටස් මෙම පොත පරිශීලනය කරමින් ස්වයං අවබෝධය ලබමින් ඔබගේ ගැටළු සාර්ථකව විසඳාගනිමින් නුදුරේදී පැවැත්වෙන අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාග කඩයිම සාර්ථකව ජය ගැනීමට ඔබ සැමට හැකි වේවා යැයි මෙසේ සුභාශිංශන පලකරන්නෙමු.

## ස්තූතිය !

වර්තමානය වන විට ලෝකයේ පවතින දැඩි තරගකාරී අධ්‍යාපන ක්‍රමය තුළ දුෂ්කර ප්‍රදේශයන් හි වෙසෙන සිසු දරුවන් හට විභාග සහ අධ්‍යාපනය ජය ගැනීම අතිශය අභියෝගයක් වී ඇත. කෙසේ වෙතත් 2019 වර්ෂයේ ලෝකය පුරා පැතිර ගිය කොරෝනා වසංගතය හමුවේ පාසල් වසා දැමීම නිසා ඔවුනට නිදහස් අධ්‍යාපනයෙන් අධ්‍යාපනය හැදෑරීමට තිබූ එකම මාර්ගය ද අහිමි විය. අ.පො.ස සාමාන්‍ය පෙළ සහ අ.පො.ස උසස් පෙළ ආසන්න වසර වල සිසුනට මෙය දැඩි ලෙස බලපෑ අතර ඔවුන්ගේ ජීවන මට්ටම හමුවේ මේ සඳහා ගනු ලැබූ කිසිදු විකල්ප ක්‍රමවේදයක් භාවිතා කිරීමට නොහැකි අසරණ සිසු දරුවන් මෙම දුෂ්කර ප්‍රදේශ වල සිටියහ.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨයේ තෙවන වසර තුළ සිදු කළ යුතු කණ්ඩායම් ව්‍යාපෘතිය සඳහා මෙම අඩු පහසුකම් සහිත දුෂ්කර පාසල්වල සිසු දරුවන්ට කොරෝනා වසංගතය තුළින් අතපසු වූ විෂය කරුණු අධ්‍යයනය කළ හැකි ආකාරයේ ස්ව අධ්‍යයන ඉගෙනුම් කට්ටලයක් ඉගෙනුම් ආධාරකයක් ලෙස සකස් කර නොමිලේ බෙදා හැරීමට අප අදහස් කළෙමු. එසේම මෙහි විද්‍යුත් පිටපතක්ම අන්තර්ජාලයට පළ කිරීමද අපගේ ව්‍යාපෘතියේ තවත් එක් අරමුණකි.

මෙම අරමුණු ඉටු කර ගනිමින් පවතින කොරෝනා වසන්ගත අභියෝගයද හමුවේ අපගේ ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ගැනීම සඳහා ව්‍යාපෘති ආරම්භයේ සිට අවසානය දක්වාම අවශ්‍ය සියලු උපදෙස් ලබා දෙමින් අප මෙහෙය වූ ව්‍යාපෘති කළමණාකරණය විෂයභාර ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සි.එම්.වයි.එස්.එස් බණ්ඩාර හා සහය කථිකාචාර්ය එස්.එම්.බී.එල්.සුරවීර  යන ආචාර්ය වරුන් හට අපගේ විශේෂ ස්තූතිය පුද කරන්නෙමු.

එසේම මෙම ග්‍රන්ථය විශ්වවිද්‍යාලය හරහා ප්‍රකාශයට පත් කර බෙදා හැරීම සඳහා අවශ්‍ය සියලු උපදෙස් ලබා දී සහය දැක්වූ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යන අංශ ප්‍රධානී මහාචාර්ය පි.එම්.බී.ජයතිලක මහතාට මෙන්ම අප විශ්වවිද්‍යාලයේ පුස්තකාලාධිපති තුමිය වෙත ද අපගේ ස්තූතිය පළකරන්නෙමු. එසේම අප සකස් කළ මෙම කෘතිය පරීක්ෂාකළ අ.පො.ස සාමාන්‍ය පෙළ සහ අ.පො.ස උසස් පෙළ විභාග උත්තර පත්‍ර පරීක්ෂක හා එම විෂය උගන්වන සිසිර විජේසූරිය ගුරු පියාණන් හට ද බෙහෙවින් ස්තූතිවන්ත වන අතර මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ගැනීම සඳහා අප වෙත නන් අයුරින් සහය දැක්වූ සියළු දෙනා හට අපගේ ස්තූතිය පුද කරන්නෙමු.

# පිදුම

අඳුර කපා තොටුපල වෙත පැද යන්න

තොටියට සහය වෙන පුන් සඳ වැනිය නුඹ...

මහ මං මුලා නොම වී ගොඩබට එන්න

නැවියට සහය වෙන කුළුණේ පහන නුඹ...

නැණ පහනක් දල්වා දුර්ගුණ මකන..

ගුරු මා පියණී ඔබටයි මෙ තුති පිදුම!

# පටුන


| **10 වසර** | | පිටු අංක |
|---|---|---|
| 01 | ව්‍යාපාර පසුබිම | 1- 4 |
| 02 | ව්‍යාපාර පරිසරය | 5 - 6 |
| 03 | ව්‍යාපාර සංවිධාන | 7 -13 |
| 04 | ගිණුම්කරණය හැඳින්වීම | 14 - 16 |
| 05 | ගිණුම්කරණ සමීකරණය | 17 - 21 |
| 06 | ගනුදෙනුවල ද්විත්ව බලපෑම | 22 - 26 |
| 07 | මූලික සටහන් පොත් | 27 - 30 |
| 08 | මුදල් පොත සහ සුළු මුදල් පොත | 31 - 36 |
| 09 | බැංකු ගිණුම සහ බැංකු සැසඳුම් විස්තරය | 37 - 40 |
| 10 | ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, සහ පොදු ජ'නලය | 41 - 44 |
| 11 | ශේෂ පිරික්සුම | 45 - 47 |
| 12 | ගිණුම්කරණ වැරදි නිවරැදි කිරීම | 48 - 51 |
| **11 වසර** | | |
| 01 | වෙළෙඳාම සහ උපකාරක සේවා | 52 - 55 |
| 02 | කළමනාකරණය | 56 - 57 |
| 03 | අලෙවිකරණය | 58 - 59 |
| 04 | ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන | 60 - 63 |
| 05 | ගැලපුම් සටහන් ආශ්‍රිත මූල්‍ය ප්‍රකාශන | 64 - 68 |
| 06 | ලාභ අරමුණු කර නොගත් සංවිධාන | 69 - 72 |
| 07 | නිෂ්පාදන පිරිවැය ලේඛනය | 73 - 76 |
| 08 | ආයෝජනය | 77- 79 |
| | බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු | 80 - 81 |
| | රචනා ප්‍රශ්න සඳහා පිළිතුරු | 82 – 133 |
| | යොමුව | 134 |

**10 වසර**

# 01,02,03 පාඩම්

## ව්‍යාපාර පසුබිම /ව්‍යාපාර පරිසරය /ව්‍යාපාර සංවිධාන

## <u>හැඳින්වීම</u>

මිනිසාගේ පැවැත්ම සම්බන්ධව සලකා බලන කල්හි වර්තමානය වන විට එය ආර්ථික, සමාජය, තාක්ෂණික ආදී නොයෙක් පැතිකඩ ආශ්‍රයෙන් සංවර්ධනය වී ඇත. මිනිස් පැවැත්ම ක්‍රමයෙන් විකාශනය වන කල්හි සමාජයීය වශයෙන් දියුණුවක් ඇති වන විට ප්‍රාථමික අවශ්‍යතාවයන්ගෙන් ඔබ්බට ගොස් ක්‍රමයෙන් දියුණු වූ පුළුල් වූ අවශ්‍යතා හා වුවමනා මිනිසා තුළින් මතු වීමට පටන් ගන්නා ලදී. නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් යම් මාධ්‍යයක් හා පදනම් වෙමින් තමාට අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබා ගනිමින් සිය අවශ්‍යතා සහ වුවමනා සපුරා ගන්නා යුගයක් වර්තමානය වන විට ඇත්තේය. ව්‍යාපාර අධ්‍යනය කොටසේ පළමු පාඩම වන මෙයින් අරමුණු කරනු ලබන්නේ තමා වටා පවත්නා ව්‍යාපාර අද පවත්නා තාක් වර්ධනය වූයේ කෙසේද ඉදිරියට වර්ධනය විය යුත්තේ කුමන ආකාරයෙන්ද යන්න ශිෂ්‍යයා තුළ අවබෝධයක් ඇති කර දීමත් ව්‍යාපාර යන සංකල්පය යටතේ පවත්නා වූ විශේෂ වැදගත් කරුණු සම්බන්ධව අවධානය යොමු කරමින් ප්‍රායෝගිකව ව්‍යාපාර ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධව ශිෂ්‍යයා තුළ උනන්දුවක් ඇතිකර වීමත්ය.

ලොව පවත්නා සෑම ව්‍යාපාරයකටම ඊට සම්බන්ධ වූ පරිසරයක්/වටපිටාවක් ඇත. එම වටපිටාව ව්‍යාපාරය කෙරෙහි නිරන්තර ව බලපෑම් ඇති කරනු ලබයි. ව්‍යාපාර සැලසුම් කරන විට එය ක්‍රියාත්මක කිරීමට නියමිත පරිසරයක්/වටපිටාවක් සම්බන්ධව පූර්ණ විශ්ලේෂණයක් කිරීම මගින් ව්‍යාපාරයකට බොහෝ වාසි ළංකර ගත හැකිය. ඒ අනුව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී ඊට බලපෑම් ඇති කරන විවිධ සාධක ක්‍රියාත්මක වන වටපිටාව/පරිසරය ව්‍යාපාර පරිසරය ලෙස සරලව පෙන්වා දීමට හැකිය. ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීම මගින් ශක්තින්, දුර්වලතා,අවස්ථා හා තර්ජන හඳුනාගෙන ඊට විවිධාකාර වූ උපායමාර්ගික සැලසුම් සැලසුම් කිරීමත් විවිධ ප්‍රවණතා හඳුනාගෙන ඊට අනුගත වෙමින් කටයුතු කිරීම මගින් සාර්ථකත්වය දොරගුළු විවර කිරීම විවර වන ආකාරය මෙම ව්‍යාපාර පරිසරය පාඩම මගින් සිසුන් හට ලබා දීමට අපේක්ෂා කරයි.

ව්‍යාපාර සංකල්පය වර්තමානය වන විට පුළුල් මුහුණුවරක් ඔස්සේ ගමන් කරමින් වර්ධනය වන මාර්ගයක ඇත. මිනිස් අවශ්‍යතා සහ වුවමනා ක්‍රමයෙන් පුළුල් වන නිසාවෙන් ඒවා නිසි ලෙස සපුරාලීම උදෙසා විවිධාකාර වූ ව්‍යාපාර සංවිධාන වර්තමානය වන විට බිහිවී ඇත. මෙසේ අවශ්‍යතා සහ වුවමනා සපුරාලීම සඳහා අවශ්‍යවන භාණ්ඩ හා සේවා සැපයීමට පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් හෝ ඒකරාශී වීම ව්‍යාපාර සංවිධානයක් ලෙස පෙන්වා දීමට හැකිය. ව්‍යාපාර සංවිධාන ප්‍රධාන වශයෙන් හිමිකාරීත්වය, අරමුණ සහ පරිමාණය ආදී වූ පදනම ඔස්සේ වර්ග කර පෙන්වීමට හැකි අතර මෙකී පදනම් සම්බන්ධව පුළුල් අවබෝධයක් සිසුවා තුළ පැවතීම ඉතාමත් අගනේය. එම ව්‍යාපාරික සංවිධාන වර්ග අතරින් තමාට සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරා ගැනීමට ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ව්‍යවසායකයෙකු දැනුවත් වී සිටීම අත්‍යවශ්‍ය කරුණකි. පහතින් සඳහන් වන බහුවරණ සහ රචනා ප්‍රශ්න වලට සාර්ථකව පිළිතුරු සැපයීම තුළින් හා ඔබගේ ව්‍යාපාර පසුබිම, ව්‍යාපාර පරිසරය සහ ව්‍යාපාර සංවිධාන සම්බන්ධ දැනුම මැන ගැනීමට ඔබට හැකිවනු ඇත.



# 01 පාඩම

## ව්‍යාපාර පසුබිම

| බහුවරණ ප්‍රශ්න |
|---|

**1) ව්‍යාපාර යන්න පැහැදිලි කිරීම සඳහා වඩාත් සුදුසු ප්‍රකාශය වන්නේ,**
1. ලාභය පෙරදැරි කර මුදල් යොදවා කරන ආර්ථික කටයුත්තකි
2. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා කෙරෙන ඕනෑම ආර්ථික කටයුත්තකි
3. ආර්ථික සම්පත් ක්‍රියාත්මක වන අවස්ථාවකි
4. ආයෝජකයන්ගේ ආර්ථික ක්‍රියාවලියකි

**2) මිනිස් අවශ්‍යතාවයන් පමණක් අඩංගු පිළිතුර වන්නේ,**
1. ආහාර, අධ්‍යාපනය
2. අධ්‍යාපනය, තට්ටු නිවාස
3. තට්ටු නිවාස, ඇඳුම්
4. ආහාර, නිවාස

**3) මිනිස් වුවමනාවක් නොවන්නේ,**
1. සෞඛ්‍යය
2. ඉදිආප්ප
3. රක්ෂණ ඔප්පුව
4. ජංගම දුරකථනය

**4) පහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.**
1. අවශ්‍යතා අනිවාර්යයෙන්ම සපුරා ගත යුතුය
2. මිනිස් වුවමනා සීමිතය
3. පුද්ගලයන්ගේ අවශ්‍යතා විවිධය
4. අවශ්‍යතා ව්‍යාපාරිකයන්ට නිර්මාණය කළ හැකිය

**5) අවශ්‍යතා,**
1. සංකීර්ණ වේ
2. සීමාරහිත වේ
3. විවිධ වේ
4. පොදු වේ

**6) නිෂ්පාදිත ප්‍රධාන ලෙස වර්ග වන්නේ,**
1. අවශ්‍යතා හා වුවමනා ලෙසය
2. ඍජු හා වක්‍ර ලෙස ය
3. ප්‍රාථමික,ද්විතික හා තෘතීක ලෙසය
4. භාණ්ඩ,සේවා හා අදහස් ලෙසය

**7) ව්‍යාපාරිකයාගේ කාර්යභාරය වන්නේ,**
1. නීති සැකසීමයි
2. මිනිස් අවශ්‍යතා හඳුනාගෙන ඊට සුදුසු උවමනා නිර්මාණය කිරීමයි
3. අවශ්‍යතා සපුරාලීම යි
4. විවිධ ව්‍යාපාර සංවිධාන ආරම්භ කිරීමයි

**8) නිෂ්පාදන ක්‍රියාවලියේ අංගයක් නොවන්නේ,**
1. යෙදවුම්
2. ක්‍රියාවලිය
3. නිමවුම්
4. බෙදාහැරීම්

**9) භාණ්ඩවල ලක්ෂණයක් නොවන්නේ,**
1. නිෂ්පාදනය හා පරිභෝජනය එකවර සිදුවේ
2. වර්ග කළ හැකිය
3. සමාන ස්වරූපයක් ගනී
4. ගබඩා කළ හැකිය

**10) සේවාවක ලක්ෂණයක් නොවන්නේ,**
1. වෙන්කර නොහැකි බව
2. අස්පෘශ බව
3. කල් පැවැත්ම
4. ගබඩා කළ නොහැකි බව

**11) සේවා සැපයීමේ ව්‍යාපාර ලෙස සැලකිය නොහැක්කේ,**
1. අධ්‍යාපන ආයතන
2. රක්ෂණ ආයතන
3. රූපලාවණ්‍ය ආයතන
4. සපත්තු නිශ්පාදන ආයතන

**12) ස්වභාවධර්මයෙන් ලැබී ඇති දෑ ඒ ආකාරයෙන් ම උකහා ගැනීමේ කර්මාන්ත හඳුන්වනු ලබන්නේ,**
1. පෙරළුම් කර්මාන්තය
2. නිර්මාණ කර්මාන්ත ලෙසය
3. ගැලපුම් කර්මාන්ත ලෙසය
4. නිශ්කර්ශක කර්මාන්ත ලෙසය

**13) නිශ්පාදන සාධකයක් නොවන්නේ,**
1. භූමිය
2. ශ්‍රමය
3. ආහාර
4. ව්‍යවසායකත්වය

**14) මුදලේ ක්‍රමික විකාශයේ පළමු අදියර වනුයේ,**
1. විද්‍යුත් මුදල් භාවිතා කිරීම
2. ලෝහ භාවිතා කිරීම
3. චෙක්පත් භාවිතා කිරීම
4. ද්‍රව්‍ය මුදල් භාවිතය

**15) යම් ආයතනයක් එක් භාණ්ඩ වර්ගයක් මත නොරැඳී විවිධ විවිධ භාණ්ඩ නිෂ්පාදනය කිරීම හඳුන්වන්නේ,**
1. විශේෂ ප්‍රාගුණ්‍යය ලෙසය
2. විශේෂීකරණය ලෙසය
3. විවිධාංගීකරණය ලෙසය
4. ශ්‍රම විභජනය ලෙසය

**16) ශ්‍රී ලංකා මහ බැංකුව දළ ජාතික නිෂ්පාදනය ගණනය කිරීමේදී නිෂ්පාදනය වර්ග කරන්නේ,**
1. වෙළදාම හා උපකාරක සේවා ලෙසය
2. භාණ්ඩ, සේවා හා අදහස් ලෙසය
3. ප්‍රාථමික, ද්විතික හා තෘතීක ලෙසය
4. කෘෂිකාර්මික, කාර්මික සේවා ලෙසය

**17) නිමල් තම ගෙවත්තේ වගා කළ එළවළු තම පරිභෝජනයට ගෙන අතිරික්තය වෙළඳපොළට අලෙවි කරයි. නිමල්,**
1. ඍජු හා වක්‍ර නිෂ්පාදනයේ යෙදෙන්නෙකි
2. වක්‍ර නිෂ්පාදනයේ යෙදෙන්නෙකි
3. ඍජු නිෂ්පාදනයේ යෙදෙන්නෙකි
4. පාරිභෝගිකයෙකි

**18) ව්‍යාපාරයක ඇල්ම ඇති පාර්ශවයක් නොවන්නේ,**
1. අයිතිකරුවන්
2. කළමනාකරුවන්
3. තරගකරුවන්
4. නියෝජිතයන්

**19)** **තම නිෂ්පාදිත වල මිල තීරණය කිරීමේ අරමුණින් ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවය හඳුන්වන්නේ,**

1. කළමනාකරුවන්
2. තරගකරුවන්
3. සේවකයන්
4. ප්‍රජාව

**20)** **පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න**

1. ජීවත්වීම සඳහා අවශ්‍යතා සපුරා ගැනීම අත්‍යවශ්‍ය වේ (.................)
2. නිෂ්පාදනයේ ස්වභාවය අනුව ව්‍යාපාර සංවිධාන පෞද්ගලික හා පොදු වශයෙන් වර්ග දෙකකි (...............)

## 02 පාඩම

### ව්‍යාපාර පරිසරය

**21) ව්‍යාපාර පරිසරයේ ප්‍රධාන අංග දෙකක් වන්නේ,**

1. භෞතික පරිසරය තාක්ෂණික පරිසරය
2. සාර්ව පරිසරය ආර්ථික පරිසරය
3. අභ්‍යන්තර පරිසරය බාහිර පරිසරය
4. ආර්ථික පරිසරය තාක්ෂණික පරිසරය

**22) ව්‍යාපාරිකයෙකුට පහසුවෙන් පාලනය කළ හැකි පරිසරයකි,**

1. සමාජ හා සංස්කෘතික පරිසරය
2. ප්‍රජා පරිසරය
3. නෛතික පරිසරය
4. අභ්‍යන්තර පරිසරය

**23) පහත සඳහන් ඒවායින් ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධකයක් වන්නේ කුමක්ද?**

1. දේශපාලන හා නෛතික
2. ආර්ථිකය
3. කොටස්කරුවන්
4. තාක්ෂණික

**24) ව්‍යාපාර කටයුතුවලට බලපෑම් ඇති කරන අන්තර්ජාලය, විද්‍යුත් තැපැල, විද්‍යුත් බැංකුකරණය, ණයපත් ආදී සාධක ක්‍රියාත්මක වන පරිසරය වනුයේ,**

1. ආර්ථික පරිසරයයි
2. නෛතික පරිසරයයි
3. තාක්ෂණික පරිසරයයි
4. සමාජ හා සංස්කෘතික පරිසරය

**25) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධකයක් හා බාහිර පරිසර සාධකයක් පිළිවෙලින් අඩංගු පිළිතුර තෝරන්න.**

1. අයිතිකරුවන් කළමනාකරුවන්
2. අයිතිකරුවන් සේවකයන්
3. කළමනාකරුවන් ගෝලීය පරිසරය
4. ගනුදෙනුකරුවන් අයිතිකරුවන්

**26) ආර්ථික පරිසරයට අදාල සාධක පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න**

1. නීති රීති, මිල ගනන්, ජීවන මට්ටම, සිරිත් විරිත්
2. වැටුප් මට්ටම, ජීවන වියදම, පොලී මට්ටම, විනිමය අනුපාතය
3. වැටුප්, සිරිත් විරිත්, ආගමික කණ්ඩායම්, නාගරීකරණය
4. ජීවන වියදම, නීති රීති, ආකල්ප පුරුදු

**27) ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවල මෙහෙයුම් කටයුතු කෙරෙහි දේශපාලන පරිසරයද බලපායි. දේශපාලන පරිසරයට අදාළ නොවන කාරකය වන්නේ,**

1. රජයේ ව්‍යාපාර පෞද්ගලීකරණය කිරීම
2. රජයේ සේවකයින්ගේ වැටුප් වැඩි කිරීම
3. ඉන්ධන මිල ශීඝ්‍රයෙන් ඉහළ යාම
4. ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය

**28) පරිසරයට අයත් සාධක කිහිපයක් පහත දැක්වේ. අභ්‍යන්තර පරිසරයට අයත් සාධකයක් නොවන්නේ,**

1. අයිතිකරුවන්
2. සේවකයන්
3. ප්‍රජා පරිසරය
4. කළමනාකරුවන්

**29)** **බාහිර පරිසරය අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත හැකි අයිතම් මොනවාද?**

1. තර්ජන, ශක්තීන්
2. අවස්ථා, තර්ජන
3. තර්ජන, දුර්වලතා
4. ශක්තීන්, දුර්වලතා

**30)** **ව්‍යාපාරික අවස්ථාවක් නොවන්නේ,**

1. ළමා ජනගහනය ඉහළ යාම
2. වයස්ගත ජනගහනය ඉහල යාම
3. දේශපාලන අස්ථාවරත්වය
4. සාමය

**31)** **යම් රටක යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්ති, අයවැය ප්‍රතිපත්ති අදාළ වන නිවැරදි පරිසර සාධකය වන්නේ,**

1. ආර්ථික පරිසරය යි
2. නෛතික පරිසරය යි
3. දේශපාලන පරිසරය යි
4. තාක්ෂණික පරිසරය යි

**32)** **පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා විවිධ අණපනත් පැනවීම අයත් වන්නේ කුමන පරිසරයටද?**

1. දේශපාලන පරිසරය ට
2. නෛතික පරිසරය ට
3. ගෝලීය පරිසරය ට
4. ආර්ථික පරිසරය ට

**33)** **ආර්ථික පරිසර සාධකයක් නොවන්නේ,**

1. ආදායම් ව්‍යාප්තිය
2. පොලී අනුපාතයන්
3. දේශපාලන ප්‍රතිපත්ති
4. උද්ධමනය

**34)** **පරිසර හානි අවම වන පරිදි කරනු ලබන නිෂ්පාදනය,**

1. අතුරු නිෂ්පාදනය නම් වේ
2. ප්‍රතිචක්‍රීකරණය නම් වේ
3. හරිත නිෂ්පාදනය නම් වේ
4. චක්‍ර නිශ්පාදනය නම් වේ

**35)** **දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑම වන්නේ,**

1. වැඩි තරගකාරීත්වයකට මුහුණ දීමට සිදුවීම
2. පුහුණු ශ්‍රමය විදේශීය රටවලට ඇදී යාම
3. දේශීය ව්‍යාපාර වල පැවැත්ම අස්ථාවර වීම
4. විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම

# 03 පාඩම

## ව්‍යාපාර සංවිධාන

**36) ව්‍යාපාර සංවිධානයක පරිමාණය තීරණය කරනු ලබන නිර්ණායකයක් නො වන්නේ,**

1. සේවකයන්ගේ අතීත අත්දැකීම් හා පළපුරුද්ද
2. ව්‍යාපාර ප්‍රාග්ධන ප්‍රමාණය
3. භාවිතා කරන බලශක්ති ප්‍රමාණය
4. සේවක සංඛ්‍යාව

**37) ව්‍යාපාර සංවිධාන වල පවතින පොදු ලක්ෂණයක් නොවන්නේ,**

1. නාමයක් තිබීම
2. අරමුණක් තිබීම
3. වගකීම සීමිත වීම
4. ආර්ථික කටයුත්තක නියැලීම

**38) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන අයෙකු ප්‍රථමයෙන්ම සලකා බැලිය යුතු කරුණක් වන්නේ,**

1. ව්‍යාපාරික ගොඩනැගිල්ල කොතරම් විශාල විය යුතුද?
2. කළමනාකරණයට කවුරුන් යොදාගත යුතු ද?
3. බැංකුවකින් ණයක් ලබාගත යුත්තේ කෙසේද?
4. ව්‍යාපාරයේ ස්වභාවය කෙබඳුද?

**39) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජනයක් නොවන්නේ,**

1. ව්‍යාපාරය විසුරුවා හැරීම පහසුවීම
2. අනන්‍යතාවයක් ලැබීම
3. ණය ලබා ගැනීමේ පහසුව
4. ව්‍යාපාර නාමය තහවුරු වීම

**40) ව්‍යාපාර සංවිධාන හිමිකාරීත්වය අනුව වර්ග කෙරෙන ප්‍රධාන කොටස් දෙක තෝරන්න.**

1. පෞද්ගලික අංශය රාජ්‍ය අංශය
2. පෞද්ගලික අංශය විදේශ අංශය
3. පෞද්ගලික අංශයේ සමුපකාර අංශය
4. කුඩා පරිමාණ මහා පරිමාණ

**41) ව්‍යාපාරයක නෛතික පුද්ගලභාවය යනු,**

1. ව්‍යාපාරයේ පැවැත්ම අඛණ්ඩ වීම ය
2. ව්‍යාපාරය නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පෙනී සිටීමට ඇති හැකියාව ය
3. අයිතිකරුවන්ගේ වගකීම සීමාසහිත වීම ය
4. යම් පනතක් යටතේ ලියාපදිංචි කර තිබීම ය

**42) තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමට ඉදිරිපත් කළ යුතු ලියවිල්ලක් වන්නේ,**

1. සංස්ථා ප්‍රකාශය
2. හවුල්කරුවන්ගේ නාමලේඛනය
3. අයදුම්පත්‍රය
4. අධ්‍යක්ෂකවරුන්ගේ නාමලේඛනය

**43) තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි ට අදාල බලධාරියා වන්නේ,**

1. ව්‍යාපාර නාම රෙජිස්ටාර් ය
2. සමුපකාර සංවර්ධන කොමසාරිස් ය
3. සමාගම් රෙජිස්ටාර් ය
4. ප්‍රාදේශීය ලේකම් ය

**44) ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම දැකිය හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,**

1. හවුල් ව්‍යාපාර
2. කේවල ස්වාමි ව්‍යාපාර
3. රාජ්‍ය සංස්ථා
4. පොදු සමාගම්

**45)** **නීතිමය පුද්ගල භාවයක් රහිත ව්‍යාපාර සංවිධාන වර්ගයක් වන්නේ,**

1. සමාගම්
2. රාජ්‍ය සංස්ථා
3. සමුපකාර
4. රාජ්‍ය දෙපාර්තමේන්තු

**46)** **කේවල ස්වාමි ව්‍යාපාරයක් 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කළ යුත්තේ,**

1. ප්‍රාග්ධනය රු.500,000 කට වැඩි වූ විට ය
2. ව්‍යාපාරිකයාගේ නමින් හැර වෙනත් නමකින් ආරම්භ කරන විට ය
3. ව්‍යාපාරය නමට මුලින් සීමිත යන පදය භාවිතා කරන විට ය
4. ව්‍යාපාර දෙකම එකම නම පවතින විට ය

**47)** **පහත සඳහන් ප්‍රකාශ අතරින් කේවල ස්වාමි ව්‍යාපාරයක් සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වන්නේ,**

1. වගකීම සීමා රහිත ය
2. වගකීම සීමා සහිත ය
3. ප්‍රාග්ධනය රජය විසින් සපය යි
4. ලාභය බෙදා ගත යුතු ය

**48)** **හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී අදාළ වන පනත වන්නේ,**

1. 1890 හවුල් ආඥා පනත
2. 1918 ව්‍යාපාර නාම ආඥා පනත
3. පාරිභෝගික ආරක්ෂණ පනත
4. 1982අංක 17 දරණ සමාගම් පනත

**49)** **හවුල් ව්‍යාපාරයක පැවැත්ම බෙහෙවින් තහවුරු කරගත හැක්කේ,**

1. හවුල්කරුවන් ප්‍රාග්ධනයට සමානව දායක වීම
2. සියලුම හවුල් කරුවන් කළමනාකරණයට සක්‍රීය ලෙස සහභාගි වීමෙනි
3. ලිඛිත ගිවිසුමක් ඇති ව පවත්වාගෙන යාමෙනි
4. හවුල් ව්‍යාපාරය ලියාපදිංචි කිරීමෙනි

**50)** **හවුල් ව්‍යාපාරයක් සමග සංසන්දනය කිරීමේ දී කේවල් ස්වාමි ව්‍යාපාරයක දැකිය හැකි අවාසිදායක ලක්ෂණය වන්නේ,**

1. හවුල් ව්‍යාපාර තරම් කේවල ස්වාමි ව්‍යාපාර කෙරෙහි ගනුදෙනුකරුවන් වැඩි විශ්වාසයක් තබා නොමැත
2. කේවල ස්වාමි ව්‍යාපාරයක වගකීම සීමා රහිත වේ
3. කේවල ස්වාමි ව්‍යාපාරයක ගිනුම් තැබීම අනිවාර්ය නොවන නිසා දූෂණ හා වැරදි සිදුවිය හැකිය
4. කේවල ස්වාමි ව්‍යාපාරයක වැඩි දෙනකු සහභාගි කරගත නොහැකි නිසා ප්‍රාග්ධනය වැඩිකර ගත නොහැක

**51)** **හවුල් ව්‍යාපාරයක පවත්නා වූ ලිඛිත ගිවිසුම හඳුන්වන්නේ,**

1. හවුල් ඔප්පුව ලෙස ය
2. හවුල් එකඟතාවය ලෙස ය
3. හවුල් ගිවිසුම ලෙස ය
4. හවුල් ව්‍යවස්ථාව ලෙස ය

**52)** **හවුල් ව්‍යාපාර සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න**

1. නෛතික පැවැත්මක් නොමැති වීම
2. ලියාපදිංචි අනිවාර්ය නොවීම
3. වගකීම අසීමිත බීම
4. උපරිම සාමාජික ගණන 50ක් වීම

**53) රු. 1000 වැඩි ප්‍රාග්ධනයක් ඇති නම් ලිඛිත හවුල් ගිවිසුමක් තිබිය යුතුයැයි හැඳින්වෙන්නේ,**

1. 2007 අංක 7 දරන සමාගම් පනත
2. 1840 වංචා වැලැක්වීමේ ආඥා පනත
3. 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ලියාපදිංචිකිරීමේ පනත
4. 1890 හවුල් ආඥා පනත

**54) තනි පුද්ගල ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර යන ව්‍යාපාර දෙකටම පොදු වූ ලක්ෂණයක් නොවන්නේ,**

1. ලියාපදිංචි අනිවාර්ය නොවීම
2. වගකීම සීමා රහිත වීම
3. නෛතික පුද්ගල භාවයක් නොමැති කම
4. ලාභය බෙදීම

**55) ගණකාධිකාරිවරුන්, වෛද්‍යවරුන්, නීතිඥයන් වැනි වෘත්තිකයන් සඳහා සුදුසු ව්‍යාපාර සංවිධාන ක්‍රමය වන්නේ,**

1. තනි පුද්ගල ව්‍යාපාර
2. හවුල් ව්‍යාපාර
3. සමිති සංවිධාන
4. සී/ස පෞද්ගලික සමාගම්

**56) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශය යන දෙකේම ක්‍රියාත්මක වන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,**

1. සමුපකාර
2. සමාගම්
3. හවුල් ව්‍යාපාර
4. සංස්ථා

**57) සමාගමක් ලියාපදිංචි කළ බව සහතික කරමින් සංස්ථාවක සහතිකයක් නිකුත් කරන්නේ,**

1. පළාත් සභා මහ ලේකම්වරයා ය
2. වෙළඳ ඇමතිගේ ස්ථිර ලේකම්වරයා ය
3. සමාගම් රෙජිස්ටාර් වරයා ය
4. අභ්‍යන්තර වෙළඳ කොමසාරිස්වරයා ය

**58) කොටස් නිකුත් කිරීමෙන්, බැංකු ණය ලබා ගැනීමෙන් හා රාජ්‍ය අරමුදල් වලින් ප්‍රාග්ධනය සපයා ගතහැකි ව්‍යාපාර සංවිධානය වන්නේ,**

1. සීමාසහිත සමාගම්
2. සමුපකාර සමිති
3. රාජ්‍ය සංස්ථා
4. රාජ්‍ය දෙපාර්තමේන්තු

**59) සුභ සාධනය සඳහා පිහිටුවා ඇති පෞද්ගලික අංශය ව්‍යාපාර සංවිධානයකි,**

1. සමිති ව්‍යාපාර
2. හවුල් ව්‍යාපාර
3. රාජ්‍ය ව්‍යාපාර
4. සංස්ථාපිත සමාගම්

**60) සමුපකාර සමිතිවල ලක්ෂණයක් නොවන්නේ,**

1. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
2. ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය
3. සාමූහික අයිතිය
4. ලාභ උපරිම කිරීමේ අරමු

**61) සමුපකාර සමිති සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?**

1. සාමාජික සුභසිද්ධියට ප්‍රමුඛත්වය දීම
2. රජයට අයත් වීම
3. නෛතික පුද්ගල භාවයක් තිබීම
4. ලියාපදිංචිය අනිවාර්ය වීම

**62)** **සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව නම් ව්‍යාපාරය අයත් වන්නේ කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයටද?**

1. සමාගම්
2. සංස්ථා
3. හවුල් ව්‍යාපාර
4. සමූපකාර

**63)** **අවම වශයෙන් සීමාරහිත වගකීමක් ඇති සාමාජිකයන් දෙදෙනකුවත් සිටිය යුතු ව්‍යාපාර සංවිධානය වර්ගය වන්නේ,**

1. සීමාසහිත සමාගම්
2. ඒක පුද්ගල ව්‍යාපාර
3. සීමාසහිත සමූපකාර සමිති
4. හවුල් ව්‍යාපාර

**64)** **සාමාන්‍යයෙන් විශාල ප්‍රාග්ධනයක් එක්රැස් කර ගතහැකි ව්‍යාපාර සංවිධාන ක්‍රමය වන්නේ කවරක්ද?**

1. හවුල් ව්‍යාපාර
2. සමූපකාර සමිති
3. සීමිත සමාගම්
4. ඒක පුද්ගල ව්‍යාපාර

**65)** **කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර වල දැකිය නොහැකි එහෙත් සීමිත සමාගම් වල දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,**

1. අරමුණක් තිබීම ය
2. නෛතික පුද්ගල භාවයක් පැවතීම ය
3. ආර්ථික කටයුත්තක නියැලීම ය
4. අඛණ්ඩ පැවැත්ම

**66)** **ගනුදෙනුකරුවන්ම අයිතිකරුවන් වන ව්‍යාපාර සංවිධානය,**

1. වරලත් ව්‍යාපාර
2. කේවල ස්වාමී ව්‍යාපාර
3. සමූපකාර
4. සීමාසහිත සමාගම්

**67)** **ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංස්ථාවක් නොවන්නේ,**

1. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
2. පොල් සංවර්ධන අධිකාරිය
3. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
4. විදේශ සේවා නියුක්ති කාර්යංශය

**68)** **රාජ්‍ය සංස්ථාවල හා දෙපාර්තමේන්තුවල පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණයක් නොවන්නේ,**

1. අයිතිය හා පාලනය රජය සතු වීම
2. අඛණ්ඩ පැවැත්මක් තිබීම
3. නෛතික පුද්ගල භාවයක් තිබීම
4. තීරණ ගැනීමේ ස්වාධීනත්වය නැති වීම

**69)** **දෙපාර්තමේන්තු ව්‍යාපාරයක් නීතිය ඉදිරියේ පෙනී සිටිය යුත්තේ,**

1. දෙපාර්තමේන්තුවේ නිල නාමයෙනි
2. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල නාමයෙනි
3. දෙපාර්තමේන්තුව අයත් ඇමති වරයාගේ නිල නාමයෙනි
4. දෙපාර්තමේන්තුව අයත් ඇමති වරයාගේ පෞද්ගලික නාමයෙනි

**70)** **නීතිමය පුද්ගල භාවයක් ඇති ව්‍යාපාර සංවිධාන පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,**

1. හවුල් ව්‍යාපාර,තනි ව්‍යාපාර,සීමිත සමාගම්
2. සීමිත සමාගම්, හවුල් ව්‍යාපාර, සමූපකාර
3. සීමිත සමාගම්, රාජ සංස්ථා, සමූපකාර ව්‍යාපාර
4. හවුල් ව්‍යාපාර, තනි පුද්ගල ව්‍යාපාර, බද්ධ ව්‍යාපාර

**රචනා ප්‍රශ්න (ව්‍යාපාර පසුබිම,ව්‍යාපාර පරිසරය,ව්‍යාපාර සංවිධාන පාඩම්)**

**01)** මානව ඉතිහාසයේ මුල් යුගයේ සිටම මිනිසා තමාගේ අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීම සඳහා විවිධ දෑ භාවිතයට ගෙන ඇත. සමාජය සංකීර්ණ වීමත් සමඟ වුවමනාද සංකීර්ණ වී ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රබල බලපෑම නිසා ව්‍යාපාර ක්ෂේත්‍රයට ද සීඝ්‍ර වර්ධනයක් දැකිය හැකිය. පරිගණක භාවිතය හා අන්තර්ජාල සම්බන්ධතා නිසා ඕනෑම තොරතුරක් ක්ෂණික ම සපයා ගත හැකිය. අතිරික්ත නිෂ්පාදන හුවමාරුව තුළින් වෙළඳාම් ආරම්භවිය. විද්‍යුත් මුදල් භාවිතය නිසා ව්‍යාපාර කටයුතු වඩාත් පහසු වී ඇත. විද්‍යුත් වාණිජ හා ව්‍යාපාර කටයුතුවල ප්‍රබල වර්ධනයක් දැකිය හැකිය. මිනිස්සුන් තමන්ගේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා භාණ්ඩ හා සේවා අදහස් ප්‍රයෝජනයට ගනී.තරගකාරී ව්‍යාපාර බිහිවීමත් සමග පාරිභෝගිකයාට වාසි මෙන්ම අවාසිද තත්වයන්ට ද මුහුණදීමට සිදු වී ඇත. තරගකාරීත්වය නිසා ගුණාත්මක භාණ්ඩ මෙන්ම බාල භාණ්ඩ ද වෙළඳපල තුල  දැකිය හැකිය. වර්තමාන පාරිභෝගිකයා දැනුවත් සහ උගත් වීම නිසා, මිලදී ගැනීමේදී ඔහු විමසිලිමත් වේ. එමනිසා ව්‍යාපාරිකයාට වෙළඳපල තුලඅභියෝග රැසකට මුහුණදීමට සිදුවේ. ව්‍යාපාර විවිධ ක්ෂේත්‍ර ඔස්සේ විහිදී යන අතර එම ව්‍යාපාර විවිධ ආකාරයෙන් සංවිධානය වී ඇත.

1. සමාජය සංකීර්ණ වීමත් සමඟ පාරම්පරික අවශ්‍යතා වලට අමතරව අලුතින් එක්වූ අවශතා දෙකක් නම් කරන්න
2. විද්‍යුත් මුදල් යනු මොනවාද?
3. ව්‍යාපාර කටයුතු පහසු කරවීමට විද්‍යුත් මුදල් බලපා ඇති ආකාරය පැහැදිලි කරන්න
4. මේ සඳහන් ආකාරයට වෙළඳාම් ආරම්භ වූයේ කෙසේද?
5. තරඟකාරී ව්‍යාපාර නිසා පාරිභෝගිකයාට මුහුණ දීමට සිදුවිය හැකි වාසි එකක් ලියන්න
6. ව්‍යාපාර සංවිධාන ප්‍රධාන වශයෙන් වර්ග කල හැකි ආකාරයන් මොනවාද?
7. පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර සංවිධාන හතරක් නම් කරන්න
8. රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක් නම් කරන්න
9. අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන කෙසේ වර්ග කළ හැකි ද?

**02)** උසස් අධ්‍යාපන ආයතනයේ 10 ශ්‍රේණියට ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන විෂය උගන්වන ගුරුතුමා ව්‍යාපාර පරිසරය පිළිබඳ පාඩම ඉගැන්වීමට පෙර ප්‍රවේශයක් ලෙස ඊට කලින් දින රාත්‍රියේ ප්‍රවෘත්ති කාණ්ඩ කිහිපයක් සිසුන්ට ඇසෙන්නට සලස්වන ලදී. ඒවානම්,

I. අධික වර්ෂාපතනය හේතුවෙන් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුල එළවළු ටොන් ගණන් විනාශ වේ.
II. ජීවන වියදමට සරිලන වැටුප් ඉල්ලා “සවිමත්” සමාගමේ සේවක උද්ඝෝෂණයක්.
III. ව්‍යාපාරික ස්ථානවල භාණ්ඩ මිල දර්ශනය ප්‍රදර්ශනය නොකරන වෙළඳුන්ට දැඩි දඬුවම්.
IV. සියලුම ආගමික නායකයන්ගේ එකගත්වය මත ගව මස් අනුභවය තහනම් කිරීමේ නියෝගයක් පනවන ලෙස ඉල්ලීමක් කර ඇත.

මෙසේ පාඩමට පිවිස සිසුන් සමඟ සාකච්ඡා කරමින් පාඩම් ඉදිරියට කරගෙන යන ලදී. අවසානයේ දී පහත සඳහන් ප්‍රශ්න සිසුන්ගෙන් අසන ලදි. එම ප්‍රශ්න වලට ඔබ පිළිතුරු සපයන්න.

1. ඔබ ඉදිරියේ තබන ලද ප්‍රවෘත්ති කාණ්ඩ වලට අදාල වන පරිසරය නම් කරන්න.
2. ව්‍යාපාර පරිසරය ගැලීම් සටහනකින් වර්ග කර පෙන්වන්න.
3. වර්තමානයේ දී කාන්තාවන් රැකියාවල නියුක්ත වීම ඉහලය එම නිසා පැන නැගී ඇති ව්‍යාපාරික අවස්ථා දෙකක් සඳහන් කරන්න.
4. රජයක් විසින් නීති රීති පැනවීම මූලික අරමුණු මොනවාද?
5. ආර්ථික පරිසරයට අයත් සාධක හතරක් දක්වන්න.

**03)** ඇඳුම් මැසීම පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරූ ඇඟළුම් කම්හලක වසර තුනක කාලයක් මහන මැෂින් ක්‍රියාකරවන්නියක වශයෙන් සේවය කල සදමාලි නිවසේ ඇඟලුම් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කොට බැංකු ගිණුමේ තිබූ රු.100,000 මුදල් යොදවා ව්‍යාපාරය ආරම්භ කරන ලදී.

ඒ සඳහා ඇගේ ඇඟලුම් කම්හලේ මිතුරිය නිමාලි සේවයට පැමිණි අතර සදමාලි සිංගර් සමාගමෙන් පහසු ගෙවීමේ ක්‍රමයට මහන මැෂින් දෙකක් ද කතුරු, ටේප්, පටි වනාදියද මිලදී ගන්නා ලදී. සදමාලි සහ නිමාලි පමුණුවට ගොස් සතියකට වරක් අවශ්‍ය රෙදි නූල් ආදිය රැගෙනවිත් කමිස, ගවුම්,කොට කලිසම් යනාදිය මසා පොලිතීන් මලු වල අසුරා වෙළඳපලට යවනු ලැබීය.

1. මෙම සිද්ධියේ අඩංගු කරුණු පමණක් යොදාගෙන ව්‍යාපාරයේ භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය රූප සටහනකින් දක්වන්න
2. සදමාලිගේ ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත්ද?
3. සදමාලිගේ ව්‍යාපාරය සඳහා සුදුසු ව්‍යාපාර දැක්මක් ලියන්න
4. එම ව්‍යාපාරය සතු ශක්තීන් දෙකක් ලියන්න
5. මෙම ව්‍යාපාරයට එල්ලවිය හැකි අභියෝග දෙකක් ලියන්න
6. එම ව්‍යාපාරය ''මාලි ප්‍රඩක්ට්ස්'' ලෙස ලියාපදිංචි කිරීමට සදමාලි අදහස් කරයි. එය පදිංචි කළ යුතුද? එසේ නම් කුමන පනත යටතේ ද?
7. මෙම ව්‍යාපාරය දියුණු කිරීමට සදමාලිට ගත හැකි පියවර මොනවා ද?
8. මෙම ව්‍යාපාරයේ දියුණුව ප්‍රදේශයේ දියුණුවට බලපාන ආකාර දෙකක් ලියන්න.
9. නිෂ්පාදනය වර්ග කර දක්වන්න ''මාලි ප්‍රඩක්ට්ස්'' අයත් වන්නේ කුමන වර්ගයටද?
10. නිෂ්පාදිත වර්ග කර දක්වන්න''මාලි ප්‍රඩක්ට්ස්'' හී නිෂ්පාදිත මොනවාද?

**04)** ඉගෙනීමට එතරම් උනන්දුවක් නොදැක්වූ උපුලිට සහ විපුලිට සාමාන්‍ය පෙළ විභාගය සමත් කර ගැනීමට අපහසු විය. පාසල් අධ්‍යාපනයෙන් පසු නිවසේ ආර්ථික අපහසුතා නිසා ඉක්මනින්ම ආදායම් මාර්ගයක් සොයා ගැනීමට උපුලිට සිදුවිය. ඒ නිසා ඇය ළඟම පිහිටි ''ස්වීට් හවුස්'' ආයතනයේ සේවයට බැදුනි. විවිධ කැවිලි වර්ග සෑදීමට කැමැත්තක් දැක්වුවත් අනුන් යටතේ වැඩ කිරීමට ඇය අකමැතිය. මේ නිසා ඇගේ අදහස වනුයේ ඉන් ඉවත්වී විපුලිව හවුල් කරගෙන කැවුම්,කොකිස් නිෂ්පාදනය කර අලෙවි කිරීමයි. එහෙත් විපුලි තනිව ව්‍යාපාරයක් ඇරඹීමට අදහස් කරයි.

1. කේවල ස්වාමි ව්‍යාපාරයකට සාපේක්ෂව හවුල් ව්‍යාපාරයක ඇති වාසි ලෙස විපුලට ඉදිරිපත් කළ හැකි කරුණු දක්වන්න
2. විපුලි තනි ව්‍යාපාරයක් ඇරඹීමට අදහස් කර ඇත්තේ කුමන හේතු නිසා දැයි ඔබ සිතන්නේද? කරුණු හතරක් ලියන්න
3. ව්‍යාපාරයක නීතිමය පුද්ගලභාවය යනුවෙන් කුමක් අදහස් කරයිද? පහදන්න
4. මොවුන් හවුල් ව්‍යාපාරයක් අරඹයි නම් එහි ලියාපදිංචි සඳහා බලපාන නීතිය කුමක්ද?
5. පසුව මෙම ව්‍යාපාරය සීමිත පෞද්ගලික සමාගමක් බවට පත්කර ගැනීමට සමාගම ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළයුතු ලියකියවිලි 2ක් නම් කරන්න

**05)** රුක්ශාන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්මය පිළිබද උපාධිධාරියෙක් වන අතර ඔහු ගෙවතු අලංකාරය සම්බන්ධ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඔහුගේ පෞද්ගලික ඉතුරුම් රු.500,000ක් ව්‍යාපාරයට අවශ්‍ය උපකරණ ගැනීමට යොදවන ලදී. ඔහු විසින් වේගවත් ලෙස නිවාස සිදුවෙමින් පවතින මාලබේ නගරයේ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබයි. එම අවට ප්‍රදේශවලින් නිෂ්පාදනයට අවශ්‍ය පැළැටි පෝච්චි සහ අනෙකුත් අමුද්‍රව්‍ය මිලට ගන්නා ලදී. රුක්ශාන්ගේ මිතුරකු වන සමන්මල්ද රු.500,000ක මුදලක් ආයෝජනය කර ව්‍යාපාරයට සම්බන්ධ වූ අතර ව්‍යාපාර නාමය ''රුක්මල් උද්‍යානය'' ලෙස වෙනස් කිරීමට තීරණය කරන ලදී. ඔවුන් විසින් සේවකයින් විවිධ ප්‍රදේශවලින් බඳවා ගන්නා ලදී.

1. "රුක්මල් උද්‍යානය" ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න
2. "රුක්මල් උද්‍යානය" ලියාපදිංචිය අවශ්‍යද? හේතු දක්වන්න
3. මෙම ව්‍යාපාරය ලියාපදිංචිය සඳහා අදාල වන පනත කුමක්ද?
4. මෙම ව්‍යාපාරය සතු ශක්තියක් සහ අවස්ථාවක් ලියන්න
5. "රුක්මල් උද්‍යානය" ව්‍යාපාරයේ ඇති වාසි 2ක් ලියන්න
6. "රුක්මල් උද්‍යානය" ව්‍යාපාරයේ ඇති අවාසි 2ක් ලියන්න
7. ඉහත සඳහන් ව්‍යාපාරය සමාගම් බවට පරිවර්තනය කරනවා නම් ලබාගත හැකි වාසි මොනවාද
8. ඉහත සඳහන් ව්‍යාපාරයට අදාල ඇල්මැති පාර්ශ්ව දෙකක් ලියන්න
9. අයිතිකරුවන්ගේ අරමුණු දෙකක් ලියන්න
10. එම ව්‍යාපාරය කුමන පරිමාණයේ ව්‍යාපාරයක්ද? එසේ දැක්වීමට හේතු ලියන්න

# 04 පාඩම
## ගිණුම්කරණය හැදින්වීම
### <u>හැදින්වීම</u>

බොහෝ ව්‍යාපාර තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ තොරතුරු ඉතා වැදගත් වේ. ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මැති පාර්ශව වල තීරණ ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමේ ක්‍රියාවලිය ගිණුම්කරණය ලෙස හැඳින්විය හැකිය.මෙහිදී ගිණුම්කරණය යනුවෙන් අදහස් කරන්නේ මූල්‍ය ගිණුම්කරණය පමණි. මෙම පරිච්ඡේදය මගින් මූලික වශයෙන් ගිණුම්කරණය යන්න පැහැදිලි කරන අතර ගිණුම්කරණ අරමුණු සහ අවශ්‍යතාවය පිළිබඳව ද දක්වයි. ව්‍යාපාරයක විවිධ වූ ගනුදෙනු සිදු වන අතර එම විවිධ ගනුදෙනු නිසා ව්‍යාපාරයේ වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් සහ වියදම් බිහිවන බව මෙහිදී පැහැදිලි කරයි .වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් සහ වියදම් පිළිබඳව ශිෂ්‍යයාට පුළුල් අවබෝධයක් ලබා ගැනීම සඳහා මෙහිදී වෙන් වෙන් වශයෙන් මේවා සාකච්ඡා කරනු ලබයි.

මෙම පරිච්ඡේදයට අදාළ ව පහතින් සකස් කර ඇති බහුවරණ සහ රචනා ප්‍රශ්න වලට සාර්ථකව පිළිතුරු සැපයීම තුලින් ඔබට ගිණුම්කරණය සම්බන්ධ දැනුම වැඩි දියුණු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.



## බහුවරණ ප්‍රශ්න

**71) ගිණුම්කරණය යන්නෙන් කුමක් අදහස් වේද?**

1. ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මැති පාර්ශව වල තීරණ ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමේ ක්‍රියාවලිය.
2. ඓතිහාසික මූල්‍යමය ස්වභාවයක් ගන්නා තොරතුරු සාරාංශගතව බාහිර පාර්ශවයන්ට ලබාදීමේ ක්‍රියාවලිය.
3. අනාගත අභිමුඛ තොරතුරු විශ්ලේෂණාත්මකව ප්‍රධාන වශයෙන් කළමනාකරණය වෙත සැපයීමේ ක්‍රියාවලිය.
4. සියළුම ගණුදෙනු ගිණුම් පොත් වල සටහන් කිරීම.

**72) ගිණුම්කරණයේ ප්‍රධානම අරමුණ වන්නේ,**

1. ව්‍යාපාරය ප්‍රමාණවත් ලාභයක් උපයා තිබේ ද යන්න දැනගැනීම.
2. අභ්‍යන්තර සහ බාහිර පාර්ශවයන්ට ව්‍යාපාරය පිළිබඳ විවිධ තීරණ ගැනීම සඳහා අවශ්‍ය විවිධ තොරතුරු සැපයීම.
3. නීතිමය අවශ්‍යතා ඉටුකිරීම.
4. ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ දැනගැනීම

**73) ව්‍යාපාරික ගනුදෙනුවල ප්‍රතිඵල ලෙස ජනිත වන්නේ,**

1. වත්කම්, වගකීම් සහ වියදම්
2. වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් සහ වියදම්
3. ආදායම් සහ වියදම්
4. වත්කම් සහ හිමිකම්

**74) බණ්ඩාර විසින් නැවත විකිණීම සඳහා සැපයුම්කරුවෙකු ගෙන් රු.100 000 භාණ්ඩ තොගයක් ණයට ගැනීම මගින් ඇති වන්නේ,**

1. හිමිකමක් සහ වත්කමකි
2. වත්කමක් සහ වියදමකි
3. වත්කමක් සහ වගකීමකි
4. වගකීමක් සහ හිමිකමකි

**75) වත්කමක ලක්ෂණයක් නොවන්නේ,**

1. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවීම
2. අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම
3. ව්‍යාපාරයේ පාලනයට යටත් වීම
4. බේරුම් කිරීමේ දී ව්‍යාපාරයේ සම්පත් වලින් කොටසක් පිටතට ගලා යාම

**76) වගකීමක ලක්ෂණයක් නොවන්නේ,**

1. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම
2. වර්තමාන බැඳීමක් තිබීම
3. බේරුම් කිරීමේ දී ව්‍යාපාරයේ සම්පත් වලින් කොටසක් පිටතට ගලා යාම
4. අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම

**77) තොරතුරු වල අවශ්‍යතාවය සහ භාවිතා කරන පාර්ශවය මත ගිණුම්කරණය බෙදන ප්‍රභේද මොනවාද?**

1. ව්‍යාපාර ගිණුම්කරණය සහ පුද්ගල ගිණුම්කරණය
2. පොදු ගිණුම්කරණය සහ පුද්ගල ගිණුම්කරණය
3. මූල්‍ය ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණය
4. රාජ්‍ය ගිණුම්කරණය භාව්‍යාපාරගිණුම්කරණය

**78) ව්‍යාපාර ආයතනයක සිදුවන මූල්‍ය ක්‍රියාකාරකමක් නොවන්නේ,**

1. අත්පිට මුදලට භාණ්ඩ ගැනීම
2. සේවකයෙකු රැකියාවෙන් ඉවත් කිරීම
3. ණයට භාණ්ඩ ගැනීම
4. ණයට භාණ්ඩ විකිණීම

**79) ගිණුම් තැබීමට පදනම් කරගන්නා ආර්ථික ඒකකය හැඳින්වෙන්නේ,**

1. ආර්ථික සම්පත්
2. වෙළෙඳ ව්‍යාපාර
3. ගිණුම්කරණ ඒකකය
4. රාජ්‍ය සංස්ථා

**80) තොරතුරු භාවිතයට ගන්නා බාහිර පාර්ශවයන් වන්නේ**

1. මූල්‍ය ආයතන, අනාගත ආයෝජකයන් , ආදායම් බදු දෙපාර්තමේන්තුව
2. කොටස් හිමියන් ,කළමනාකරුවන් ,සේවකයන්
3. කළමනාකරුවන් ,අයිතිකරුවන් ,රාජ්‍ය ආයතන
4. සේවකයන්, ආදායම් බදු දෙපාර්තමේන්තුව, අයිතිකරුවන්

**81) වත්කම් නිර්වචනය කරන්න.**

…………………………………………………………………………………………………..
……………………………………………………………………………………………………
…………………………………………………………………………………………………..

**82) වගකීම් නිර්වචනය කරන්න.**

**…………………………………………………………………………………………………**
**………………………………………………………………………………………………**

**රචනා ප්‍රශ්න**

**01)** ගිණුම්කරණය යන්න නිර්වචනය කර එහි අරමුණු සහ අවශ්‍යතාවය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

**02)** වත්කම් සහ වගකම් යන්න නිර්වචනය කර එහි ලක්ෂණ ලියා දක්වන්න.

**03)** කමල් විසිනි ලී බඩු නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර එම ව්‍යාපාරයේ අයිතම කීපයක් පහත දැක්වේ. මෙම අයිතම පහත සඳහන් ශීර්ෂ යටතේ වර්ග කර දක්වන්න.

| අයිතම | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|
| | ජංගම වත්කම් | ජංගම නොවන වත්කම් | ජංගම වගකීම් | ජංගම නොවන වගකීම් |
| 1. දැව තොගය | | | | |
| 2. ණය පදනම මත මිලදී ගත් දැව සඳහා ගෙවිය යුතු මුදල | | | | |
| 3. ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු සඳහා ලබාගත් බැංකු ණය | | | | |
| 4. දැව කපන යන්ත්‍ර | | | | |
| 5. ඉදිරියට ගෙවා ඇති දුරකථන ගාස්තු | | | | |
| 6. ව්‍යාපාරය පවත්වාගෙන යන ගොඩනැගිල්ල | | | | |
| 7. ගෙවිය යුතුව පවතින විදුලි ගාස්තු | | | | |
| 8. ලී බඩු ණයට විකුණුම් වලින් ලැබීමට ඇති මුදල | | | | |
| 9. ව්‍යාපාරය වැඩ කටයුතු සඳහා භාවිතා කරන මෝටර් රථය | | | | |
| 10. ගෙවිය යුතු රක්ෂණ ගාස්තු | | | | |

# 05 පාඩම

## ගිණුම්කරණ සමීකරණය

### <u>හැඳින්වීම</u>

පසුගිය අවුරුදුවල අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රශ්න පත්‍ර පරීක්ෂා කිරීමේදී ගිණුම්කරණ සමීකරණයට අදාළව ප්‍රශ්න සැකසී ඇත. ව්‍යාපාරයකට ගිණුම්කරණ සමීකරණය ගොඩනගා ගැනීම ඉතා වැදගත් වෙයි. ව්‍යාපාරයක වත්කම් සහ එම වත්කම්වල හිමිකාරීත්වය ගිණුම් වාර්තා වල පෙන්නුම් කරනු ලබයි. මෙම පරිච්ඡේදය මඟින් ගිණුම්කරණ සමීකරණය පිළිබඳව සාකච්ඡා කරනු ලබන අතර මෙහිදී ගිණුම්කරණ සමීකරණය යනු කුමක්ද, ගිණුම්කරණ සමීකරණය ගොඩනගන ආකාරය සහ ගිණුම්කරණ සමීකරණය මූලික සංරචක පිළිබඳව පැහැදිලි කරයි. තවද ව්‍යාපාර ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පිළිබඳව පැහැදිලිව සාකච්ඡා කරනු ලැබේ. බාහිර වගකීම ඇති සහ නොමැති අවස්ථාආ වලදී ගිණුම්කරණ සමීකරණය ගොඩනගන ආකාරය සහ හිමිකම් වෙනස් වීම් සිදුවන අවස්ථා පිළිබඳ පැහැදිලි අවබෝධයක් මෙම පරිච්ඡේදය තුළින් ශිෂ්‍යයාට ලබා ගැනීමට හැකියාව පවතී. මෙම පරිච්ඡේදයට අදාළ ව පහතින් සකස් කර ඇති බහුවරණ සහ රචනා ප්‍රශ්නවලට සාර්ථකව පිළිතුරු සැපයීම තුළින් ඔබට ගිණුම්කරණ සමීකරණය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.



| බහුවරණ ප්‍රශ්න |
|---|

**83)** **රුවන් විසින් විකිණීම සඳහා රු.550 ,000 ක වටිනා භාණ්ඩ ණය පදනම මත මිලදී ගැනීම ගිණුම් ගත කිරීම මගින්**

1. හිමිකම් අඩුවන අතර වත්කම් වැඩිවේ
2. වත්කම් වැඩි වන අතර වගකීම් වැඩි වේ
3. හිමිකම හා වගකීම් යන දෙකම වැඩිවේ
4. හිමිකම සහ වත්කම් යන දෙකම වැඩිවේ

**84)** **සමන් විසින් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු.15, 000 ක් ව්‍යාපාරයෙන් ලබාගැනීම ගිණුම් ගත කිරීම මගින්**

1. වත්කම් සහ හිමිකම යන දෙකම අඩුවේ
2. වත්කම් හා හිමිකම යන දෙකම වැඩිවේ
3. වත්කම් අඩුවන අතර වගකීම් වැඩි වේ
4. වත්කම් අඩු වන අතර හිමිකම් වැඩිවේ

**85)** **හිමිකම වෙනස් වන අවස්ථා වන්නේ,**

1. ගැනිලි
2. අමතර ප්‍රාග්ධනය යෙදීම
3. ආදායම් සහ වියදම්
4. ඉහත සියල්ලම

**86)** **අමල්ගේ ව්‍යාපාරයේ 2019 වර්ෂය සඳහා තොරතුරු කිහිපයක් පහත දැක්වේ.**

- ප්‍රාග්ධනය රු. 500,000
- වර්ෂයට අදාළ ආදායම් රු.225,500
- වර්ෂයට අදාළ වියදම් රු.155,000
- මැයි 25 දින අයිතිකරු ව්‍යාපාරයට යෙදූ මුදල් රු. 150,000

**2019 .12 .31 දිනට හිමිකම වන්නේ,**

1. රු. 710,500
2. රු. 279,500
3. රු. 420,500
4. රු. 720,500

**87)** **වත්කම් සහ වගකීම් යන දෙකම වැඩිවීමට බලපාන ගනුදෙනුව වන්නේ,**

1. අයිතිකරු ව්‍යාපාරයෙන් මුදල් ගැනීම
2. ණයහිමියෙක් වූ අමරට මුදල් ගෙවීම
3. ව්‍යාපාරය බැංකුවෙන් ණයක් ලබා ගැනීම
4. භාණ්ඩ තොගයක් ණයට විකිණීම

**88)** **කමල් විසින් රු. 225 000 ට මිලදී ගත් භාණ්ඩ තොගයක් රු. 250 000 ට අත්පිට මුදලට විකිණීම ගිණුම් ගත කරන්නේ**

| | වත්කම් | = | හිමිකම් + වගකීම් |
|---|---|---|---|
| 1. | − 225,000<br>+ 250,000 | = | + 25,000 |
| 2. | + 250,000 | = | + 250,000 |
| 3. | − 225,000 | = | − 225,000 |
| 4. | − 25,000 | = | − 25,000 |

**89)** **ව්‍යාපාරයක හිමිකම වෙනස් වීමට බලපාන ගනුදෙනුව කුමක්ද ?**

1. රු. 100,000 බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම
2. ව්‍යාපාරයට රු. 400,000 ක බැංකු ණයක් ලබා ගැනීම
3. රු. 10,000 ක පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 25,000 කට අත්පිට මුදලට විකිණීම
4. උපචිත විදුලි ගාස්තු රු.5,000 ගෙවීම

**90)** **උපචිත රක්ෂණ ගාස්තු කුමාර සිය පෞද්ගලික මුදලින් ගෙවා ඇත. මෙම ගනුදෙනුව ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට කෙසේ බලපාන්නේද ?**

1. වත්කම් සහ වගකීම් යන දෙකම අඩුවීම
2. වත්කම් සහ හිමිකම යන දෙකම අඩුවීම
3. වගකීම අඩුවීම හා හිමිකම් වැඩිවීම
4. හිමිකම අඩුවීම සහ වගකීම් වැඩි වීම

**91)** **ආසිරි ව්‍යාපාරයේ 2019 වර්ෂයේ තොරතුරු කීපයක් පහත දැක්වේ.**

- ප්‍රාග්ධනයරු. 300,000
- වර්ෂයේ වියදම් රු. 20,000
- වර්ෂයේ ආදායම් රු. 25,000

**a)** **ව්‍යාපාරයේ හිමිකම වන්නේ,**

1. රු. 310,000
2. රු. 295,000
3. රු. 305,000
4. රු. 300,000

**b)** **ව්‍යාපාරයේ හිමිකරු විසින් අමතර ප්‍රාග්ධනය ලෙස රු. 50,000 ක් යෙද වූ විට වර්ෂය අවසානයේ හිමිකම වන්නේ,**

1. රු. 350,000
2. රු. 355,000
3. රු. 375,000
4. රු. 330,000

**c)** **යෙදවූ ප්‍රාග්ධනයට අමතරව හිමිකරු විසින් රු. 17 ,000 ක ගැනිලි සිදුකර ඇත්නම් ව්‍යාපාරයේ හිමිකම වන්නේ,**

1. රු. 338,000
2. රු. 340,000
3. රු. 335,000
4. රු. 330,000

92) ව්‍යාපාර ආයතනයක් විසින් 5% ක වෙළෙඳ වට්ටම කට යටත්ව ලකුණු කළ මිල රු.100 000 **භාණ්ඩ ණයට මිළ දී ගත් විට ගිණුම්කරණ සමීකරණයට බලපානු ලබන්නේ,**

| | වත්කම් | = | හිමිකම් | + වගකීම් |
|---|---|---|---|---|
| 1. | + 95,000 | = | | + 95,000 |
| 2. | + 100,000 | = | | + 100,000 |
| 3. | + 95,000 | = | − 5000 | + 100,000 |
| 4. | + 100,000 | = | + 5,000 | + 95,000 |

**93)** **ව්‍යාපාරයක සිදුවූ පහත ගනුදෙනු එබි ගිණුම වර්ෂය අවසානයේ වත්කම් වගකීම් සහ හිමිකම් අඩුවීම හෝ වැඩිවීම හෝ වෙනස් නොවීම සඳහන් කරන්න**

| | | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|---|
| 1. | අයිතිකරුවන් අමතර ප්‍රාග්ධනය යෙදීම | ……………. | ……………… | ………………. |
| 2. | අඩමාන ණය වෙන්කිරීම | …………… | ………………… | ……………… |
| 3. | පොලිය සහිතව ණය වාරික ගෙවීම | …………… | …………………. | ……………..... |
| 4. | විදුලි බිල ගෙවීම | …………… | …………………. | ……………… |

## රචනා ප්‍රශ්න

**(01)**චාමරීගේ ව්‍යාපාරයේ 2018.01.01 දිනට පහත සඳහන් ශේෂයන් පවතී.

- යන්ත්‍ර උපකරණ පිරිවැය  රු. 250,000
- වෙළඳ ණයගැතියෝ  රු.80,000
- ඉතිරි බඩු තොගය රු. 50,000
- අත ඉතිරි මුදල්  රු. 90,000
- බැංකු ණය රු. 150,000
- ණය හිමියෝ  රු. 30,000

2018 ජනවාරි මාසයට අදාල තොරතුරු පහත දැක්වේ.

1. රු. 15,000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 40,000 කට විකුණා ඇති අතර එදින රු. 25 000 මුදල් ලැබී ඇත.
2. රු.10,000 පිරිවැය වූ භාණ්ඩ තොගයක් සැපයුම්කරුවන් වෙත හරවා යවා ඇති අතර ඒ පිළිබඳ සටහනක් තැබීමක් සිදු කර නොමැත.
3. 2018 ජනවාරි මාසය සඳහා ලැබී ඇති විදුලි බිල්පත රු. 6,400 ක් වන අතර දුරකථන බිල් පත රු. 4,500 කි.
4. 2018 ජනවාරි මාසයේ සඳහා රු.8,000 බැංකු ණය වාරිකය ගෙවා ඇති අතර ඉන් රු. 2,000 ගෙවා ඇත්තේ ණය පොලී වෙනුවෙනි.
5. 10% ක වට්ටමක් අඩුකරගෙන ණයහිමියන්ට රු. 13,500 ගෙවා ඇත.
6. ණය ගැතියන් ගෙන් ලැබුණු මුදල් රු. 28,000 කි.
7. රු. 24,000 සේවකයන්ගේ වැටුප් ලෙස ගෙවන ලදී.
8. රු. 50,000 ක වටිනාකමකින් යුතු භාණ්ඩ ණයට ගන්නා ලදී.
9. අයිතිකරු ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා ලබාගන්නා ලද භාණ්ඩවල පිරිවැය රු. 5,000 කි.
10. රු. 3,500 රක්ෂණ ගාස්තු ගෙවා ඇත.

අවශ්‍ය වන්නේ,

i. 2018 .01.01 දිනට පවතින ශේෂයන් පහත සඳහන් ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්වන්න.
   හිමිකම් +  වගකීම් = වත්කම්

ii. ජනවාරි මාසය තුළ සිදුවී ඇති ගනුදෙනු හා සිදුවීම් ගිණුම්කරණ සමීකරණයට බලපාන අන්දම දක්වන්න. අඩු වීමක් නම් ( -  )  ලකුණ හෝ වැඩි වීමක් නම් ( +  )ලකුණ යොදන්න.

**02)** සේපාලිකාගේ ව්‍යාපාරයේ 2019 මාර්තු 31 දිනට පහත ශේෂ දැක්වේ.

- මුළු වත්කම් රු. 500,000
- අයිතිකරුගේ හිමිකම රු. 350,000
- මුළු  වගකීම් රු. 150,000

මැයි මාසය තුළ දී පහත සඳහන් ගනුදෙනු සිදුවිය.

1. අත්පිට විකුණුම් රු. 60000 කි. ඒවායේ පිරිවැය රු. 50,000 ක් විය.
2. භාණ්ඩ තොග ණයට ගැනුම් රු. 34,000
3. රු. 13,000 පිරිවැය වූ භාණ්ඩ රු. 26,000 ණයට විකුණා ඇත.
4. සේවකයන්ට ගෙවූ වේතන රු. 40,000
5. රු. 7,000 ක් පිරිවැය වූ භාණ්ඩ සමිතියකට පරිත්‍යාග කර ඇත.

6. ව්‍යාපාරයෙන් පුද්ගලික පාවිච්චිය සඳහා ලබා ගත් භාණ්ඩ රු. 5,000
7. මාසයට අදාළ ජල බිල්පත රු. 2,000 කි.
8. ගනුදෙනු කරුවකු විසින් ආපසු එවන ලද භාණ්ඩ රු. 4,500 ක් වන අතර භාණ්ඩ වල පිරිවැය රු. 2,500 කි.
9. ගෙවල් කුලී රු. 4,000 ක් ගෙවා ඇත.
10. රු. 5,000 ක ශේෂයක් තිබූ ණයගැති කමල් ගෙන් එකතු කර ගන්නා ලද මුදල රු. 3,600 කි. ඉතිරි බොල් ණය ලෙස කපා හරින ලදී.

අවශ්‍ය වන්නේ

i. පහත සඳහන් ආකාරයේ ගිණුම් සමීකරණයක් යටතේ ආරම්භක ශේෂ හා එක් එක් ගනුදෙනුව අගය පෙන්නුම් කරන්න. වත්කම්= වගකීම් + හිමිකම

ii. කාලච්ඡේදය අවසානයේ ඇති හිමිකම ගණනය කරන්න.

**03)** විමල්ගේ ව්‍යාපාරයේ මාර්තු මාසයේ සිදුවූ ගනුදෙනු වල වටිනාකම් ගිණුම්කරණ සමීකරණයක ආකෘතියෙන් පහත දැක්වේ.

| ගනුදෙනු අංකය | **ලී බඩු +** | **තොග +** | **ණයගැතියෝ** | **+ මුදල් =** | **ණයහිමියෝ +** | **ණය +** | **ප්‍රාග්ධනය** |
|---|---|---|---|---|---|---|---|
| 01 | | | | + 550,000 | | | + 550,000 |
| 02 | + 250,000 | | | | | +250,000 | |
| 03 | | + 12,000 | | | + 12,000 | | |
| 04 | | − 20,000 | + 50,000 | | | | + 30,000 |
| 05 | | | − 4,500 | | | | − 4,500 |
| 06 | | | − 65,000 | + 65,000 | | | |
| 07 | | | | − 82,000 | − 82,000 | | |
| 08 | | | | − 9,000 | | | − 9,000 |
| 09 | − 3,500 | | | | | | − 3,500 |
| 10 | | | | − 10,000 | | − 8,000 | − 2,000 |

අවශ්‍ය වන්නේ

i. 1 සිට 10 දක්වා එකිනෙක ගනුදෙනුව විස්තර කරන්න

## 06 පාඩම

## ගණුදෙනු වල ද්විත්ව බලපෑම

### <u>හැදින්වීම</u>

ගනුදෙනු වල ද්විත්ව සටහන් ක්‍රමය ගිණුම්කරණ අධ්‍යනය තුල ඇති මූලිකම සංකල්පයක් වේ. දෛනිකව ව්‍යාපාර ආයතනයක් තුල සිදුවන සියලු ගනුදෙනු මගින් ව්‍යාපාරයේ වත්කම්,වගකීම්, ආදායම්, වියදම් හා හිමිකම් ගිණුම් සඳහා බලපෑමක් සිදු කරයි. එම දෛනිකව සිදුවන සියලු ගනුදෙනු වල බලපෑම ගිණුම් වර්ග දෙකක් සඳහා සිදුවන අතර එය ගනුදෙනු වල ද්විත්ව බලපෑම ලෙස හදුන්වයි. මෙම පාඩම තුලින් අ.පො.ස (සා.පෙළ) විභාගය සඳහා බහුවරණ ප්‍රශ්න කිපයක් මෙන්ම රචනා ප්‍රශ්නයක් සකස් වන අතර මෙහි එන සියලු කරුණු හා සංකල්ප පිළිබද මනා අවබෝධයක් ලබා ගැනීම ඉතා වැදගත් වේ. මෙම පාඩම අධ්‍යනය තුලින් මූලික වශයෙන්ම ගනුදෙනුවල ද්විත්ව බලපෑම හදුනා ගැනිම, ද්විත්ව සටහන් ක්‍රමයට අනුව ගනුදෙනු ලෙජරයට පිටපත් කිරිම ,ලෙජරයේ ඇති ගිණුම් වර්ග හදුනා ගැනිම හා ගනුදෙනු එම ගිණුම් වල නිවැරදිව වාර්ථා කිරිම සඳහා මග පෙන්විමක් හා අවබෝධයක් ලබාදෙයි.

ගනුදෙනු වලට අදාල නිවැරදි ගිණුම් වර්ග හදුනා ගැනිමින් ද්විත්ව සටහන් න්‍යායට අනුව නිවැරදිව ගිණුම් වල ගනුදෙනු වාර්ථා කිරිම සඳහා පෙරහුරුවක් ලබා ගැනිම උදෙසා අ.පො.ස(සා.පෙළ) විභාගයට ඉලක්ක ගත ඉතා ආසන්න බහුවරණ හා රචනා ප්‍රශ්න රාශියක් මෙම පාඩමට ඇතුලත් කර ඇති අතර ඒවාට සාර්තකව පිළිතුරු සැපයිම මගින් ඔබට අ.පො.ස(සා.පෙළ) විභාගයේදි මෙම පාඩමට අදාලව ලැබෙන ප්‍රශ්න සඳහා සාර්තකව පිළිතුරු සැපයිම සඳහා නිපුණතාවයක් ලබාගත හැක.



**බහුවරණ ප්‍රශ්න**

**94)** **සමන් තම ව්‍යාපාරයේ ණය හිමියෙකු වන නිමල් වෙත ගෙවීමට තිබූ රු. 5000.00 ක ණය මුදල මුදලින් ගෙවීම නිවැරදිව සටහන් කිරිමට අදාල වන ගිණුම් වර්ගය වන්නේ**

1. වත්කම් ගිණුම - ආදායම් ගිණුම
2. වත්කම් ගිණුම - වගකීම් ගිණුම
3. ආදායම් ගිණුම - වියදම් ගිණුම
4. වගකීම් ගිණුම - ආදායම් ගිණුම

**95)** **Malidu Enterprises පරිගණක උපාංග අලෙවි කරන ව්‍යාපාරයක් වන අතර ව්‍යාපාරයට අවශ්‍ය දෘඩාංග තොගයක් Ajith electrical වෙතින් ණයට ගන්නා ලදි. මෙම ගණුදෙනුව ගිණුම් තැබිමට අදාළ හා නිවැරදි ද්විත්ව සටහන වන්නේ,**

1. ගැනුම් ගිණුම - හර
   මුදල් පොත - බැර
2. ගැනුම් ගිණුම - හර
   Ajith electrical ගිණුම - බැර
3. විකුණුම් ගිණුම - හර
   Ajith eleectrics ගිණුම - බැර
4. Ajith electrical ගිණුම - හර
   තොග ගිණුම - බැර

**96)** **ව්‍යාපාරයක ලද වට්ටම් එම ව්‍යාපාරයේ ,**

1. අදායමක් වන අතර එය ගිණුමේ බැර ලෙස සටහන් කරයි.
2. වත්කමක් වන අතර ණය ගිණුමේ හර ලෙස සටහන් කරයි.
3. වියදමක් වන අතර එය ගිණුමේ හර ලෙස සටහන් කරයි.
4. ආදායමක් වන අතර එය ගිණුමේ හර ලෙස සටහන් කරයි.

**97)නිහාදි "Juice bar" නමින් පළතුරු යුෂ අළෙවි කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඇය තම නිවසේ විදුලි බිල ගෙවීම සදහා ව්‍යාපාරයෙන් රු. 5000.00 ක මුදලක් රැගෙන ගියේය. මෙම සිදු වීම නිවැරදිව ගිණුම් තබන ද්විත්ව සටහන වන්නේ**

1. මුදල් පොත - හර 5000
   ණයහිමි ගිණුම - බැර 5000
2. විදුලි බිල් ගිණුම - හර 500
   මුදල් පොත - බැර 5000
3. ගැනිලි ගිණුම - හර 5000
   මුදල් පොත - බැර 5000
4. ගැනිලි ගිණුම - හර 5000
   විදුලි බිල් ගිණුම - බැර 5000

**98)** **2020.04.01 දිනට ABS ව්‍යාපාරයෙහි විකුණුම් පිලිබද විස්තර පහත දැක්වේ.**

- ඉදිරියට ගෙනා ශේෂය -රු. 20,000 ( විකුණුම් ගිණුම)
- ඉදිරියට ගෙනා ශේෂය -රු. 10,000 ( මුදල් පොත)
- 2020.04.10 දින රු.15,000 හා භාණ්ඩ අත්පිට මුදලට විකිණීම
- 2020.04.16 රු.5,000ක භාණ්ඩ ණයට විකිණීම.
- 2020.04.28 ණය ගැතියන් රු. 3,000 ආපසු ගෙවීම

**ඉහත ගණුදෙනු වලට අදාළව ගිණුම් තුලනය කිරිමෙන් පසු ගිණුම් වල දැක්වෙන නිවැරදි ශේෂය විය යුත්තේ,**

1. මුදල් පොත - හර රු.28 000
   විකුණුම් ගිණුම - බැර රු.37 000
2. විකුණුම් ගිණුම - හර රු.40 000
   මුදල් පොත - හර රු.28 000
3. මුදල් පොත - හර 25 000
   විකුණුම් ගිණුම - බැර 35 000
4. මුදල් පොත - හර 28 000
   විකුණුම් ගිණුම - බැර 40 000

**99)**වාහපාරයක් රජයේ බැංකුවකින් බැංකු ණයක් ලබා ගැනිම වාර්ථා කිරිමට අදාල වන නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

1. මුදල් පොත - හර
   බැංකු ණය ගිණුම -බැර
2. බැංකු ණය මුදල - හර
   මුදල් පොත - බැර
3. මුදල් පොත - හර
   ණය පොලී ගිණුම - හර
4. ණය පොලී ගිණුම - හර
   බැංකු ණය ගිණුම - බැ

**100) සුසන්ත මහතා 2020/04/01 දින විදුලි උපකරණ අළෙවි කරන වාහපාරයක් ආරම්භ කල අතර ඒ සදහා රු.500,000 ක ප්‍රාග්ධනයක් යොදවනු ලැබුවේ ය. එම සිදු වීම ගිණුම් වල දැක්වෙනුයේ,**

1. වත්කම් ගිණුමේ වැඩි වීමක් හා ආදායම් ගිණුමේ වැඩි වීමක් ලෙස
2. වත්කම් ගිණුමක හා හිමිකම් ගිණුමක වැඩි වීමක් ලෙස
3. වියදම් ගිණුමක වැඩිවීමක් හා ආදායම් ගිණුමක අඩුවීමක් ලෙසය.
4. වත්කම් ගිණුමක අඩු වීමක් හා හිමිකම් ගිණුමක වැඩි වීමක් ලෙසය.

**101)**

මුදල් පොත

| | |
|---|---|
| | ලී බඩු ගිණුම 50,000 |

ලී බඩු ගිණුම

| | |
|---|---|
| මුදල් 50,000 | |

**ඉහත ද්විත්ව සටහනට අනුව සිදු වී ඇති ගණුදෙනුව වන්නේ,**

1. වාහ පාරයේ ලී බඩු තොගයක් රු.50,000 ක අත්පිට මුදලට විකිණීම.
2. රු.50,000 ක් වටිනා ලී බඩු තොගයක් ණයට ලබා ගැනීම.
3. රු.50,000 ක ලී බඩු තොගයක් ණයට විකිණීම.
4. රු.50,000 ක ලී බඩු තොගයක් අත්පිට මුදලට ලබා ගැනිම.

**102)** **වාහපාරයක් ලබා ගත් බැංකු ණයක් වෙනුවෙන් ණය වාරික ගෙවීමට අදාල ද්විත්ව සටහන වන්නේ,**

1. මුදල් පොත - හර
   බැංකු ණය මුදල - හර
2. බැංකු ණය ගිණුම - හර
   මුදල් පොත - බැර
3. ණය පොලී ගිණුම - හර
   බැංකු ණය ගිණුම - බැර
4. ණය වාරික ගිණුම - හර
   මුදල් පොත - බැර

**103) කොමිස් ආදායම් ලැබීම නිවැරදි ලෙස ගිණුම් තබන ආකාරය වන්නේ,**

1. කොමිස් ආදායම් ගිණුම - හර
   මුදල් පොත - බැර
2. මුදල් පොත - හර
   කොමිස් ආදායම් ගිණුම- බැර
3. කොමිස් ආදායම් ගිණුම - හර
   මුදල් පොත - බැර
4. ණයගැති ගිණුම - හර
   කොමිස් ආදායම් ගිණුම - බැර

| රචනා ප්‍රශ්න |
| --- |

**01)** ලක්සිරි හාඩ්වෙයාර් ව්‍යාපාරයේ 2020 අප්‍රේල් මාසය තුල සිදු වූ ගණුදෙනු කිපයක් පහත දැක්වේ

i. 2020.04.01 අයිතිකරු රු. 200,000 ක ප්‍රාග්ධනයක් යෙදවීය.
ii. 2020.04.03 රු. 100,000 ක භාණ්ඩ තොගයක් ණයට ලබා ගැනීම.
iii. 2020.04.05 රු. 50,000 ක භාණ්ඩ තොගයක් ණයට විකිණීම.
iv. 2020.04.06 රු. 80,000 ක තොගයක් අත්පිට මුදලට විකිණීම.
v. 2020.04.07 රු. 100,000 ක බැංකු ණයක් ලබා ගැනීම.
vi. 2020.04.08 රු. 30,000 ක තොගයක් නිමල්ට විකිණීම.
vii. 2020.04.12 අයිතිකරුගේ නිවසේ ජල බිල්පත් ගෙවීම සඳහා රු. 5,000 ක මුදලක් ව්‍යාපාරයේ ලාච්චුවෙන් ලබා ගැනීම.
viii. 2020.04.16 ව්‍යාපාර ආයතනය සහිත ගොඩනැගිල්ලේ කුලිය ලෙස රු. 10,000 ක මුදලක් ගෙවීම.
ix. 2020.04.25 රක්ෂණ ගාස්තු රු. 8,000 ක් ගෙවීම.
x. 2020.04.30 ලබාගත් ණය මුදල වෙනුවෙන් රු. 5,000 ක පොලියක් ගෙවීම .

ඉහත දක්වා ඇති එක් එක් ගණුදෙනුව සඳහා ද්විත්ව සටහන් ලියා දක්වන්න.

**02)** ABC (PVT) ලිමිටඩ් හි 2019.03.31 න් අවසන් දිනට පහත ගිණුම් ශේෂයන් පැවතුනි

- 2020.04.01 හිමිකම් ගිණුමේ ශේෂය රු. 150,000 කි
- 220.04.01 මුදල් ශේෂය රු.100,000කි
- 2020.04.01 ණයගැති ශේෂය රු.80,000 කි
- 2020.04.01 ණයහිමි ශේෂය රු.50,000 කි

2020 අප්‍රේල් මාසය තුල ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදුවිය.

1. 2020.04.02 අමතර ප්‍රාග්ධනය යෙදවීම රු.50,000.
2. 2020.04.05 රු.30,000 ක තොගයක් අත්පිට මුදලට විකිණීම.
3. 2020.04.07 රු. 50,000 ක තොගයක් අත්පිට මුදලට ලබා ගැනීම.
4. 2020.04.10 රු. 20,000 ක තොගයක් ණයට විකිණීම.
5. 2020.04.15 සේවකයන්ට රු. 20,000 ක වැටුප් ගෙවීම.
6. 2020.04.16 රු. 15,000 ක තොගයක් ණයට ලබා ගැනිම.
7. 2020.04.17 ව්‍යාපාරයේ රක්ෂණය වාරිකය රු.8,000 මුදලින් ගෙවීම.
8. 2020.04.19 ව්‍යාපාරය අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් වඩු කාර්මිකයන්ට ගෙවීමට සිදු වූ මුදල රු.10,000කි.
9. 2020.04.22 ව්‍යාපාරයේ ඉදිරි කටයුතු වෙනුවෙන් ලබා ගැනීම සඳහා රු.50,000 ක මුදලක් යොදවා ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරිම.
10. 2020.04.28 රු.50,000 ක භාණ්ඩ තොගයක් අත්පිට මුදලට විකිණීම.
11. 2020.04.30 අයිතිකරුගේ දරුවෙකු වෙනුවෙන් ආරම්භ කර තිබූ රක්ෂණයක් සඳහා රු.3,000 ක වාරික මුදල ව්‍යාපාරය හරහා ගෙවීම.

ඉහත ගණුදෙනු ගිණුම්ගත කර එම ගිණුම් තුලනය කර දක්වන්න.

**03)** සුනිල් මහතා සුනිල් ස්ටෝර්ස් නමින් තම පුද්ගලික ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. ඔහුගේ ව්‍යාපාරයේ 2020 ජූනි මස තුල සිදු වූ ගනුදෙනු කිහිපයක් ව්‍යාපාරයේ ලෙජර් ගිණුම්වල සටන් කර තිබූ ආකාරය පිළිබඳ සාරාංශ සටහන් කිහිපයක් පහත දක්වා ඇති අතර එම සටහන් වලට අනුව ව්‍යාපාරය තුල සිදුවූ ගණුදෙනු විස්තරාමකව ලියා දක්වන්න.

### විකුණුම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | | ① මුදල් පොත<br>② ණයගැති කමල්<br>③ ණයගැති වීමල් | | 50,000<br>10,000<br>8,000 |

### ගැනුම්ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | ④ ණයහිමි<br>⑤ මුදල් | | 30,000<br>12,000 | | | | |

### ලී බඩු ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | ⑥ මුදල් ගිණුම | | 40,000 | | | | |

### බැංකු ණය ගිණුම

| | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | ⑦ මුදල් ගිණුම | | 10,000 | | ⑧ මුදල් ගිණුම | | 100,000 |

### ගැනිලි ගිණුම

| | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | ⑨ මුදල් ගිණුම | | 3,000 | | | | |

### කොමිස් ආදායම් ගිණුම

| | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | | ⑩ මුදල් ගිණුම | | 15,000 |

### ණයගැති කමල් ගිණුම

| | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | ⑪ විකුණුම් ගිණුම | | 10,000 | | ⑫ මුදල් ගිණුම | | 2 ,500 |

# 07 පාඩම

## මූලික සටහන් පොත්

### <u>හැදින්වීම</u>

ව්‍යාපාර ගනුදෙනු ලෙජරයේ ගිණුම් වල එකවරම සටහන් කිරීමේදී ගැටලු පැන නැඟිය හැකිය. එම නිසා ඒවා මූලික සටහන් පොත් නැමැති පොත් වල පළමුව සටහන් කරනු ලැබේ. මේ අනුව ව්‍යාපාරයක සිදුවන සෑම ගනුදෙනුවක්ම ලෙජර ගිණුම්වල සටහන් කිරීමට ප්‍රථම එම ගනුදෙනු සිදු වූ අනුපිළිවෙලින් පොදුවේ පිළිගත් ක්‍රමයකට අනුව පළමුවෙන් ම සටහන් කරන පොත් මූලික සටහන් පොත් යනුවෙන් හඳුන්වා දිය හැකිය. මෙම පරිච්ඡේදය මගින් මූලික සටහන් පොත් වර්ග සහ ඒවායේ අවශ්‍යතාවය පිළිබඳව පළමුව හඳුන්වා දෙනු ලැබේ. තවද මූලාශ්‍ර ලේඛන සහ එක් එක් මූලික පොතට අදාල මූලාශ්‍ර ලේඛන පැහැදිලිව දක්වා ඇත. මූලාශ්‍ර ලේඛන  වල වැදගත්කම සහ ප්‍රයෝජන පිළිබඳවද අවබෝධයක් ලබා ගැනීමට මෙම පරිච්ඡේදය උපකාරී වේ.මෙම පරිච්ඡේදයට අදාළ ව පහතින් සකස් කර ඇති බහුවරණ ප්‍රශ්න සහ රචනා ප්‍රශ්න වලට සාර්ථකව පිළිතුරු සැපයීම තුලින් ඔබට මූලික සටහන් පොත් පිළිබඳ දැනුම වැඩි දියුණු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.



**බහුවරණ ප්‍රශ්න**

**104) මූලික සටහන් පොත් යන්නෙහි අර්ථය වඩාත් හොඳින් පිළිබිඹු වන ප්‍රකාශය වන්නේ,**

1. ව්‍යාපාරයේ සිදුවන ගනුදෙනු සටහන් කරන ලෙජරය වේ
2. ගනුදෙනු නිසි අනුපිළිවෙලින් නොමැතිව සටහන් කරන පොතක් වේ
3. සිදුවන ගනුදෙනු ලෙජරයට පෙර අනුකූලව සටහන් කරන පොතකි
4. ව්‍යාපාර ගනුදෙනු ලෙජරයට පෙර පිළිගත් ක්‍රමවේදයකට ඒවායේ අනුපිළිවෙල අනුව සටහන් කරන පොතක් වේ.

**105) මුදල් ගෙවීම් හා මුදල් ලැබීම් සම්බන්ධ ගනුදෙනු සටහන් කරන මූලික පොත වන්නේ,**

1. බැංකු ගිණුම
2. මුදල් පොත
3. විකුණුම් ජ'නලය
4. පොදු ජ'නලය

**106) මූලික සටහන් පොත් වල අවශ්‍යතාවයක් නොවන්නේ,**

1. ලෙජර ගිණුම්වල සටහන් කිරීමේදී පහසුවීම
2. ගිණුම්කරණ දෝෂ අඩු වීම හා ඒවා හඳුනා ගැනීම පහසු වීම
3. කාල පරිච්ඡේදයට අයත් එකම ස්වරූපයේ ගනුදෙනු වර්ග කර සටහන් කිරීමට අවශ්‍ය වීම
4. මූල්‍යමය ගනුදෙනු පමණක් හඳුනා ගැනීම.

**107) ගණුදෙනුවක් සිදු වූ විට ඊට මුල් වී ක්‍රියාකරන අංශය මඟින් සියලු විස්තර ඇතුලත් කොට වගකිවයුතු නිලධාරියෙකුගේ අත්සන සහිතව සකස් කරන ලියවිල්ල වන්නේ,**

1. ලදුපත
2. ගැනුම් ඉන්වොයිසිය
3. මූලාශ්‍ර ලේඛන
4. ජ'නල් වවුචරය

**108) මූලාශ්‍ර ලේඛන වල අන්තර්ගත කරුණක් නොදැක්වෙන පිළිතුර වන්නේ,**

1. ව්‍යාපාරයේ නම, ලිපිනය ,අනුක්‍රමික අංකය
2. ව්‍යාපාරය නම , ලිපිනය, ගනුදෙනුව සිදු වූ දිනය
3. ගනුදෙනුවට සම්බන්ධ පාර්ශවය , ගනුදෙනුවේ මූල්‍යමය වටිනාකම
4. වගකිවයුතු නිලධාරියාගේ අත්සන , කල් ඉකුත්වීමේ දිනය

**109) බැංකු ගිණුමට අදාළ මූලාශ්‍ර ලේඛනයක් නොවන්නේ,**

1. ගෙවීම් වවුචරය
2. බැංකු ප්‍රකාශය
3. තැන්පත් කිරීමේ කුවිතාන්සි
4. ලදු පත

**110) පහත ප්‍රකාශන වල සත්‍ය හා අසත්‍ය බව දක්වන්න.**

1. මූලික සටහන් පොත් පමණක් ව්‍යාපාරයට පිළියෙල කරයි ……………..
2. ජ'නල් හෝ දෛනික පොත් යන නම්වලින් මූලික සටහන් පොත් හඳුන්වයි ……………..
3. ගනුදෙනු මූලික සටහන් පොතෙන් පසුව ලෙජරයෙහි සටහන් කරයි ……………..
4. මූලික සටහන් පොත් වල සටහන් කිරීමේදී මූලාශ්‍ර ලේඛන යොදා ගනී ……………..

**111) මූලාශ්‍ර ලේඛන වල ප්‍රයෝජනයක් නොවන්නේ කුමක්ද?**

1. කල් ඉකුත්වීමේ දිනය දැනගත හැකිවීම
2. ගනුදෙනුව පිළිබඳ අතිරේක විස්තර අඩංගු වීම
3. ගණුදෙනුව සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂියක් වීම
4. වගකිවයුතු නිලධාරියකු විසින් අත්සන් කර තිබීම

**112) මූලික සටහන් පොතක් නොවන්නේ,**

1. සුළු මුදල් පොත
2. ආදායම් ප්‍රකාශනය
3. ගැනුම් ජ'නලය
4. විකුනුම් ජ'නලය

**113) ආපසු එවුම් වාර්තා කිරීම සඳහා යොදා ගන්නා මූලාශ්‍ර ලේඛනය සහ මූලික සටහන් පොත වන්නේ,**

1. හරපත සහ විකුණුම් ජ'නලය
2. බැරපත සහ ආපසු එවුම් ජ'නලය
3. ජ'නල් වවුචරය සහ පොදු ජ'නලය
4. බැරපත සහ ආපසු යැවුම් ජ'නලය

**114) ගැනුම් ජ'නලයේ සටහන් කරනුයේ,**

1. ණයට ගැනුම් පමණි
2. අත්පිට මිලදී ගැනීම් පමණි
3. මුදලට සහ ණයට ගැනුම් යන දෙකමය
4. ජංගම නොවන වත්කම් මිලදී ගැනීම පමණි

**115) ආපසු යැවුම් වාර්තා කිරීම සඳහා යොදා ගන්නා මූලාශ්‍ර ලේඛනය වන්නේ,**

1. හරපත
2. බැරපත
3. විකුණුම් ඉන්වොයිසිය
4. ජ'නල් වවුචරය

**116) සිරිමල් විසින් රු.22,000 ක් වටිනා භාණ්ඩ ණයට විකුණා ඇත. ඉන් අනතුරුව ගනුදෙනුකරුවන්ගෙන් මේ සඳහා රු.18,000 ලැබුණු අතර ඉතිරිය ඔහුට අය කර ගත නොහැකි විය. ඉහත ගනුදෙනු වාර්තා කිරීම සඳහා අදාල ප්‍රභව ලියවිලි වන්නේ,**

1. ඉන්වොයිසිය, ලදු පත හා ජ'නල් වවුචරය
2. ඉන්වොයිසිය ලදු පත හා බැරපත
3. ඉන්වොයිසිය, ජ'නල් වවුචරය සහ හරපත
4. ජ'නල් වවුචරය, ලදුපත සහ ඉන්වොයිසිය

**117) අමල්ගේ ව්‍යාපාරයේ රු. 200,000 වටිනා භාණ්ඩ ණයට විකුණා ඇත. ගනුදෙනුකරුවෝ මේ අතරින් රු. 45,000 වටිනා භාණ්ඩ ආපසු හරවා එවූහ. පසුව ගනුදෙනුකරුවෝ මුදල් ගෙවා ඉතිරි ශේෂය පියවා ඇත. මෙම ගනුදෙනු සටහන් කිරීමට භාවිතා කරන මූලාශ්‍ර ලියවිලි වල අනුපිළිවෙල වන්නේ,**

1. ඉන්වොයිසිය, බැරපත සහ ගෙවීම් වවුචරය
2. ඉන්වොයිසිය, ජ'නල් වවුචරය සහ ලදු පත
3. ඉන්වොයිසිය, හරපත සහ ලදු පත
4. ඉන්වොයිසිය, බැරපත ලදු පත

## රචනා ප්‍රශ්න

**01)**මූලික සටහන් පොත් යන්න හඳුන්වන්න.

**02)** පහත සඳහන් ගණුදෙනු වර්ගය වෙනුවෙන් පිළියෙල කරන මූලික සටහන් පොත් සහ මූලාශ්‍ර ලේඛන සඳහන් කරන්න.

i. සුළු මුදල් ගනුදෙනු
ii. වෙළඳ භාණ්ඩ ණයට ගැනීම
iii. භාණ්ඩ ණයට විකිණීම
iv. බැංකුව ජංගම ගිණුම මගින් සිදුකරන ගනුදෙනු
v. මුදල් ලැබීම් සහ මුදල් ගෙවීම් සම්බන්ධ ගනුදෙනු
vi. වෙනත් ගනුදෙනු

**03)** ගිණුම්කරණ ක්‍රියාවලියේ දී ව්‍යාපාරික ගනුදෙනු මූලික සටහන් පොත් වල වාර්තා කිරීම අවශ්‍ය වන්නේ කුමන හේතුවක් නිසාද යන්න සඳහන් කරන්න.

**04)**මූලාශ්‍ර ලේඛන යන්න හඳුන්වන්න.

**05)**මූලාශ්‍ර ලේඛන වල ප්‍රයෝජන මොනවාද?

# 08 පාඩම

## මුදල් පොත හා සුළු මුදල් පොත

## හැදින්වීම

ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණය විෂය හදාරණ විට මූලික සටහන් පොත් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම වැදගත් වන අතර එහි එන ප්‍රධානතම මූලික සටහන් පොත් දෙකක් ලෙස මුදල් පොත හා සුළු මුදල් පොත හැදින්විය හැක. මෙම පාඩම තුලින් මූලික පොත් හා ඒවායේ අවශ්‍යතාවය, මූලාශ්‍ර ලේඛණ, මුදල් පොත හා එහි අවශ්‍යතාවය මුදල් ලැබීම් හා ගෙවීම් මුදල් පොතේ වාර්තා කිරිම, මුදල් පොතේ ද්විත්ව කාර්‍ය පිළිබද අන්තර්ගත වන අතර මෙම පාඩම අධ්‍යනය කිරිමේදි මූලික පොත් නම්කර පැහැදිලි කිරිම, මූලික පොත්වල අවශ්‍යතාවය හදුනා ගැනිම, මූලාශ්‍ර ලේඛන වල අවශ්‍යතාවය හදුනා ගැනිම, මුදල් පොතේ ගනුදෙනු සටහන් කිරිම, එක් එක් මූලික පොතට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කිරිමේ ඇති හැකියාව මුදල් පොතේ ද්විත්ව කාර්‍ය පැහැදිලි කිරිමේ හැකියාව හා මුදල් පොතේ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරිම පිළිබදව මනා හැකියාවක් ඔබ ලබාගත යුතුය. එසේම ව්‍යාපාර ආයතනයක සුළු මුදල් හා සම්බන්ධ ගනුදෙනු සටහන් කරන මූලික පොත සුළු මුදල් පොත වේ. සුළු මුදල් ගනුදෙනු වලට අදාලව ඒවායේ මූලාශ්‍ර ලේඛන හදුනා ගැනිම , විශ්ලේශණ තිරු සහිත සුළු මුදල් පොත සකස් කිරිම හා අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරිම මෙන්ම සුළු මුදල් පොතේ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරිමේ හැකියාව, මෙම පාඩම අවසානයේදි ලබා ගත යුතුව ඇති අතර ඒ සදහා ඇති අභ්‍යාස පහතින් දක්වා ඇත.

අධ්‍යන පොදු සහතික පත්‍ර අ.පො.ස (සා.පෙළ) විභාගයේදී මූලික පොත් පිළිබදව සිසුවා තුල ඇති අවබෝධය කොතරම්ද යන්න පිලිබඳව පරික්ෂා කිරිමට වැඩි අවධානයක් ලබාදෙන අතර ඒ සදහා සාර්ථකව පිළිතුරු සැපයිමටනම් සිසුන් මෙම පාඩම තුල ඇතුලත් සියළු කරුණු ඉතා හොදින් අධ්‍යනය කල යුතුය. ඒ සදහා පහත සදහන් ගැටළු වලට නිවැරදි පිළිතුරු සැපයිමට උත්සාහ කරන්න.



## බහුවරණ ප්‍රශ්න

**118) මූලික සටහන් පොතක කාර්ය හා ලෙජර් ගිණුමක කාර්ය ඉටු කරන මූලික පොත වන්නේ,**

1. ගැනුම් ජ'නලය
2. පොදු ජ' නලය
3. මුදල් පොත
4. බැංකු ගිණුම

**119) මුදල් පොත යන්න විස්තර කරන වඩාත් නිවැරදිම ආකාරය වන්නේ,**

1. ව්‍යාපාරයක සිදුවන මුදලින් කරන ගැනුම් හා විකුණුම් පමණක් වාර්ථා කරන මූලික සටහන් පොත මුදල් පොත වේ
2. ව්‍යාපාරය සිදුවන මුදලින් කරන ගෙවීම් හා ලැබීම් මෙන්ම ණයට ගැනීම් හා විකුණුම් වාර්ථා කරන මූලික සටහන් පොත මුදල් පොත වේ
3. ව්‍යාපාරයක සිදුවන සියළු මුදල් ලැබීම් හා සියළු මුදල් ගෙවීම් වාර්ථා කරන මූලික සටහන් පොත මුදල් පොත වේ
4. ව්‍යාපාරයේ ආදායම් හා වියදම් වෙක්පත් ආශ්‍රිත ගණුදෙනු සටහන් කරන මූලික සටහන් පොත මුදල් පොත වේ

**120) "රන්සිලු" ව්‍යාපාරයේ 2020 අප්‍රේල් මාසය තුල සිදු වූ ගණුදෙනු කිහිපයක් පහත දක්වා ඇත. ඒ අතරින් ව්‍යාපාරයේ මුදල් පොත තුල වාර්ථා කරන ගණුදෙනුව වන්නේ,**

1. 2020.04.02 ආපසු විකිණීමේ අරමුණින් රු.25000 ක් වටිනා තොගයක් ලක්සිරි ව්‍යාපාරය වෙතින් ණයට ලබා ගැනීම.
2. 2020.04.05 ව්‍යාපාරය සතු රු.100000 ක් වටිනා මෝටර් රථයක් ණයට විකිණීම
3. 2020.04.06 රු.50000 ක තොගයක් ණයට විකිණීම
4. 2020.04.10 අයිතිකරු අමතර ප්‍රාග්ධනය ලෙස රු.50000 ක් නැවත මුදල් යෙදවීම.

**121) මුදල් පොතේ මුදල් ලැබීම් හා ගෙවීම් වලට අදාල මූලාශ්‍ර ලියවිලි වන්නේ,**

1. ලදුපත, ගෙවීම් වවුචරය
2. ලදුපත, ජ'නල් වවුචරය
3. හරපත, විකුණුම් ඉන්වොයිසිය
4. ගැනුම් ඉන්වොයිසිය, බැරපත

**122) මුදල් ව්‍යාපාරයේ 01…………….කි. මුදල් ලැබීම නිසා 02…………………වන අතර මුදල් ගෙවීම නිසා 03………………………**

**ඉහත හිස්තැන් සඳහා ගැලපෙන නිවැරදි පිලිතුරු අනුපිලිවෙලින් දැක්වෙන්නේ.**

1. වත්කම, වත්කම් වැඩි, වත්කම් අඩුවේ.
2. ආදායම, ආදායම් වැඩි, ආදායම් අඩු වේ.
3. ආදායම, වත්කම් වැඩි, වගකීම් අඩු වේ.
4. හිමිකම්, වත්කම් වැඩි, ආදායම් අඩු වේ.

**123) ව්‍යාපාර ආයතනයක ලකුණු කල මිලෙන් කිසියම් ප්‍රතිශතයක් අඩුකර විකුණනු ලැබීම හඳුන්වන්නේ**

1. මුදල් වට්ටම්
2. ලද වට්ටම්
3. දුන් වට්ටම
4. වෙළඳ වට්ටම්

**124) ණයගැතියන්ගෙන් මුදල් ලැබීමේදී ලැබිය යුතු වටිනාකමින් අඩු කරන මුදල අයත් වන්නේ,**

1. වෙළඳ වට්ටම් වලට වන අතර එය දුන් වට්ටමකි
2. වෙළඳ වට්ටම් වලට වන අතර එය ලද වට්ටමකි
3. මුදල් වත්කම් වලට වන අතර එය ලද වට්ටමකි
4. මුදල් වත්කම් වලට වන අතර එය දුන් වට්ටමකි

**125) ලද වට්ටම් සටහන් කරන්නේ,**

1. මුදල් පොතේ හර පැත්තේ සිහිවටන තීරු වල ය.
2. මුදල් පොතේ බැර පැත්තේ සිහිවටන තීරු වල ය.
3. මුදල් පොතේ සටහන් නොකරයි.
4. වියදම් ගිණුමේ හර පැත්තේය.

**126) දුන් වට්ටම් සම්බන්දයෙන් වන නිවැරදි ප්‍රකාශය වන්නේ**

1. දුන් වට්ටම් ආදායමක් වන අතර එය දුන් වට්ටම් ගිණුම බැරකර ණයගැති ගිණුම හර කරයි.
2. දුන් වට්ටම් වියදමක් වන අතර එය දුන් වට්ටම් ගිණුම හරකර ණයගැති ගිණුම බැර කරයි.
3. දුන් වට්ටම් ආදායමක් හෝ වියදමක් නොවන අතර එය මුදල් පොතේ සිහිවටන තිරුවක පමණක් සටහන් කරයි.
4. දුන් වට්ටම් ආදායමක් වන අතර එය ණය හිමි ගිණුමට හර කර දුන් වට්ටම් ගිණුම බැර කරයි.

**127) සපුමලිගේ ව්‍යාපාරටය අදාලව පහත තොරතුරු සපයා ඇත.**

| | <u>**2019.04.01 (ආරම්භය)**</u> | <u>**2020.03.31 (අවසානය)**</u> |
|---|---|---|
| • **ණයගැති ශේෂය** | **= රු.20,000** | **50,000** |
| • **මුදල් ශේෂය** | **= රු.80,000** | **95,000** |

- ගිණුම්කරන කාලච්ඡේදය තුල රු.50,000 භාණ්ඩ ණයට විකුණන ලද අතර මුදල් සම්බන්දයෙන් කාලච්ඡේදය තුල සිදුවි ඇති ගණුදෙනු ණයගැතියන්ට අදාලව පමණක් සිදුවි ඇති බව උපකල්පනය කරමින් පහත දැ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. ණය ගැතියන්ගෙන් රු.20,000 ක මුදලක් ආපසු ලැබී ඇත.
2. ණයගැතියන්ගෙන් රු.15,000 ක මුදලක් ලැබි ඇති අතර රු.5,000 ක වට්ටමක් ලබාදි ඇත.
3. ණයගැතියන්ගෙන් රු.15,000 ක මුදලක් ලැබි ඇති අතර රු.15,000 ක ණයගැති ශේෂයක් ගිණුම් වලින් කපාහැර ඇත.
4. ඉහත කිසිවක් නිවැරදි නොවේ.

**128) සිමිත අනුර සමාගම ගණුදෙනු වාර්ථා කිරිම පහසු වීම සදහා සුලු මුදල් පොතක් පවත්වාගෙන යනු ලබන අතර ඒ සම්බන්දව ඔබට පහත තොරතුරු සපයා ඇත.**

- **මාසය අවසානයේ අත ඉතිරි මුදල රු.510**
- **ගමන් වියදම් රු.250**
- **සංග්‍රහ වියදම් රු. 575**
- **ලිපි ද්‍රව්‍ය වියදම් රු. 300**
- **පිරිසිදු කිරිමේ වියදම් රු. 365**

- ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයෙහි වටිනාකම රු.500 ක් වැඩි කිරීමට ප්‍රධාන ගිණුම් තබන්නා තීරණය කර ඇති අතර ඒ අනුව සුළු මුදල් භාරකරු වෙත අග්‍රිමය ප්‍රථිපූර්ණය කිරිමට ලබාදිය යුතු මුලු මුදල හා නව අග්‍රිමය වටිනාකම පිලිවෙලින් දැක්වෙන්නේ,

1. 1990හා 2500
2. 500 හා 2500
3. 2000 හා 2500
4. 1990 හා 2000

| රචනා ප්‍රශ්න |
| --- |

**01)** පහත දැක්වෙන ගනුදෙනු මුදල් පොතේ හර පැත්තේ සටහන් කරන ගනුදෙනු, බැර පැත්තේ සටහන් කරන ගනුදෙනු, හා මුදල් පොතේ සටහන් නොකරන ගනුදෙනු ලෙස වර්ගීකරණය කර දක්වන්න

i. අයිතිකරු ප්‍රාග්ධනය යෙදවීම
ii. අත්පිට විකුණුම් සිදුවීම
iii. ණයට විකුණුම් සිදුවීම
iv. අත්පිට ගැනුම් සිදුකිරීම
v. වෙළඳ වට්ටම් රුපියල් ගෙවීම
vi. ලද වට්ටම්
vii. ණයට ගැනුම්
viii. පොලී ආදායම් ලැබීම
ix. විදුලි බිල ගෙවීම
x. දුන් වට්ටම්
xi. ව්‍යාපාරයට අයත් ගොඩනැගිල්ලෙන් කොටසක් ණයට විකිණීම
xii. ණයගැතියන්ට මුදල් ගෙවීම
xiii. ණය හිමියන්ගෙන් මුදල් ලැබීම

**02)** පහත දැක්වෙන්නේ "සුමති (PVT) Ltd" හි මැයි මස තුල සිදු වු ගණුදෙනුය.

- මුදල් පොතේ ආරම්භක ශේෂය = රු. 80,000
- ණයහිමි ශේෂය - සුනිල් = රු. 10,000
- ණයගැති ශේෂය - සුජාතා = රු. 30,000
- ණයගැති ශේෂය - අජිත් = රු. 20,000
- ප්‍රාග්ධන ගිණුමේ ශේෂය = රු. 150,000

1. 2020.05.01 අමතර ප්‍රාග්ධනය යෙදවීම් රු. 100,000 (ල.අ.01)
2. 2020.05.02 බැංකු ණය ලබා ගැනීම් රු. 50,000 (ල.අ. 02)
3. 2020.05.03 අත්පිට ගැනුම් රු. 40,000 (ව.අ.01)
4. 2020.0.05 අත්පිට විකුණුම් රු. 50,000 (ල.අ. 03)
5. 2020.05.06 ණයට විකුණුම් - අජිත් රු. 30,000
6. 2020.05.07 ණයට ගැනුම් - අමල් රු.20,000
7. 2020.05.08 වාරිකය හා පොලිය ලෙස රු.10,000 ක් ගෙවු අතර ඉන් රු. 3,000 ක ණය පොළිය වන අතර ඉතිරිය ණය වාරිකය වේ (ව.අ.2)
8. 2020.05.09 ලද කොමිස් ආදායම රු. 5,000 කි.(ල.අ 4)
9. 2020.05.10 අමල්ගෙන් ණයට ගැනුම් රු. 15,000
10. 2020.05.12 අයිතිකරු ගැණිලි ලෙස ලබාගත් මුදල රු. 2,000(ව.අ. 03)

**අතිරේක තොරතුරු**

- ණයගැතියන් දින 20න් ණය පියවන්නේනම් ඒ මත 10% ක වට්ටමක් ලබාදිමට ආයතනය තිරණය කර ඇත.
- ණයගැති සුජාතාගේ ගිණුමේ ආරම්භක ශේෂය ලෙස දැක්වෙන්නේ ඇය 2020.04.30 දින ලබාගත් තොගයක වටිනාකමයි.
- ණයගැති අජිත්ගේ ගිණුමේ දැක්වෙන ආරම්භක ශේෂය ඔහු 2020.04.10 වන දින ලබාගත් භාණ්ඩ තොගයට අදාල වේ.

**ණයගැතියන්ගෙන් හා ණය හිමියන්ගෙන් මුදල් ලැබීම් හා ගෙවීම් වලට අදාල තොරතුරු පහත දැක්වේ.**

- 2020.0.15 දින සුජාතා රු. 30,000 ක මුදලක් ගෙවන ලදි.(ල.අ.05)
- 2020.05.16 සුනිල්ගේ ගිණුමේ ශේෂය පියවීමට රු.9,500 ක් ගෙවූ අතර ඉතිරිය ලද වට්ටම් වේ.(ව.අ.04)
- 2020.05.20 අජිත්ගෙන් ලද මුදල රු. 20,000 කි.(ල.අ.06)
- 2020.05.22 අමල්ගේ ණය මුදලින් රු. 5,000 ක මුදක් ගෙවූ අතර ලද වට්ටම රු. 3,000 කි.(ව.අ.05)

**අවශ්‍ය වන්නේ,**

01. ඉහත ගණුදෙණු වට්ටම් තීරුව සහිත මුදල් පොතේ වාර්තා කරන්න.
02. ඉහත ගනුදෙනු වලට අදාල ලෙජර් ගිණුම් පිලියෙලකර තුලනය කර පෙන්වන්න.
03. වට්ටම් ගනුදෙනු වලට අදාල ද්විත්ව සටහන් ලියා දක්වන්න.

**03)** I.

a. සුළු මුදල් පොත යනු කුමක්ද යන්න හදුන්වා සුළු මුදල් පොතේ වාර්ථා කරන ගනුදෙනු කිහිපයක් ලියා දක්වන්න

b. සුළු මුදල් අග්‍රිමය යනු කුමක්ද?

c. සුළු මුදල් වියදම් ප්‍රතිපුර්ණය කිරිම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

II.සීමිත අනුර සමාගමේ සිදු කරන සුළු වියදම් වාර්තා කිරීමට ආයතනය තුළ සුළු මුදල් පොතක් පවත්වාගෙන යයි. 2020 අප්‍රේල් මාසය තුළ ආයතනයේ සුළු මුදල් සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

2020.04.01 දින ප්‍රධාන මුදල් භාරකරු සුළු මුදල් භාරකරු වෙත රු. 2,000 මුදලක් ලබා දුන් අතර 2020. 05.01 දිනට සුළු මුදල් භාරකරු සතුව ඇති ඉතිරි මුදල රු.130 කි.

a. මාසය තුළ සිදුව ඇති සුළු වියදම් වල වටිනාකම කොපමනද?

b. 2020 .05 .01 දිනට ප්‍රතිපූර්ණය කළ යුතු සුළු මුදල් වල වටිනාකම කීයද?

c. ආයතනයේ අවශ්‍යතාවය මත සුළු මුදල් අග්‍රිමය රු. 1,500 කින් වැඩි කිරීමට තීරණය කර ඇත්නම්,

අ. නව සුළු මුදල් අග්‍රිමයහි වටිනාකම කොපමණ ද?

ආ.එම අග්‍රිමය සඳහා ප්‍රතිපූර්ණය කළ යුතු මුළු මුදල කොපමණද?

III. සුළු මුදල් පොතේ ද්විත්ව කාර්යය පැහැදිලි කරන්න

**04)** පහත දැක්වෙන්නේ සුළු මුදල් වලට සම්බන්ධ ගනුදෙනු කිහිපයෙකි ඒවාට අදාළ ද්විත්ව සටහන් ලියා දක්වන්න

i.සුළු මුදල් අග්‍රිමය ලැබීම රු.5,000
ii.ගමන් වියදම් සඳහා ගෙවීම රු.300
iii. ගෙන ඒමේ කුලී ගෙවීම රු.150
iv.තැපැල් වියදම් ගෙවීම රු.100
v.ණයහිමියෙකු හට කරන ගෙවීම රු.750

**05)** සීමිත ලංකාපුත්‍ර සමාගමේ 2020 මැයි මාසයට අදාලව සිදු වූ සුළු වියදම් කිහිපයක් පහත දැක්වේ

- 2020.05.02 පෑන් මිලට ගැනීම රු. 80
- 2020.05.03 සංග්‍රහ වියදම් රු. 150
- 2020.05.04 පිරිසිදු කිරීමේ වියදම් රු. 450
- 2020.05.05 හාෆ්ෂීට් ගැනීම රු. 250
- 2020.05.06 ගමන් වියදම් රු. 150
- 2020.05.07 ගෙන ඒමේ කුලී රු. 300
- 2020.05.08 බිස්කට් සඳහා රු. 120
- 2020.05.09 ත්‍රිරෝද රථ ගාස්තු රු. 240
- 2020.05.10 තැපැල් ගාස්තු රු.180
- 2020.05.12 ලියුම් කවර වියදම් රු. 180
- 2020.05. ආයතනය සඳහා තේ බොන කෝප්ප 5 මිලට ගැනීම රු. 500
- 2020.05.14 ලිපිද්‍රව්‍ය වියදම් රු. 375

**අතිරේක තොරතුරු**

- ආයතනයේ සුළු මුදල් අග්‍රිමයෙහි වටිනාකම රු.5,000 යි.
- 2020 අප්‍රේල් මාසයට අදාල සුළු වියදම් රු. 4,100යි .
- මැයි මාසයේ සිට සුළු මුදල් අග්‍රිමය රු. 5,500 ක් දක්වා වැඩි කිරීමට ආයතනය තීරණය කරයි.

**අවශ්‍ය වන්නේ**

i. ලිපිද්‍රව්‍ය වියදම්, සංග්‍රහ වියදම්, ගමන් වියදම්, තැපැල් වියදම් හා වෙනත් වියදම් යන වියදම් ශීර්ෂ යටතේ අග්‍රිමය ක්‍රමයට සුළු මුදල් පොත පිළියෙල කර තුලනය කිරීම.

ii. සුළු මුදල් වියදම් වලට අදාල ලෙජර් ගිනුම් පිළියෙල කිරීම.

## 09 පාඩම

## බැංකු ගිණුම හා බැංකු සැසඳුම් විස්තරය

### <u>හැඳින්වීම</u>

ගනුදෙනු පහසුවෙන් සහ ආරක්ෂිතව සිදු කර ගැනීම සඳහා බැංකු ජංගම ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාමට ව්‍යාපාරිකයන් පෙළඹී ඇත මෙම පරිච්ඡේදය මඟින් මූලිකවම බැංකු ගනුදෙනු වලට අදාළ මූලාශ්‍ර ලේඛන මුදල් තැන්පත් වූ චෙක් තැන්පතු සහ චෙක් නිකුත් කිරීම් බැංකු ගිණුමේ සටහන් කරන ආකාරය පිළිබඳව ශිෂ්‍යයාට අවබෝධයක් ලබාදෙයි. තවද චෙක් අගරු වීම යනු එසේ වීමට හේතු බැංකු අයිරාව යන්න පිළිබඳව සාකච්ඡා කරයි ඉන්පසුව බැංකු ප්‍රකාශනය පිළිබඳ අවධානය යොමු කර ඇත එහි දී බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ බැංකු ගිනුමේ ශේෂය වෙනස් වීමට බලපාන හේතු බැංකු ගිනුමේ ශේෂය සංශෝධනය කිරීම සහ වාසිදායක ශේෂය පදනම්ව බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමට දැනුම මෙම පරිච්ඡේදය මඟින් ලබා දී ඇත.

මෙම පරිච්ඡේදයට අදාළ ව පහතින් සකස් කර ඇති බහුවරණ සහ රචනා ප්‍රශ්න වලට සාර්ථකව පිළිතුරු සැපයීම තුලින් ඔබට ගිණුම්කරණය සම්බන්ධ දැනුම වැඩි දියුණු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.



**බහුවරණ ප්‍රශ්න**

**129)** **ව්‍යාපාරයේ බැංකු ජංගම ගිණුම කුමන ගිණුම් වර්ගයට අයත් වේ ද?**

1. වගකීම් ගිණුමකි
2. වත්කම් ගිණුමකි
3. ආදායම් ගිණුමකි
4. වියදම් ගිණුමකි

**130)** **චෙක්පත් වලින් සිදුකරන ගෙවීම් බැංකු ගිණුමේ සටහන් කිරීමේ දී යොදා ගන්නා මූලාශ්‍ර ලේඛනය වන්නේ,**

1. ලදු පත
2. ජ'නල් වවුචරය
3. විකුණුම් ඉන්වොයිසිය
4. ගෙවීම් වවුචරය

**131)** **චෙක්පත් අගරු වන අවස්ථාව හෝ අවස්ථා වන්නේ,**

i. චෙක්පත් අවිධිමත් ලෙස ලියා තිබීම
ii. ජංගම ගිණුමේ මුදල් නොමැතිවීම
iii. චෙක්පතට තබා ඇති අත්සන ආදර්ශ අත්සන ට වඩා වෙනස් වීම

1. I පමණි
2. II පමණි
3. I සහ III
4. ඉහත සියල්ලම

**132)** **පහත සඳහන් කුමන අයිතම බැංකු සැසඳුම් ප්‍රකාශනයක ඇතුළත් වේ ද?**

a) ස්ථාවර නියෝග මත ගෙවීම්
b) බැංකු ප්‍රකාශනයේ ශේෂය
c) සෘජු ප්‍රේෂණ
d) උපලබ්ධි නොවු චෙක්පත්
e) ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්

1. a සහ b
2. a , b , d සහ e
3. b , d හා e
4. b , c , d හා e

**133)** **ව්‍යාපාරයක මුදල් පොතට අනුව බැංකු ශේෂය රු. 14,500 ක් විය. බැංකු ප්‍රකාශනය සමඟ සැසඳීමේ දී පහත වෙනස්කම් දක්නට ලැබුණි.**

- නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවු චෙක්පත් රු. 3,500
- බැංකුවට සෘජුව ලැබී ඇති ණයගැති ප්‍රේෂණ රු. 4,000
- තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවු චෙක්පත් රු.6,000

**බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය වන්නේ,**

1. රු. 16,000
2. රු. 13,000
3. රු. 12,000
4. රු. 17,000

**134)** **බැංකු ගිණුමේ අවසාන ශේෂය හා බැංකු ප්‍රකාශයේ අවසාන ශේෂය එකිනෙකට වෙනස් වීම සඳහා බලපාන හේතූන් වන්නේ**

a) සෘජු ප්‍රේෂණ
b) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවු චෙක්පත්
c) ස්ථාවර නියෝග මත ගෙවීම්
d) නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවු චෙක්පත්
e) බැංකු හා චෙක්පොත් ගාස්තු
f) මුදල් පොතේ ශේෂය

1. a , b , සහ c
2. a , b , d , සහ e
3. b , d, c සහ f
4. a , b , c , d , සහ e

**135) සිරිමල්ගේ ව්‍යාපාරයේ 2019. 03.31 දිනට එහි මාසික බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. 720 ,000 ක් විය. මෙදිනට බැංකුවෙහි තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 55,000 ක් සහ නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 35,000 වේ. 2019.03.31 දිනට ආයතනයේ පොත්වල බැංකු ශේෂය වන්නේ**

1. රු. 670 000
2. රු. 740 000
3. රු. 775 000
4. රු. 630 000

**136) 2018 .03. 31 දිනට ආයතනයක බැංකු ගිණුමේ ශේෂය රු. 530,000 කි. නමුත් එම ශේෂය එදින බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකඟ නොවීය. පහත සඳහන් කරුණු වෙනසට හේතු විය.**

- තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 25,000
- ස්ථාවර නියෝග මත ගෙවීම් රු. 30,000 පොත්වල සටහන් වී නොමැත.

1. **2018.03:31 දිනට බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය කොපමණද? …………………**
2. **2018.03:31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයට දක්වන බැංකු ශේෂය කොපමණද? ……**

**137) ව්‍යාපාරයේ බැංකු ගිණුම තුලනය කිරීමේ දී බැර ශේෂයක් පවතී නම් එය ව්‍යාපාරයට,**

1. වත්කමකි
2. වියදමකි
3. වගකීමකි
4. ආදායමකි

**138) ණයගැතියෙකුගෙන් ලැබුනු තැන්පත් කළ චෙක්පත් අගරු වීම ගිණුම් වල සටහන් කරන්නේ**

1. බැංකු ගිණුම හර ණයහිමි ගිණුම බැර
2. ණයගැති ගිණුම හර බැංකු ගිණුම බැර
3. මුදල් ගිණුම හර විකුණුම් ගිණුම බැර
4. විකුණුම් ගිණුම හර මුදල් ගිණුම බැර

**139) බැංකු අයිරාව යන්න හඳුන්වන්න.**

**…………………………………………………………………………………………**

| රචනා ප්‍රශ්න |
|---|

**01)** ජයවීර ව්‍යාපාරයේ 2019 අගෝස්තු මාසයේ බැංකු ගිණුමේ ශේෂය රු.40,000 කි. බැංකු ප්‍රකාශයේ ශේෂය, බැංකු ගිණුමේ ශේෂය ට සම නොවීය. වෙනසට හේතු පහත දැක්වේ.

(i) 2019.8.31 වන විටත් තැන්පත් කළ නමුත් නිෂ්කාශනය වී නොමැති චෙක්පත්

- චෙක් අංක 001 රු. 5,000
- චෙක් අංක 005 රු.4,000

(ii) 2019.8.31 වන විටත් නිකුත් කරන ලද නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්

- චෙක් අංක 002 රු. 2,000
- චෙක් අංක 004 රු. 3,000

(iii) බැංකු ප්‍රකාශයේ ඇති පහත දෑ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සඳහන්ව නැත.

- ස්ථාවර නියෝග මත රක්ෂණ ගාස්තු ගෙවීම් රු. 2,000
- ඍජු ප්‍රේෂණ ලැබීම් රු. 4,000
- බැංකු ගාස්තු රු. 1,000

1. බැංකු ගිණුම සංශෝධනය කරන්න.
2. බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කරන්න.

**02)**

2015 මාර්තු මාසයට අදාල ශාන්ගේ ව්‍යාපාරයේ ජංගම ගිණුමෙහි රු.20,500 ක හර ශේෂයක් ඇත. එහෙත් බැංකු ගිණුම් විස්තරයෙහි දැක්වෙන ශේෂය ඊට වෙනස් විය. වෙනසට හේතු පහත දැක්වේ.

1. ශාන් විසින් නිකුත් කරන ලද අංක 00512 දරණ රු. 5,500 ක චෙක්පත් බැංකුවට ඉදිරිපත් කර නොමැත.
2. බැංකු ගාස්තු රු. 1,000 ක් සහ චෙක්පොත් ගාස්තු රු. 500 ක් මුදල් පොතේ සටහන් කර නැත.
3. සෘජුවම බැංකුවට ලද රු . 4,000 ලාභාංශ මුදල් පොතේ සටහන් වී නොමැත.
4. ස්ථාවර නියෝග ගෙවීම් රු.2,500 ද මුදල් පොතේ සටහන් කර නොමැත
5. තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් අංක 00150 රු.6,000 ක් සහ 00250 රු. 2,000 ක් වේ.

1. බැංකු ගිණුම සංශෝධනය කරන්න.
2. බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කරන්න.

**03)**

2018.03.31 දිනට චතුරගේ ව්‍යාපාරයේ මුදල් පොතේ රු.35,000 ක හර ශේෂයක් පෙන්නුම් කරන ලදී. මෙදිනට රු.10 000 බැංකු ප්‍රකාශනයේ ශේෂය අයිරාවක් ලෙස පෙන්වන ලදී. වෙනසට හේතු ලෙස පහත දෑ අනාවරණය වී තිබේ.

1. බැංකුවට සෘජුව ප්‍රේෂණය කරන ලද රු. 40,000 ක ලාභාංශ මුදල් පොතේ සටහන් වී නොමැත.
2. බැංකුව විසින් ස්ථාවර නියෝග මත ගෙවීම් රු. 10,000 රක්ෂණ වාරිකය මුදල් පොතේ සටහන් වී නැත.
3. තැන්පත් කළ රු.15,000 චෙක් පතක් බැංකුව විසින් අගරු කර ඇත. එහි කිසිදු සටහනක් මුදල් පොතේ නැත.
4. සැපයුම්කරුවෙක් වූ නිමල් ට නිකුත් කළ රු. 30,000 චෙක්පත් (චෙක් අංක 34007) ගෙවීමට ඉදිරිපත් වී නැත.
5. බැංකුවේ තැන්පත් කළ රු. 90,000 චෙක්පත් (චෙක් අංක 1002 ) නිශ්කාශනය ව නොමැත.

අවශ්‍ය වන්නේ ,

1. 2018.3.31 දිනට මුදල් පොතේ සංශෝධිත ශේෂය
2. 2018 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය

## 10 පාඩම

## ගැනුම් ජ 'නලය, විකුණුම් ජ'නලය, සහ පොදු ජ'නලය

### <u>හැදින්වීම</u>

ව්‍යාපාරයක් නැවත විකිණීමෙ පරමාර්ථයෙන් ණයට භාණ්ඩ ලබා ගැනීම හා ණයට භාණ්ඩ විකිණීම සටහන් කරන මූලික සටහන් පොත් වන්නේ ගැනුම් ජර්නලය හා විකුනුම් ජර්නලය යි. එසේම මුදල් පොත, සුළු මුදල් පොත, ගැනුම් ජ'නලය හා විකුනුම් ජ'නලය යන මූලික පොත්වල සටහන් කළ නොහැකි විශේෂිත ගනුදෙනු සටහන් කරන මූලික පොත වන්නේ පොදු ජ'නලය යි. මෙම පාඩමට අදාළව ගැනුම් ජ'නලය විකුණුම් ජ'නලය හා පොදු ජ'නලයේ අවශ්‍යතාවය ඔබ විසින් හඳුනා ගත යුතු අතර ඒවාට අදාළ මූලාශ්‍ර ලේඛන මොනවාද යන්නත් හඳුනා ගත යුතුය. තවද ගැනුම් ජ'නලයේ හා විකුණුම් ජ'නලයේ ගනුදෙනු සටහන් කිරීම හා එම ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම සඳහා වන අවබෝධය ද ලබාගත යුතුය. පොදු ජ'නලයේ සටහන් කරන ගනුදෙනු වර්ග හඳුනා ගනිමින් ඒවා නිවැරදිව සටහන් කළ යුතුය. මෙම ඉගෙනුම් ඵල සාර්ථකව ලබා ගැනීමට හැකි වන ආකාරයට පහත දැක්වෙන අභ්‍යාසයන් සකස් කර ඇති අතර ඒවා හොඳින් අධ්‍යයනය කරන්න.



**බහුවරණ ප්‍රශ්න**

**140)** **නිමල්ගේ ව්‍යාපාරය මෝටර් රථ අලෙවි කරන ව්‍යාපාරයක් වන අතර ඔහු 2020.12.10 වන දින ව්‍යාපාරයෙහි නැවත විකිණීමේ අරමුණින් රු.500,000 ක් වටිනා මෝටර් රථයක් ණයට ලබාගෙන රු.250,000 වටිනා මොටර් රථයක් ණය පදනම මත විකුණා ව්‍යාපාරයේ කටයුතු පුළුල් කිරිම සඳහා රු.600,000 වටිනා ඉඩමක් ණය පදනම මත ලබා ගන්නා ලදි.**

**ඉහත සිදුවීම ගිණුම් ගත කිරීමේදි සටහන් කරන මූලික පොත් වලට අදාල මූලාශ්‍ර ලේඛණ පිලිවෙලින් දැක්වෙන්නේ,**

1. ගැනුම් ඉන්වොයිසිය, ලදුපත, ජ’ නල් වවුචරය
2. වවුචරය, ලදුපත, ජ’ නල් වවුචරය
3. ගැනුම් ඉන්වොයිසිය, විකුණුම් ඉන්වොයිසිය,ජ’ නල් වවුචරය
4. ගැනුම් ඉන්වොයිසිය, විකුණුම් ඉන්වොයිසිය, ගැනුම් ඉන්වොයිසිය

**141)** **ගැනුම් ජ’නලය**

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | මුළු වටිනාකම රු. | ලෙජර් පිටුව |
|---|---|---|---|---|
| **2020.04.01** | **001** | අමල් | **50000** | |
| **2020.04.04** | **002** | මොහොමඩ් | **25000** | |
| **2020.04.20** | **003** | සුජාතා | **30000** | |
| **.......................................................** | | | **105000** | |

**ඉහත කඩ ඉරි සහිත ස්ථානයේ සටහන් කරනු ලබන්නේ,**

1. ගැනුම් ගිණුමට බැර කලා
2. අමල්, මොහොමඩ්, සුජාතා ගිණුමට බැරකලා
3. අමල්, මොහොමඩ්, සුජාතා ගිණුමට හර කලා
4. ගැනුම් ගිණුමට හර කලා

**142)** **පහත දක්වා ඇති ගණුදෙනු අතරින් ගැනුම් ජ’නලයේ සටහන් කරන ගනුදෙනුව කුමක්ද?**

1. ව්‍යාපාරයේ ප්‍රෙයා ්ජනය සඳහා මෝටර් රථයක් ණයට ගැනිම.
2. නැවත විකිණීමේ අරමුණින් මෝටර් රථයක් මිලට ගැනිම.
3. පාරිභෝගිකයෙකු හට මෝටර් රථයක් ණයට විකිණිම.
4. නැවත විකිණීමේ අරමුණින් මෝටර් රථයක් ණයට ගැනිම.

**143)** **ඉන්දිකගේ ව්‍යාපාරය ලී බඩු අළෙවි කරන ව්‍යාපාරයක් වන අතර 2020 මැයි මස සිදු වූ ගනුදෙනු කිපයක් පහත දැක්වේ.**

a. ආයතනයේ කාර් ්යාල ප්‍රයෝජනය සඳහා මේසයක් ණය පදන මත ලබා ගැනිම.
b. සමන්ට රු.5,000 වටිනා ලි බඩු තොගයක් ණයට විකිණිම.
c. ණය හිමියෙකුගෙන් රු.20,000 ක තොගයක් ලබා ගැනිම.
d. ණය ගැතියෙකු රු. 30,000 ක මුදලක් ආපසු ගෙවීම.

**ඉහත ගනුදෙනු සටහන් කිරිමට අදාල වන මූලික සටහන් පොත පිලිවෙලින් දැක්වෙන්නේ,**

1. පොදු ජ'නලය, ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, මුදල් පොත.
2. පොදු ජ'නලය, විකුණුම් ජ'නලය, ගැනුම් ජ'නලය, මුදල් පොත.
3. ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, ගැනුම් ජ'නලය, මුදල් පොත.
4. ගැනුම් ජ'නලය, මුදල් පොත, මුදල් පොත, පොදු ජ'නලය

**144) පහත දක්වා ඇති දැ අතරින් පොදු ජ 'නලයේ සටහන් නොකරන ගණුදෙනුව වන්නේ,**

1. ගැළපුම් සටහන්
2. වැරදි නිවැරදි කිරිමේ සටහන්
3. ස්ථාවර වත්කම් ණයට ගැනිම හා ණයට විකිණිමට අදාළ සටහන්
4. නැවත විකිණීමේ අරමුණින් ණයට ගැනිම්

**145) ටෙලි බැංකු සේවාව හරහා ව්‍යාපාරිකයෙකුට ඉටුකර ගත නොහැකි කාර්ය වන්නේ,**

1. බැංකු ගිණුමේ ශේෂය පිරික්ෂිම
2. අතැති මුදල් බැංකුවේ තැන්පත් කිරිම
3. බැංකු ගිණුම් ප්‍රකාශන ලබාගත හැකිවීම
4. චෙක්පොත් සඳහා අයදුම් කිරිම

**රචනා ප්‍රශ්න**

**01)** සහන් "සුව සහන නිශ්පාදන" නමින් නිවසට අවශ්‍ය වන විවිධ ද්‍රව්‍ය අලෙවි කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. එම ව්‍යාපාරයේ ණයට ගැනුම් හා විකුණුම් පිලිබඳ තොරතුරු පහත දක්වා ඇත.

ලක්ශ්මි ගෘහ උපකරණ

කොළඹ

ඉන්වොයිස් අංක : 080 Tel: 0112225656

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල( රු .) | වටිනාකම |
|---|---|---|---|---|
| 110 | යකඩ ඇඳන් | 10 | 6,000 | 60,000 |
| 112 | මෙස | 05 | 40,000 | 200,000 |
| | අඩුකල වට්ටම 10 % | | | 260,000<br>(26,000)<br>**234,000** |

අනුර ව්‍යාපාරිකයෝ

අනුරාධපුර

ටෙලි : 0254342889

ඉන්වොයිස් අංක : 080

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල(රු.) | වටිනාකම |
|---|---|---|---|---|
| 050 | මෙට්ට | 05 | 10,000 | 50,000 |
| 062 | ප්ලාස්ටික් පුටු | 20 | 600 | 12,000 |
| අඩුකලා 5 % වෙලඳ වට්ටමක් | | | | 62,000<br>(3,100)<br>**58,900** |

**ණය ගැතියන් සම්බන්ධ තොරතුරු**

- සමාධිට විකුණූ ගෘහ භාණ්ඩ වල ශුද්ධ වටිනාකම රුපියල් 50,000 (ඉන්වොයිස් අංක 764)
- විදුලි පංකා දෙකක් අනිල්ට ණයට විකිණීම. (ඒකකයක විකුණුම් මිල රුපියල් 10,000 කි.3% ක වෙළෙඳ වට්ටම ක ට යටත්ව, ඉන්වොයිස් අංක- 006)
- අල්මාරි තුනක් සපුමල් ව්‍යාපාරයට ණයට විකිණීම (ඒකකයක මිල රුපියල් 40,000 කි. අඩු කළ වෙළෙඳ වට්ටම 5% කි, ඉන්වොයිස් අංක - 210 ).

**අවශ්‍ය වන්නේ,**

01.ගැනුම් ජ'නලය හා ජ'නල් ගිණුම්
02.විකුනුම් ජ'නලය හා ජ'නල් ගිණුම්

# 11 පාඩම

## ශේෂ පිරික්සුම

**හැදින්වීම**

ලෙජර් ගිණුම් පිලියෙල කිරීමේදී ගනුදෙනුවේ ද්විත්ව බලපෑම සටහන් කරනු ලැබේ. ඉන්පසු ලෙජර ගිණුම් තුලනය කරන අතර හර සහ බැර වශයෙන් ශේෂ දක්නට ලැබේ. යම් කාලපරිච්ඡේදයක් අවසානයේ දී ලෙජර ගිණුම්වල හර ශේෂ සහ බැර ශේෂ වෙන වෙනම තීරු දෙකක ඇතුලත් කර පිළියෙල කරනු ලබන ලයිස්තුව ශේෂ පිරික්සුම ලෙස හඳුන්වයි. මෙම පරිච්ඡේදය තුළින්, ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු මූලික පොත් වල සටහන් කර ලෙජර ගිණුම් වලට පිටපත් කිරීම සිදුවන අතර ඒවා ලෙජරයට පිටපත් කරන ආකාරය සහ ලෙජර ගිණුම් තුලනය කර ශේෂ පිරික්සුම පිලියෙල කරන ආකාරය ඉතා පැහැදිලිව සාකච්ඡා කරයි.

මෙම පරිච්ඡේදයට අදාළ ව පහතින් සකස් කර ඇති බහුවරණ සහ රචනා ප්‍රශ්නවලට සාර්ථකව පිළිතුරු සැපයීම තුලින් ඔබට ශේෂ පිරික්සුම සම්බන්ධ දැනුම වැඩි දියුණු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.



## බහුවරණ ප්‍රශ්න

**146) ලෙජර ගිණුම් පිළියෙල කිරීමේදී ගනුදෙනු රීතිය කුමක් ද ?**

1. ලූකෝස් පැසියෝලි රීතිය
2. ඇඩම් ස්මිත් න්‍යාය
3. ද්විත්ව සටහන් න්‍යාය
4. හර බැර රීතිය

**147) ශේෂ පිරික්සුම හර ශේෂ එකතුවක් බැර ශේෂ එකතුවත් සමාන වීමෙන් තහවුරු වන කරුණු දෙකක් සඳහන් කරන්න.**

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

**148) යම් ව්‍යාපාරයක් රු 20,000 කින් බැංකු ගිණුමක් ආරම්භ කරන ලදී. මෙහි ද්විත්ව සටහන වනුයේ**

1. බැංකු ගිණුම හර මුදල් ගිණුම බැර
2. මුදල් ගිණුම හර බැංකු ජංගම ගිණුම බැර
3. බැංකු ණය ගිණුම හර බැංකු ජංගම ගිණුම බැර
4. බැංකු ජංගම ගිණුම හර බැංකු ණය ගිණුම බැර

**149) කමල්ගේ ව්‍යාපාරයෙහි අත්පිට විකුණුම් රු. 100,000 මෙම ගනුදෙනුවෙහි හර සටහන් අයත් වන ගිණුම වන්නේ,**

1. විකුණුම් ගිණුම
2. ණයගැති ගිණුම
3. මුදල් ගිණුම
4. ප්‍රාග්ධන ගිණුම

**150) ණයගැතියකුගෙන් මුදල් වශයෙන් රු. 275,000 මුදලක් ලැබෙන විට 5% ක වට්ටමකට යටත් වන්නේ නම් ව්‍යාපාරයට ලැබෙන මුදල කොපමණද ?**

1. රු.261,500
2. රු.261,200
3. රු.261,000
4. රු.261,250

**151) ණය හිමියෙකුට රු 340 000 ක මුදලක් ගෙවීමේදී 7.5% ක වට්ටමක් ලැබුනේ නම් ව්‍යාපාරය ගෙවිය යුතු මුදල කොපමණද ?**

1. රු. 314,000
2. රු. 330,000
3. රු. 314,500
4. රු. 340,000

**152) ව්‍යාපාරයක වෙළඳ භාණ්ඩ ණය පදනම මත රු. 45,000 ක මිලදී ගෙන තිබෙන විට එහි ද්විත්ව සටහන ලියා දක්වන්න.**

……………………………………………………………………………………..

……………………………………………………………………………………..

**153) ව්‍යාපාරයක් ජගත්ට රු. 45,000 භාණ්ඩ ණයට විකුණූ විට එය ගිණුම් ගත කරන ද්විත්ව සටහන ලියා දක්වන්න.**

……………………………………………………………………………………

……………………………………………………………………………………

**154) නිවැරදි ප්‍රකාශය තෝරන්න**

1. දුන් වට්ටම් ව්‍යාපාරයට ආදායමකි
2. දුන් වට්ටම් ව්‍යාපාරයට වියදමකි
3. දුන් වට්ටම් ව්‍යාපාරයට වත්කමකි
4. දුන් වට්ටම් ව්‍යාපාරයට වගකීමකි

**155) ශේෂ පිරික්සුමෙහි හර තීරුවෙහි පමණක් ඇති ගිණුම් ඇතුළත් කාණ්ඩය තෝරන්න**

1. මුදල්, ලද වට්ටම්, බැංකු ණය, දුන් වට්ටම් ගිණුම
2. මුදල්, ණයගැති, දුන් වට්ටම්, ප්‍රාග්ධන ගිණුම
3. ණයහිමි , මුදල් ,ණයගැති ,පොලී ආදායම ගිණුම
4. දුන් වට්ටම්, මුදල් , පොලී වියදම් , ණයගැති ගිණුම

## රචනා ප්‍රශ්න

**01)** ශේෂ පිරික්සුම යනු කුමක්ද?

**02)** දේශීය එලවලු අපනයනය කිරීමේ ව්‍යාපාරයක 2020. 03.01 දිනට පවතින ශේෂ මෙසේය.

| | | රු. |
|---|---|---|
| අතති මුදල් | | 100,000 |
| බැංකු ගිණුම | | 60,000 |
| ණයගැති | - නිමල් | 20,000 |
| | කමල් | 10,000 |
| ණයහිමි | - අමරා | 40,000 |
| | නයනා | 25,000 |
| ප්‍රාග්ධනය | | 150,000 |

මාර්තු මාසය තුළ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

ණයට ගැනුම්

- 2020.04.02 දින අමරා ගෙන් රු.10,000
- 2020.04.08 දින නයනාගෙන් රු. 25,000

ණයට විකුණුම්

- 2020.04.03 දින නිමල්ට රු. 15,000
- 2020.04.07දින කමල් ට රු.20,000

2020.04.10 දින අත්පිට විකුණුම් රු.30,000 කට සිදු කළ අතර ඉන් රු.10,000 ක් චෙක්පත් මගින් ලැබුණු අතර එය එදිනම බැංකුවේ තැන්පත් කරන ලදී.

අයිතිකරු විසින් රු.5,000 ඔහුගේ පෞද්ගලික දුරකතන බිල ව්‍යාපාරයේ මුදල් වලින් යොදවා ඇත.

ව්‍යාපාරය තුළ මෙම පහත ගෙවීම් සිදුවිය.

- ගැනුම් මුදලින් රු. 30,000
- වැටුප් මුදලින් රු. 25,000
- ප්‍රවාහන වියදම් චෙක්පත් මගින් රු. 10,000

පහත මුදල් ලැබීම් ද සිදුවිය.

- ණයගැති ප්‍රේෂණ (කමල්) රු. 10,000 යි. දුන් වට්ටම 10% කි.

අවශ්‍ය වන්නේ,

2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, ලෙජර් ගිණුම් සහ ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න.

# 12 පාඩම

## ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම

**<u>හැඳින්වීම</u>**

ගිණුම්කරණය තුළින් ව්‍යාපාරයේ ඇල්මක් ඇති පාර්ශවයන්ට තීරණ ගැනීමට නිවැරදි තොරතුරු සැපයීම අරමුණු කර ගනී. නමුත් ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ වැරදි සිදුවී ඇත්නම් තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීමේ දී එය ගැටලුවක් වනු ඇත. එම නිසා මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට පෙර සිදුවී ඇති වැරදි නිවැරදි කිරීම අත්‍යවශ්‍ය වේ. ගනුදෙනු මූලික පොත් වල සටහන් කිරීමේදී, ලෙජරයට පිටපත් කිරීමේදී, ලෙජර ගිණුම් තුලනය කිරීමේ දී, මෙන්ම ගිණුම් ශේෂ පිරික්සුමට උපුටා ගැනීමේ දී මෙම වැරදි සිදුවිය හැකිය. මෙම පරිච්ඡේදයෙහි අරමුණ වන්නේ ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීමේ අවශ්‍යතාවය, ශේෂ පිරික්සුමේ සමානත්වයට බලපාන සහ බලනොපාන වැරදි හඳුනා ගැනීම, අවිනිශ්චිත ගිණුම හඳුන්වාදීම සහ අවිනිශ්චිත ගිණුම ඇසුරෙන් වැරදි නිවැරදි කිරීම පිළිබඳ අවබෝධයක් ලබා දීමයි.

මෙම පරිච්ඡේදයට අදාළ ව පහතින් සකස් කර ඇති බහුවරණ හා රචනා ප්‍රශ්න වලට සාර්ථකව පිළිතුරු සැපයීම තුළින් ඔබට ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම සම්බන්ධ දැනුම වැඩි දියුණු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.



**බහුවරණ ප්‍රශ්න**

**156) ආයතනයක් රු.12,000 ක විකුණුම් සිදුකර ඇති අතර එය වැරදීමකින් රු.120,000 ක් ලෙස විකුණුම් ගිණුම සහ ණයගැති ගිණුම යන දෙකෙහිම සටහන් කර තිබුණි. මෙය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ජ'නල් සටහන් ලියා දක්වන්න.**

.................................................................................................

...........................................................................................

**157) දුන් වට්ටම් රු.1,200 ක් දුන් වට්ටම් ගිණුමේ දෙවරක් සටහන් වීමේ වරද නිවැරදි කිරීමේ ජ'නල් සටහන වන්නේ,**

1. දුන් වට්ටම් ගිණුම හර 2,400 අවිනිශ්චිත ගිණුම බැර 2,400
2. දුන් වට්ටම් ගිණුම හර 1,200 අවිනිශ්චිත ගිණුම බැර 1,200
3. අවිනිශ්චිත ගිණුම් හර 1,200 දුන් වට්ටම් ගිණුම බැර 1,200
4. ණයගැති ගිණුම් හර1,200 දුන් වට්ටම් ගිණුම බැර 1,200

**158) ගිණුම්කරණ වැරදි සිදුවිය හැකි අවස්ථා හතරක් දක්වන්න.**

.................................................................................................

.................................................................................................

.................................................................................................

.................................................................................................

**159) ශේෂ පිරික්සුමේ සමානත්වයට බලපාන වැරැද්දක් ලෙස හඳුනාගත හැක්කේ**

1. ගනුදෙනුවක් සම්පූර්ණයෙන් පොත් වලින් මගහැරීම
2. ගනුදෙනු වටිනාකම මූලික පොත් වල වැරදියට සටහන් වීම
3. ගනුදෙනුවක ද්විත්ව සටහනෙන් එක් සටහනක් පමණක් ඇතුළත් වීම
4. එකම ගනුදෙනුව ගිණුම් පොත්වල දෙවරක් සටහන් වීම

**160) සිසිරගේ ව්‍යාපාරයේ රු. 45,000 ණයට ගැනුම් ඉන්වොයිසිය ගැනුම් පොත් වලින් සම්පූර්ණයෙන්ම මගහැරීමේ දෝෂය නිවැරදි කිරීමට අදාළ වන සටහන වන්නේ,**

1. ගැනුම් ගිනුම හර රු.45,000 ණයගැති ගිණුම බැර රු. 45000
2. ණයහිමි ගිණුමක් හර රු.45,000 ගැනුම් ගිණුම බැර රු.45,000
3. ගැනුම් ගිණුම හර රු.45,000 ණයහිමි ගිණුම බැර රු.45,000
4. ණයගැති ගිණුම හර රු.45,000 ගනුම් ගිණුම බැර රු.45,000

**161) රු. 7000 වරිපනම් ගාස්තු ගෙවීම වැරදීමකින් විදුලි ගාස්තු ගිණුමට හර කර ඇත. මෙම ගනුදෙනුව නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන් ලියා දක්වන්න .**

.................................................................................................

.................................................................................................

**162) ශේෂ පිරික්ෂුම සමානත්වයට බලපෑමක් ඇති කරන ගිණුම්කරණ වැරදි අනාවරණය කරගෙන නිවැරැදි කරන තෙක් ශේෂ පිරික්සුමේ වෙනස පිටපත් කරන්නේ,**

1. ණයගැති ගිණුමටය
2. ණයහිමි ගිණුමටය
3. අවිනිශ්චිත ගිණුමටය
4. ලාභාලාභ ගිණුමටය

**163)** **සමරගේ ව්‍යාපාරයේ රු.48,000 අත්පිට විකුණුම් මුදල් පොතේ නිවැරැදිව සටහන් කර ඇති අතර විකුණුම් ගිණුමට රු.84,000 ක් ලෙස බැර කිරීමේ වරද නිවැරදි කිරීමට අදාළ වන සටහන් ලියා දක්වන්න.**

**…………………………………………………………………………………………**

**………………………………………………………………………………….**

**164)** **විකුණුම් ගිණුමේ නිවැරදි එකතුව වන රු. 35,000 වටිනාකම, රු.3000 ලෙස එම ගිණුමේ සටහන් කිරීමේ වරද නිවැරදි කිරීමට අදාළ වන ජ'නල් සටහන වන්නේ,**

1. විකුණුම් ගිණුම හර 32,000 ණයගැති ගිණුම බැර රු. 32,000
2. අවිනිශ්චිත ගිණුම හර රු. 32,000 විකුණුම් ගිණුම බැර රු.32,000
3. විකුණුම් ගිණුම හර රු. 35,000 ණයගැති ගිණුම බැර රු. 35,000
4. ණයගැති ගිණුම හර රු. 35,000 අවිනිශ්චිත ගිණුම බැර රු. 35,000

**165)** **අවිනිශ්චිත ගිණුම නිර්වචනය කරන්න.**

**…………………………………………………………………………………………**

## රචනා ප්‍රශ්න

**01)** 2018 දෙසැම්බර් 31 දින සීමිත සමාගමක ශේෂ පිරික්සුම සම නොවීය. වෙනස අවිනිශ්චිත ගිණුම ක සටහන් කරන ලදී. පසුව සොයා ගන්නා ලද වැරදි අතරින් කිහිපයක් පහත දැක්වේ.

i. යන්ත්‍රයක් අලුත්වැඩියා කිරීම සඳහා ගෙවන ලද රු. 1,800, කාර්යාල උපකරණ ගිණුමට හර කර තිබුණි.
ii. රු. 5,000 ක අත්පිට විකුණුම් මුදල් පොතේ සටහන් කර තිබුණි. එහෙත් එය විකුණුම් ගිණුමෙ සටහන් කර තිබුණේ නැත.
iii. ගෙවල් කුලී වටිනාකම රු. 3,000 ක් එම ගිණුමේ දෙවරක් සටහන් කර තිබුණි.
iv. විදුලි ගිණුමේ තිබුණු රු. 1,000 ක හර ශේෂය ශේෂ පිරික්සුමෙන් අතහැර ගොස් තිබුණේය.
v. රු. 2,000 ණයට විකුණුම් , විකුණුම් ගිණුමේ ද අදාළ ණයගැති ගිණුමේ ද බැරට සටහන්ව තිබුණි
vi. යන්ත්‍ර ක්ෂය වියදම් රු. 4,000 ක් යන්ත්‍ර ගිණුමට හර කර තිබේ.

ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන් ලියන්න.

**02)**

2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ coca cola ව්‍යාපාරයේ පහත සඳහන් වැරදි අවසාන ගිණුම් පිළියෙළ කිරීමේ දී සොයා ගන්නා ලදී.

1. රුපියල් 75,000 ක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම පොත් වලින් මගහැරී ඇත.
2. රු. 40,000 ක ගැනුම් ඉන්වොයිසිය රු. 4,000ක් ලෙස ගැනුම් ජ'නලයේ සටහන් කර තිබීම.
3. රු.5,000 ක විදුලි බිල් ගෙවීම දෙවරක් සටහන් කර තිබීම.
4. රු.15,000 ක ලාභාංශ ලැබීම මුදල් පොතේ පමණක් සටහන් කර තිබීම.
5. ආයතනය සතුව රු. 25,000 ක් වටිනා යතුරු පැදිය විකිණීමේ දී එහි වටිනාකම විකුණුම් ගිණුමට බැර කර තිබීම.

අවශ්‍ය වන්නේ,

ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන් ලියන්න.

**03)**

2020.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නීෂා ආයතනයේ හර, බැර ශේෂ වල එකතුව පහත දැක්වේ.

- හර තීරුවේ එකතුව රු. 412,000
- බැර තීරුවේ එකතුව රු. 450,000

ඉන්පසු පහත සඳහන් වැරදි සොයා ගෙන ඇත .

1. රු. 20,000 ක අත්පිට ගැනුම් මුදල් පොතේ නිවැරැදිව සටහන් කර ගැනුම් ගිණුමෙහි රු. 2,000 ක් ලෙස සටහන් කර තිබීම.
2. ණයගැතියකුගෙන් ලැබුණු රු. 10,000 මුදල් පොතට හර කර ණයගැතියාගේ ගිණුමට ද හර කර තිබීම.
3. මුදල් ගිණුමේ එකතුව රු. 25,000 කි. එය රු. 5,000 ක් ලෙස ශේෂ පිරික්සුමේ සටහන් කර ඇත.
4. දුරකථන ගාස්තු ගිණුමේ ශේෂය රු.10,000 ක් ශේෂ පිරික්සුමේ සටහන් වී නොමැත.
5. රු. 8,000 විකුණුම් ඉන්වොයිසිය රු. 800 ක් ලෙස විකුණුම් ජ'නලයට සටහන් කර තිබීම.

අවශ්‍ය වන්නේ ,

i. අවිනිශ්චිත ගිණුම් ශේෂය
ii. වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන්
iii. අවිනිශ්චිත ගිණුම

**11 වසර**

# 01 පාඩම

## වෙළෙඳාම සහ උපකාරක සේවා

**<u>හැඳින්වීම</u>**

ව්‍යාපාරයක් විසින් සිදුකරන කටයුතු අතර ඉතාමත් වැදගත් කොටස වන්නේ වෙළඳාමයි. වෙළඳාම කාර්යක්ෂමව සිදු කිරීම සඳහා උපකාරක සේවා වල සහය ඉතා වැදගත් වේ. වෙළෙඳාමේ වර්ධනය සඳහා උපකාරක සේවාත් උපකාරක සේවා වල වර්ධනය සඳහා වෙළඳාමත් ඉවහල් වේ. මෙම පරිච්ඡේදය මඟින් ප්‍රධාන වශයෙන් වෙළඳාම සහ උපකාරක සේවා වර්ග සාකච්ඡා කරනු ලබයි. වෙළඳාම, දේශීය වෙළඳාම සහ විදේශීය වෙළඳාම ලෙස කොටස් දෙකකට වෙන්කළ හැකිය. උපකාරක සේවා යටතේ බැංකු සේවා, රක්ෂණ සේවා, සන්නිවේදන සේවා, සහ ප්‍රවාහන සේවා පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලබා දෙයි.

පහත දැක්වෙන බහුවරණ සහ රචනා ප්‍රශ්නවලට නිවැරැදිව පිළිතුරු සැපයීම මඟින් ඔබට වෙළඳාම සහ උපකාරක සේවා පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.



## බහුවරණ ප්‍රශ්න

**1)** වැරදි ප්‍රකාශය තෝරන්න

1. මිනිස් අවශ්‍යතා සහ වුවමනා තෘප්තිමත් කරන ඕනෑම ආර්ථික කටයුත්තක් ව්‍යාපාරයක් වේ
2. උපකාරක සේවා මගින් වෙළඳාම කාර්යක්ෂමව සිදු කරයි
3. වෙළඳාම සහ උපකාරක සේවා අතර අන්‍යෝන්‍ය රැඳියාවක් පවතී
4. දේශීය නිෂ්පාදිත අප රටට ගෙන්වා විකිණීම යනු ආනයන වෙළඳාමයි

**2) i,ii,iii හිස්තැනට ගැලපෙන පිළිතුරු ලියා දක්වන්න.**




**3)** සිල්ලර වෙළඳාමේ ලක්ෂණයක් නොවන්නේ මින් කුමක්ද ?

1. අවසාන පාරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා විකිණීම
2. භාණ්ඩ වර්ග රාශියක් ඉදිරිපත් කිරීම
3. සාපේක්ෂව ඒකකයක විකුණුම් මිල අඩුවීම
4. පාරිභෝගිකයාට වඩාත් සමීප වීම.

**4)** සත්‍ය අසත්‍යතාවය දක්වන්න

1. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන නිමි ඇඳුම් විදේශ වෙළඳපලෙහි විකිණීම අපනයන වෙළඳාම වේ. ………………………..
2. රටක අවශ්‍යතාවය සැපිරීමට දේශීය භාණ්ඩ මෙන්ම විදේශීය භාණ්ඩ වැදගත් නොවේ…………………….
3. තොග වෙළෙන්දා සිල්ලර වෙළෙන්දා සමග සම්බන්ධ නොවෙයි. …………………………
4. විදේශීය නිෂ්පාදිත අප රටට ගෙන්වා විකිණීම යනු අපනයන වෙළඳාමයි ………………….

**5)** වාණිජ බැංකුවක් විසින් ගැනුම්කරුවන්ට සපයන සේවාවක් නො වන්නේ කුමක්ද ?

1. තැන්පතු ආශ්‍රිත සේවා
2. විදෙස් මුදල් ආශ්‍රිත සේවා
3. උකස් සේවා
4. විද්‍යුත් භාණ්ඩ විකුණුම් සේවා

**6)** ස්ථාවර තැන්පතුවක ලක්ෂණයක් නොවන්නේ මින් කුමක්ද ?

1. යම් නිශ්චිත කාල සීමාවක් සඳහා තැන්පතු පවත්වාගෙන යාම
2. තැන්පතු කාලය හා මුදල අනුව පොලිය වෙනස් වීම
3. සාමාන්‍ය ඉතුරු කිරීම් ගිණුම් වලට වඩා අඩු පොලියක් හිමි වීම
4. පොලිය මාසිකව හෝ කල් පිරුණු පසු ලබා ගත හැකි වීම

**7)** **ජංගම ගිණුමක් පවත්වා ගැනීමේ වාසි තුනක් දක්වන්න.**

…………………………………………………………………………………………
…………………………………………………………………………………………
…………………………………………………………………………………………

**8) විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවා යටතේ භාවිතා වන කාඩ්පතක් නොවන්නේ මින් කුමක්ද ?**

1. හරපත්
2. ණයපත්
3. ටෙලර් යන්ත්‍ර
4. ලීසිං පහසුකම්

**9) විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවේ ලක්ෂණයක් නො වන්නේ කුමක්ද ?**

1. ක්ෂණික බව
2. අවදානම අඩු වීම
3. සියලු තොරතුරු ස්වයංක්‍රියව වාර්තාවීම
4. වෙනත් බැංකුවකින් වුවත් පහසුකම් ලබා ගත නොහැකි වීම

**10) රක්ෂණ මූලධර්මයක් නොවන්නේ මින් කුමක්ද ?**

1. තෙවන පාර්ශවය
2. රක්ෂණ හිමිකම
3. උපරිම විශ්වාසය
4. හානි පූර්ණය

**11) සන්නිවේදන ක්‍රියාවලියෙහි I, ii ,iii හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුර ඇතුළත් කාණ්ඩය වන්නේ මින් කුමක්ද ?**




1. යවන්නා, ප්‍රතිපෝෂණය,පණිවිඩය
2. යවන්නා, ප්‍රතිචාරය ,ප්‍රතිපෝෂණය
3. ප්‍රතිපෝෂණය,මාධ්‍ය ,යවන්නා
4. යවන්නා ,මාධ්‍ය ,ප්‍රතිපෝෂණය

**12) ප්‍රවාහනයේ මූලිකාංග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න**

1. මාර්ගය, මාධ්‍ය ,බලය ,සන්නිවේදනය
2. මාධ්‍ය ,බලය ,පර්යන්තය, මුදල්
3. මාර්ගය ,මාධ්‍ය ,බලය ,පර්යන්තය
4. මාර්ගය, පර්යන්තය ,බලය ,ඛනිජ තෙල්

**13) ප්‍රවාහන මාධ්‍යයක් ඔබගේ ව්‍යාපාරයට ඔබ තෝරා ගන්නේ නම් සැලකිලිමත්වන කරුණු හතරක් දක්වන්න.**

…………………………………………………………………………………………
…………………………………………………………………………………………
…………………………………………………………………………………………
…………………………………………………………………………………………

**14) චෙක්පත් පිටසන් කිරීම යනු කුමක්ද ?**

…………………………………………………………………………………………

**15) වාචික සන්නිවේදනයට නිදසුනක් නොවන්නේ**

1. රැස්වීම්
2. දුරකථන සංවාද
3. ශබ්දවාහිනි යන්ත්‍ර
4. සම්මන්ත්‍රණ

## රචනා ප්‍රශ්න

**01)** වෙළඳාම යනු කුමක්ද විස්තර කර එය විහිදී ඇති ආකාරය සටහනක් උපයෝගී කරගනිමින් පහදන්න.

**02)** සිල්ලර වෙළෙඳ ව්‍යාපාර වර්ග දක්වා ඒවාට නිදසුන් දෙක බැගින් දක්වන්න.

**03)** සිල්ලර වෙළඳාමේ සහ තොග වෙළඳාම වෙනස්කම් දක්වන්න.

**04)** විදේශීය වෙළඳාම යනු කුමක්ද පැහැදිලි කර එහි ප්‍රභේද පිළිබඳ කෙටි සටහනක් දක්වන්න.

**05)** උපකාරක සේවා යනු කුමක්ද?

**06)** බලපත්‍රලාභී වාණිජ බැංකුවක් යනු කුමක්ද පැහැදිලි කර ඉන් ඉටු වන සේවාවන් දෙකක් නම් කරන්න.

**07)** ජංගම ගිණුමක් පවත්වා ගැනීමෙන් ඇතිවන වාසි නම් කරන්න.

**08)** සාමාන්‍යරේඛනය සහ විශේෂ රේඛනය සිදු කරන ආකාරය රූප සටහන් මගින් පෙන්වන්න.

**09)** විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවාවන් වල වැදගත්කම් සහ සීමාවන් දක්වන්න.

**10)** රක්ෂණ මූලධර්ම නම් කර ඉන් එකක් තෝරාගෙන ඒ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

**11)** ජීවිත රක්ෂණය යනු කුමක්ද හඳුන්වා ජීවිත රක්ෂණයේ වැදගත්කම සඳහන් කරන්න.

**12)** ජීවිත රක්ෂණය සහ දේපළ රක්ෂණය අතර ඇති වෙනස්කම් දක්වන්න.

**13)** ප්‍රවාහන මූලිකාංග නම් කර ඒවා සඳහා නිදසුන් දෙක බැගින් දක්වන්න.

**14)** සුදුසු සන්නිවේදන මාධ්‍යයක් තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු නම් කරන්න.

**15)** අභ්‍යන්තර සන්නිවේදනය සහ බාහිර සන්නිවේදනය අතර වෙනස් කම් දක්වන්න

# 02 පාඩම

## කළමනාකරණය

### <u>හැදින්වීම</u>

ව්‍යාපාරයක සාර්ථක හෝ අසාර්ථක බව තීරණය වන්නේ ව්‍යාපාරය තම අරමුණු කොතෙක් දුරට සාක්ෂාත් කරගනු ලබන්නේද යන්න මතයි එමනිසා ව්‍යාපාරයක් තම සීමිත සම්පත් වලින් උපරිම සාර්ථකත්වයක් ලඟා කරගත හැකි ආකාරයෙන් ඒවා භාවිතා කිරීම සැමවිටම සිදුකළ යුතුය. ව්‍යාපාරයකට ඔවුන්ගේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මනා කළමනාකාරිත්වයක් අවශ්‍ය වේ. මෙම පරිච්ඡේදය මගින් කළමනාකරණය යන්න පැහැදිලි කරන අතර කළමනාකරණ කාර්යයන් වන සැලසුම්කරණය, සංවිධානකරනය, මෙහෙයවීම සහ පාලනය පිළිබඳ මූලික අවබෝධයක් ලබාදෙයි. පහත දැක්වෙන බහුවරණ සහ රචනා ප්‍රශ්න වලට පැහැදිලිව නිවැරදි පිළිතුරු සැපයීම මගින් ඔබට කළමනාකරණය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට හැකියාවක් ලැබෙනු ඇත.



**බහුවරණ ප්‍රශ්න**

**16) කළමනාකරණය යනු නිර්වචනය කරන්න.**

………………………………………………………………………………………………
………………………………………………………………………………………………
………………………………………………………………………………………………

**17) කළමනාකරණ ක්‍රියාවලිය තුළ ප්‍රධාන කළමනාකරණ කාර්යයන් හතරකි. ඒවා මොනවාද?**

………………………………………………………………………………………………
………………………………………………………………………………………………

**18) සැලසුම්කරණය නිර්වචනය කරන්න.**

………………………………………………………………………………………………
………………………………………………………………………………………………

**19) සංවිධානකරණය නිර්වචනය කරන්න.**

………………………………………………………………………………………………
………………………………………………………………………………………………

**20) මෙහෙයවීම නිර්වචනය කරන්න.**

………………………………………………………………………………………………
………………………………………………………………………………………………

**21) පාලනය නිර්වචනය කරන්න.**

**………………………………………………………………………………………………**

**22) පහත ප්‍රකාශ වල සත්‍ය ,අසත්‍යතාවය දක්වන්න .**

1. කළමනාකරණය යනු කාර්යයන් කීපයකින් යුත් වෙන් වෙන් වශයෙන් සිදුවන ක්‍රියාවලියකි. ………………………………
2. ව්‍යාපාරය මානව සම්පත් නිසි ලෙස හැසිරවීම මෙහෙයවීමයි. ………………….
3. සැලසුම් කරණයේ දී අරමුණු ඉටුකර ගැනීමේ ක්‍රම තීරණය නොකරයි. …………………...
4. සීමිත සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කළමනාකරණය අවශ්‍ය වේ ……………..

**23) සැලසුම්කරණ කාර්යයට අදාළ නොවන ප්‍රකාශය තෝරන්න .**

1. අවශ්‍ය සම්පත් හා සේවකයන් තීරණය කිරීම
2. අවශ්‍ය සම්පත් ලබා ගන්නා ආකාරය තීරණය කිරීම
3. ව්‍යාපාරය අලෙවිකරණ කටයුතු තීරණය කිරීම
4. ව්‍යාපාරය නිෂ්පාදන කටයුතු සඳහා කළමනාකරුවන් පත් කිරීම

**රචනා ප්‍රශ්න**

**01)** කළමනාකරණය යන්න නිර්වචනය කර එහි කාර්යයන් පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

# 03 පාඩම

# අලෙවිකරණය

## හැදින්වීම

ව්‍යාපාරයක් විසින් විවිධ කාර්යාල සිදුකරනු ලබන අතර එම කාර්යයන් අතරින් එක් කාර්යයක් ලෙස අලෙවිකරණය හඳුන්වාදිය හැකිය. මිනිස් අවශ්‍යතා සහ වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වටිනාකමින් යුත් නිෂ්පාදිතයක් නිර්මාණය කිරීමේ සහ පිලිගැන්වීමේ ක්‍රියාවලිය අලෙවිකරණය ලෙස අර්ථ දක්වයි. මෙම පරිච්ඡේදය තුළින් අලෙවිකරණය පිළිබඳව හඳුන්වා දෙන අතර ඉලක්ක වෙළඳපල සහ අලෙවිකරණ මිශ්‍රය පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරනු ලබයි. මෙය ආශ්‍රයෙන් ශිෂ්‍යයාට අලෙවිකරණයේ වැදගත්කම පිළිබඳව ද අවබෝධයක් ලබා ගැනීමට හැකිවේ. මෙම පරිච්ඡේදයට අදාළ ව පහතින් සකස් කර ඇති බහුවරණ සහ රචනා ප්‍රශ්න වලට සාර්ථකව පිළිතුරු සැපයීම තුළින් ඔබට අලෙවිකරණය සම්බන්ධ දැනුම සහ අවබෝධය වැඩි දියුණු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.



**බහුවරණ ප්‍රශ්න**

**24) අලෙවිකරණයට අයත් නොවන කාර්යයක් තෝරන්න.**

1. මිනිස් අවශ්‍යතා සහ වුවමනා තෘප්තිමත් කළ හැකි භාණ්ඩ හා සේවා නිර්මාණය කිරීම
2. සාධාරණ මිලක් නියම කිරීම
3. මානව සම්පත කළමනාකරණය කිරීම
4. අලෙවියෙන් පසු සේවාව ලබාදීම

**25) ව්‍යාපාරයකට අලෙවිකරණය වැදගත් වන කාර්යයන් දෙකක් දක්වන්න.**

.....................................................................................................

.....................................................................................................

**26) ඉලක්ක වෙළඳපලට නිදසුනක් නොවන පිළිතුර මින් කුමක්ද ?**

1. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය හදාරන සිසුන්ට ආදර්ශ ප්‍රශ්න පත්‍ර පොතක් මුද්‍රණය කර අලෙවි කිරීම
2. කුඩා දරුවන්ගේ ආහාර නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම
3. මහළු ජනතාව උදෙසා වැඩිහිටි නිවාසයක් ආරම්භ කිරීම
4. සිල්ලර වෙළඳ සැලක් ආරම්භ කිරීම

**27) අලෙවිකරණ මිශ්‍රය නිවැරදිව දක්වා ඇති කාණ්ඩය තෝරන්න.**

1. නිෂ්පාදිතය ,ගුණත්වය, මිල ,ස්ථානය
2. නිෂ්පාදිතය ,මිල, ස්ථානය ,ප්‍රවර්ධනය
3. මිල, ස්ථානය, ප්‍රවර්ධනය,බෙදාහැරීම
4. ප්‍රචාරණය,ස්ථානය ,මිල, නිෂ්පාදිතය

**28) පහත ප්‍රකාශ හොඳින් කියවා සත්‍ය නම් ( √ ) ලකුණ ද අසත්‍ය නම් ( × ) ලකුණද යොදන්න.**

1. අලෙවිකරණ සංකල්පය තුළින් මිනිස් අවශ්‍යතා සහ වුවමනා තෘප්තිමත් කරයි ……………..
2. නිෂ්පාදකයා සෘජුවම පාරිභෝගිකයාට භාණ්ඩ බෙදා හරින අවස්ථා ඇත …………….
3. නිෂ්පාදිතයක් පාරිභෝගිකයාට බෙදා හැරීමත් සමඟ අලෙවිකරණ ක්‍රියාවලිය අවසන් වේ …………….
4. පෞද්ගලික අලෙවිය ප්‍රවර්ධනයහි එක් උපාංගයකි. …………….

**29) නිෂ්පාදිත බෙදාහරින ප්‍රධාන ආකාර දෙක දක්වන්න.**

.....................................................................................................

.....................................................................................................

**30) අලෙවිකරණ මිශ්‍රයෙහි ව්‍යාපාරයට ආදායම් ලැබෙන විචල්‍ය තෝරන්න.**

1. නිෂ්පාදිතය
2. මිල
3. ස්ථානය
4. ප්‍රවර්ධන

**රචනා ප්‍රශ්න**

**01)** අලෙවිකරණය යනු කුමක්ද පහදා ඊට අයත් කාර්යයන් නම් කරන්න.

**02)** වෙළෙඳපළ සහ ඉලක්ක වෙළඳපල යන සංකල්ප පැහැදිලි කරන්න.

**03)** අලෙවිකරණ මිශ්‍රය යන්න පහදා එහි විචල්‍යයන් නම් කර ඊට අදාළ අයිතම දක්වන්න.

# 04, 05 පාඩම්

## ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන / ගැලපුම් සටහන් ආශ්‍රිත මූල්‍ය ප්‍රකාශන

### හැඳින්වීම

සෑම ව්‍යාපාරයකම අපේක්ෂාව වන්නේ තම ව්‍යාපාරික කටයුතු සාර්ථක අන්දමින් පවත්වාගෙන යාමයි. උපයාගත් ලාභය හෙවත් මෙහෙයුම් ප්‍රතිඵලය යහපත් අන්දමින් පවත්වනවා ද යන්න සොයා බැලීම අත්‍යවශ්‍ය කරුණකි. මීට අමතරව ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වයේ එනම් වත්කම්, හිමිකම්, වගකීම් වල තත්වය දැන ගැනීමත් ඉතාමත් වැදගත් කරුණක්ය. ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන මගින් එම ව්‍යාපාරය මෙහෙයුම් ප්‍රතිඵලය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳව මනා අවබෝධයක් ලබාගත හැකිය. ඊට අමතරව තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන්නාවූ විකුණුම් පිරිවැය ගණනය කිරීම්, වෙළඳ ගිණුම පිලියෙල කිරීම්, අවසානයේ ලාභාලාභ ගිණුම් පිලියෙල කිරීම් ආදිය සම්බන්ධව වැදගත් කරුණු සංකල්ප ආදිය ගැන දැනුම ලබාදීම ව්‍යාපාරයක මූල ප්‍රකාශන යන පාඩමේ අරමුණයි.

එමෙන්ම ගැලපුම් සටහන් ආශ්‍රිත මූල්‍ය ප්‍රකාශන පාඩමට අදාළ ව ව්‍යාපාරික මූලික සංකල්ප වන උපචිත පදනම සම්බන්ධයෙන් මෙන්ම එයට අදාල ගැලපිලි සටහන් සම්බන්ධයෙන් දැනුම ලබාදීමටත්, ද්විත්ව සටහන් නිසියාකාරයෙන් ගිනුම් තබන ආකාරය සිසුවන් හට පෙන්වා දීමටත්, එමෙන්ම බොල් ණය ගැලපීම, ක්ෂය කිරීම්වලට අදාළ සටහන් මනා ලෙස තැබීමට අදාලව කටයුතු කිරිම සම්බන්ධවත් ශිෂ්‍යන් හට මනා දැනුමක් ලබාදීම මෙම පාඩම මගින් අරමුණු කර ඇත.

පහතින් සඳහන් වන බහුවරණ සහ රචනා ප්‍රශ්න වලට සාර්ථකව පිළිතුරු සැපයීම තුළින් හා ඔබගේ ව්‍යාපාර පසුබිම, ව්‍යාපාර පරිසරය සහ ව්‍යාපාර සංවිධාන සම්බන්ධ දැනුම මැන ගැනීමට ඔබට හැකිවනු ඇත.



## 04 පාඩම

## ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන

| බහුවරණ ප්‍රශ්න |
|---|

**31) ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන මගින්,**

1. මෙහෙයුම් ප්‍රතිඵලය දැනගත හැකිය
2. මූල්‍ය තත්වය දැන ගත හැකිය
3. මෙහෙයුම් ප්‍රතිඵලය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳව දැනගත හැකිය
4. මූල්‍ය තොරතුරු දැන ගැනීමට හැකිය

**32) ව්‍යාපාරයක පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන කට්ටලයක අඩංගු විය යුතු මූල්‍ය ප්‍රකාශන අයිතමයක් නොවන්නේ මින්කවරක්ද?**

1. ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2. මූල්‍ය තත්ව ප්‍රකාශනය
3. අනුපාත විශ්ලේෂණය
4. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**33) ව්‍යාපාරයක විකුණුම් ලෙස හඳුන්වනු ලබන්නේ,**

1. අත්පිට විකුණුම් සියල්ලක්ම ය
2. ණයට විකුණුම් සියල්ලක්ම ය
3. අත්පිට සහ ණයට විකුණුම් සියල්ලක්ම ය
4. කාලච්ඡේදයට අදාල අත්පිට හා ණයට විකුණුම් සියල්ලක් ම ය

**34) පහත සඳහන් අයිතමයන් ගෙන් ව්‍යාපාරයක ආදායම් ලෙස සෘජුවම හඳුනාගත නොහැකි වන්නේ,**

1. ලද වට්ටම්
2. කොමිස් ආදායම්
3. දුන් වට්ටම්
4. තැන්පතු පොලී

**35) නිසල්ගේ ව්‍යාපාරයේ විකුණුම් පිරිවැය 62,000 වන අතර එම ව්‍යාපාරයේ අවසන් තොගයේ වටිනාකම රු. 20,000 වේ නම් එම ව්‍යාපාරයේ විකිණීමට ඉදිරිපත් කල භාණ්ඩවල පිරිවැය වන්නේ,**

1. රු.60,000
2. රු.42,000
3. රු.58,000
4. රු.82,000

**36) වෙළඳ ව්‍යාපාරයක පහත සඳහන් තොරතුරු පවතී.**

| | |
|---|---|
| ආරම්භක තොගය | 15,000 |
| ගැනුම් | 82,000 |
| පැටවුම් කුලී | 6,000 |
| ගෙන ඒමේ කුලී | 9,000 |
| අවසාන තොගය | 22,000 |

**මෙම ව්‍යාපාරයේ විකුණුම් පිරිවැය වන්නේ,**

1. රු. 112,000
2. රු. 92,000
3. රු. 90,000
4. රු. 102,000

**නිසල්ගේ ව්‍යාපාරයේ ගිණුම් කාලච්ඡේදය 2020.12.31 න් අවසන් වූ අතර පහත තොරතුරු ඔබ වෙත ලබා දී ඇත.**

| | |
|---|---|
| ගැනුම් | 85,000 |
| විකුණුම් | 200,000 |
| පැටවුම් කුලී | 8,500 |
| ගෙන ඒමේ කුලී | 9,500 |
| ආරම්භක තොගය | 20,000 |

**37) 2020.12.31 දිනෙන් අවසන් වර්ශය සඳහා විකිණීම සඳහා ඉදිරිපත් කල භාණ්ඩවල පිරිවැය වන්නේ**

1. රු. 123,000
2. රු. 113,500
3. රු. 114,500
4. රු. 115,000

**38) එම ව්‍යාපාරයේ අවසාන තොගය රු. 22,000ක් වේ නම් දළ ලාභය සොයන්න**

1. රු. 101,000
2. රු. 100,000
3. රු. 99,000
4. රු. 115,000

**39) පහත සඳහන් වියදම් අතරින් බෙදා හැරීමේ වියදම් භාණ්ඩයට අදාල නො වන්නේ,**

1. ප්‍රචාරණ වියදම්
2. බොල් ණය වියදම්
3. බැංකු ගාස්තු
4. විකුණුම් කොමිස්

**ව්‍යාපාරයක ගිණුම් කාලච්ඡේදය තුළ ලැබූ ආදායම් සහ විකුණුම් පිරිවැය පහත දැක්වේ.**

| | |
|---|---|
| අත්පිට විකුණුම් | 80,000 |
| ණයට විකුණුම් | 48,000 |
| විකුණුම් පිරිවැය | 50,000 |
| ලාභාංශ ආදායම | 3,000 |
| කඩ කුලී ආදායම | 35,000 |
| ලද වට්ටම් | 6,000 |
| පොලී ආදායම | 7,000 |

**40) ව්‍යාපාරයේ දළ ලාභය හෝ අලාභය වන්නේ,**

1. රු. 78,000
2. රු. 129,000
3. රු. 82,000
4. රු. 122,000

**41) වෙනත් ආදායම් වල එකතුව වන්නේ,**

1. රු. 179,000
2. රු. 51,000
3. රු. 129,000
4. රු. 99,000

**42) පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් මූල තත්ව ප්‍රකාශනය හා එකඟ නො වන්නා වූ ප්‍රකාශනය වන්නේ,**

1. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය යම් කිසි දිනකට එම ව්‍යාපාරයේ පවත්නා වත්කම් හිමිකම් වගකීම් පෙන්නුම් කරයි.
2. ද්‍රවශීලතාවය අඩුම වත්කමේ සිට ද්‍රවශීලතාවය වැඩිකම දක්වා පිළියෙල කරනු ලබයි.
3. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය දිනෙන් අවසන් වන වර්ෂයට සකස් කරනු ලබයි.
4. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මගින් ගිණුම්කරණ සමීකරණය නිරූපණය වේ.

කෙටි පිළිතුරු ලියන්න

**43)** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අරමුණු මොනවාද?

.........................................................................................................

.........................................................................................................

.........................................................................................................

**44)** දළ ලාභය යනු කුමක්ද?

.........................................................................................................

.........................................................................................................

**45)** ලාභාලාභ ගිණුමක් යනු කුමක්ද?

.........................................................................................................

.........................................................................................................

## 05 පාඩම

## ගැලපුම් සටහන් ආශ්‍රිත මූල්‍ය ප්‍රකාශන

**බහුවරණ ප්‍රශ්න**

**46) ලී බඩු ක්ෂය අදාළ වන්නේ පහත පිරිවැය කාණ්ඩයන්ගෙන් කුමන කාණ්ඩයට ද?**

1. පරිපාලන වියදම්
2. බෙදාහැරීමේ පිරිවැය
3. වෙනත් වියදම්
4. මූල්‍ය පිරිවැය

**47) තොග කපා හැරීමේ වියදම් අදාළ වන්නේ පහත වියදම් කාණ්ඩයන් ගෙන් කුමන වියදම් කාණ්ඩයට ද?**

1. බෙදා හැරීමේ වියදම්
2. පරිපාලන වියදම්
3. වෙනත් වියදම්
4. මූල්‍ය වියදම්

**48) අත්පිට විකුණුම් වෙනුවෙන් රු.20,000 ක චෙක්පතක් ලැබීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.**

1. මුදල් පොත හර රු.20,000 විකුණුම් ගිණුම බැර රු.20,000
2. බැංකු ගිණුම හර රු.20,000 විකුණුම් ගිණුම බැර වි රු.20,000
3. විකුණුම් ගිණුම් හර රු.20,000 මුදල් පොත බැර රු.20,000
4. විකුණම් ගිණුම හර රු.20,000 බැංකු ගිණුම බැර රු.20,000

**49) නිමි ඇඳුම් ව්‍යාපාරයක් පවත්වාගෙන යන යුවති විසින් රු.25,000 වටිනා නිමි ඇඳුම් තොගයක් ණයට මිළ දී ගන්නා ලදී. එම ගනුදෙනුව ලෙජරයට පිටපත් කිරීමේදී නිවැරදි ද්විත්ව සටහන වන්නේ,**

1. ගැනුම් ගිනුම හර රු.25,000 විකුණුම් ගිනුම බැර රු.25,000
2. ණය හිමියෝ හර රු.25,000 ගැනුම් ගිනුම බැර රු.25,000
3. නිමි ඇඳුම් ගිණුම හර රු.25,000 ණය හිමියෝ බැර රු.25,000
4. ගැනුම් ගිණුම හර රු.25,000 මුදල් පොත බැර රු.25,000

**50) අවසන් තොගය ගැලපීමට අදාල ද්විත්ව සටහන වන්නේ,**

1. අවසන් තොගය ගිණුම හර වෙළඳ ගිණුම බැර
2. වෙළඳ ගිණුම හර අවසන් තොගය ගිණුම බැර
3. අවසන් තොගය ගිණුම හර මුදල් පොත බැර
4. වෙළඳ ගිණුම හර මුදල් පොත බැර

**කෙටි පිළිතුරු ලියන්න**

**51) ලැබිය යුතු ආදායම් ගැලපීමේ ද්විත්ව සටහන ලියන්න.**

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

**52) උපචිත වියදම් ගැලපීමේ ද්විත්ව සටහන දක්වන්න.**

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

**53) මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ දී ගැලපුම් සටහන් යොදා ගැනීමේ වැදගත්කම් මොනවාද?**

…………………………………………………………………………………………

…………………………………………………………………………………………

| රචනා ප්‍රශ්න |
|---|

**01)** නිසල්ගේ ව්‍යාපාර යේ ගිණුම් කාලච්ඡේදය 2020.01.01 සිට 2020.12.31 දක්වා වේ. එහි උපචිත වියදම් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ

- වාර්ෂික රක්ෂණ ගාස්තුව රු. 8,000 වුවද මුදලින් ගෙවා ඇති රක්ෂණ ගාස්තුව රු.5000 ක්ද වේ.
- වෙළඳ ආයතනය සඳහා මාසික කුලිය රු.8,000ක් වූ අතර මාස 10 ක කුලී පමණක් ගෙවා ඇත.
- 2020.01.01 දින ලබාගත් 12% බැංකු ණය රු.60,000 වූ අතර ඒ සඳහා මාස දෙකක බැංකු ණය පොලී ගෙවා නැත.

ඉහත ගණුදෙනු වලට අදාලව ජර්නල් සටහන්,ලෙජර් ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශ උද්ධෘතයන් පිළියෙළ කරන්න.

**02)** සසිඳුගේ ව්‍යාපාරය ගිණුම් කාලච්ඡේදය 2020.12.31න් අවසන් වේ.

- රු. 15,000 කුලී ආදායම් මුදලින් ලැබී ඇති අතර රු 3,000ක කුලී ආදායම් ලැබීමට ඇත.
- 10% බැගින් පොලී ලැබෙන රු. 120,000 ස්ථාවර තැන්පතුවක් 2020.04.01 දින ආරම්භ කර ඇති අතර දෙසැම්බර් මාසය දක්වා පොලී ආදායම් උපචිත වී ඇත.

ඉහත ගනුදෙනු වලට අදාලව ව්‍යාපාරය සඳහා ජ'නල් සටහන්, ලෙජර් ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශනවල උද්ධෘතයන් පිළියෙල කරන්න

**03)** සමන්ගේ ව්‍යාපාරය 2020.09.01 දින රු.10, 500 ක භාණ්ඩ නිසල් ට ණයට විකුනා තිබුනි. නිසල් හදිසියේ මියයාම නිසා ඔහුගෙන් ලැබීමට ඇති ණය මුදල් 2020.12.31 දින පොත් වලින් ලියා හැරීමට තීරණය කරන ලදී. ඊට අදාළ ජ'නල් සටහන් පොදු ලෙජරයේ දක්වා ලෙජර් ගිණුම් පිළියෙළ කරන්න.

**04)** ව්‍යාපාරයක පරිපාලන කටයුතු සඳහා මිලදී ගත් මෝටර් රථයකට අදාළ තොරතුරු පහත දැක්වේ. මෝටර් රථය ගැනුම් මිල 5,000,000 ප්‍රදර්ශනාගාරය සිට ගෙනීමේ කුලිය 20,000 සුන්බුන් අගය 500,000 ප්‍රයෝජනවත් ජීව කාලය වර්ෂ 10 යි. පහත දෑ ගණනය කරන්න.

(I) මෝටර් රථයේ පිරිවැය

(II) මෝටර් රථයේ ක්ෂය කළ හැකි අගය

(III) සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරන්නේ නම් වාර්ෂික ක්ෂය ප්‍රමාණය

**05)** සමන්ගේ ව්‍යාපාරය ගිණුම් කාලච්ඡේදය 2020.12.31න් අවසන් වේ. 2020.12.31 දිනට ව්‍යාපාරයේ තිබූ ජංගම නොවන වත්කම් වල විස්තර පහත දැක්වේ.

| ජංගම නොවන වත්කම් | පිරිවැය | 2020.01.01 දිනට සමුච්චිත ක්ෂය |
|---|---|---|
| ගොඩනැගිලි | 500,000 | 80,000 |
| මෝටර් රථ | 400,000 | 100,000 |
| යන්ත්‍ර | 80,000 | 8,000 |
| ලී බඩු | 50,000 | 10,000 |

ජංගම නොවන වත්කම් 5% බැගින් ක්ෂය කරනු ලබන අතර ඒ වාර්තා කිරීම සඳහා ක්ෂය වෙන් කිරීමේ ගිණුමක් පවත්වා ගනී. ගිණුම් කාලච්ඡේදයට අදාල ක්ෂය ගණනය කර 2020.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් පෙන්නුම් කරන්නේ කෙසේද යන්න දක්වන්න.

**06)** ගංගාගේ ව්‍යාපාර ඉගෙනුම් වර්ෂය 2020.12.31 න් අවසන් වන අතර එදිනෙදා ශේෂ පිරික්සුම පහත දැක්වේ.

ගංගාගේ ව්‍යාපාරය

2020.12.31 දිනට

ශේෂ පිරික්සුම

| විස්තරය | හර | බැර |
|---|---|---|
| 2020.01.01 ට තොගය | 10,000 | |
| ගැනුම් | 180,000 | |
| භාණ්ඩ ගෙන ඒමේ කුලී | 5,000 | |
| විකුණුම් | | 485,000 |
| කඩකුලී | 20,000 | |
| රක්ෂණ ගාස්තු | 10,000 | |
| ප්‍රචාරණ ගාස්තු | 13,000 | |
| සේවක වේතන | 40,000 | |
| දුන් වට්ටම් | 2,000 | |
| ලද වට්ටම් | | 15,000 |
| බැංකු ණය පොලී | 6,000 | |
| බැංකු ගාස්තු | 3,000 | |
| බෙදාහැරීමේ මෝටර් රථ (පිරිවැයට) | 500,000 | |
| කාර්යාල උපකරණ (පිරිවැයට) | 80,000 | |
| ණයගැතියෝ | 12,000 | |
| ණය හිමියෝ | | 80,000 |
| වසර 5න් ගෙවිය යුතු බැංකු ණය | | 120,000 |
| මුදල් | 12,000 | |
| ස්ථාවර තැන්පතු | 65,000 | |
| ප්‍රාග්ධනය | | 258,000 |
| | 958,000 | 958,000 |

අමතර තොරතුරු පහත දැක්වේ.

- 2020.12.31 දිනට උපචිත වියදම් (රක්ෂණ ගාස්තු රු.5,000, කඩකුලී වියදම් රු.4,000)
- 2020.12.31 දිනට ලැබිය යුතු පොලී ආදායම් රු.2,000 වේ.
- ණයගැතියන්ගෙන් රු.3,000 බොල් ණය ලෙස කපා හැරිය යුතුය.
- මෝටර් රථ පිරිවැය මත 10% ක්ද කාර්යාල උපකරණ පිරිවැය මත 12% ක්ද වාර්ෂිකව ක්ෂය කළ යුතුවේ.
- 2020.12.31 දිනට සියලු භාණ්ඩ තොග විකිණී ඇත.

ඉහත තොරතුරුවලින් ගැලපුම් වලට අදාල,

(I) පොදු ජ`නල් සටහන්

(II) 2020.12.31 දිනට අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය

(III) 2020.12.31 දිනට වත්කම් පිළියෙල කරන්න

**07)** සරණගේ ව්‍යාපාරයේ ගිණුම් වර්ෂය 2020.12.31න් අවසන් වන අතර ශේෂ පිරික්සුම පහත දැක්වේ.

සරණගේ ව්‍යාපාරය

2020.12.31 දිනට

ශේෂ පිරික්සුම

| විස්තරය | හර | බැර |
|---|---|---|
| විකුණුම් | | 625,000 |
| ආරම්භක තොගය | 15,000 | |
| ගෙන ඒමේ කුලී | 5,000 | |
| ගැනුම් | 280,000 | |
| යන්ත්‍ර උපකරණ (පිරිවැයට) | 100,000 | |
| මෝටර් රථ (පිරිවැයට) | 650,000 | |
| ණයගැතියෝ / ණය හිමියෝ | 40,000 | 33,000 |
| 10% වසර 4 කින් ගෙවිය යුතු බැංකු ණය | | 100,000 |
| බොල් ණය | 1,000 | |
| 2020.01.01 දිනට ක්ෂය වෙන් කිරීම්<br>-මෝටර් රථ<br>-යන්ත්‍රෝපකරණ | | <br>130,000<br>12,000 |
| ගැනිලි | 12,000 | |
| ස්ථාවර තැන්පතු (අවුරුදු 4) | 100,000 | |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 5,000 | |
| විදුලි ගාස්තු | 10,000 | |
| විකුණුම් වියදම් | 22,000 | |
| මුදල් | 20,000 | |
| 2020.01.01 දිනට ප්‍රාග්ධනය | | 360,000 |
| | 1,260,000 | 1,260,000 |

අමතර තොරතුරු පහත දැක්වේ.

- 2020.12.31 ට ඉතිරි බඩු තොගය 25,000 කි.
- ස්ථාවර තැන්පතු ශේෂය වර්ෂය ආරම්භයේ සිට ම පවතී. එය 15% ක පොලියක් ලැබීමට ඇත.
- 2020.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා බැංකු ණය පොලිය උපචිතව ඇත.
- ණයගැතියන් ගෙන් තවත් රු.5,000 බොල් ණය ලෙස කපා හැරිය යුතුය.
- මෝටර් රථ හා යන්ත්‍රෝපකරණ පිරිවැය මත වාර්ෂිකව 12% බැගින් ක්ෂය කළ යුතුය.

2020.12.31 අවසන් වර්ෂය සඳහා ලාභ ලාභ ප්‍රකාශනයත් මූල්‍ය තත්ව ප්‍රකාශනයත් පිළියෙල කරන්න

**08)** මනහාරීගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ

මනහාරීගේ ව්‍යාපාරය

2020.12.31 දිනට

ශේෂ පිරික්සුම

| විස්තරය | හර | බැර |
|---|---|---|
| 2020.01.01 දිනට ප්‍රාග්ධනය | | 232,000 |
| ගැනුම් හා විකුණුම් | 390,000 | 750,000 |
| ණයගැතියෝ හා ණය හිමියෝ | 75,000 | 85,000 |
| පරිපාලන වේතන | 35,000 | |
| වෙළෙඳ සේවක වේතන | 58,000 | |
| ගෙන ඒමේ කුලී | 10,000 | |
| 2020.01.01 ට ඉතිරි බඩු තොගය | 32,000 | |
| දුන් වට්ටම් / ලද වට්ටම් | 3,000 | 5,000 |
| 10% ස්ථාවර තැන්පතු | 120,000 | |
| ප්‍රවාහන වියදම් | 3,000 | |
| ප්‍රචාරණ වියදම් | 8,000 | |
| මෝටර් රථ | 500,000 | |
| ලී බඩු උපකරණ | 80,000 | |
| 12% බැංකු ණය | | 250,000 |
| ගෙවූ ණය පොලී | 12,000 | |
| <u>2020.01.01 දිනට ක්ෂය වෙන් කිරීම්</u><br>-බෙදාහැරීම් වාහන<br>-ලී බඩු උපකරණ | | <br>50,000<br>18,000 |
| විදුලිය | 10,000 | |
| මුදල් හා බැංකු ශේෂය | 54,000 | |
| | <u>1,390,000</u> | <u>1,390,000</u> |

අමතර තොරතුරු.

- 2020.12.31 දිනට ඉතිරි බඩු තොගයේ වටිනාකම රු.30, 000 කි.
- 2020.12.31 දිනට උපචිත වියදම් මෙසේ ය.(පරිපාලන වියදම් රු.4,000 / විදුලිය රු. 6,000)
- බොල් ණය ලෙස රු.1,000 කපා හැරිය යුතුය.
- මෝටර් රථ හා ලී බඩු උපකරණ පිරිවැය මත වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතුය.

ඉහත සඳහන් තොරතුරු උපයෝගී කරගනිමින් එම ව්‍යාපාරයට අදාළව ලාභාලාභ ප්‍රකාශනය සහ මූල්‍ය තත්ව ප්‍රකාශනය පිළියෙල කරන්න.

## 06 පාඩම

## ලාභ අරමුණු කර නොගත් සංවිධාන

**හැඳින්වීම**

ව්‍යාපාර සංවිධාන ලාභ අරමුණු කරගත් හා ලාභ අරමුණු කර නොගත් සංවිධාන ලෙස වර්ග කර දැක්විය හැකිය. සාමාජික සුභසාධනය, අභිවෘද්ධිය හා සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීම සඳහා ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධාන පවත්වාගෙන යයි තරුණ සංවිධාන කාන්තා සංගම් අවමංගල්‍යාධාර සමිති ආදිය ලාභ අරමුණු කර නොගත් සංවිධාන වලට නිදසුන් වේ.
ලාභ අරමුණු කර නොගත් සංවිධාන හා ඒවායේ අරමුණු මෙන්ම ලාභ අරමුණු කර නොගත් සංවිධානයක මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මෙම පාඩම තුල අන්තර්ගත වන අතර ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් යන්න හැඳින්වීම, එහි අරමුණු මොනවාද යන්න හඳුනා ගැනීම, ලැබීම් ගෙවීම් ගිණුම පිළියෙල කිරීම හා එහි අරමුණු පැහැදිලි කිරීම මෙම පාඩමේ අරමුණු වේ. අ.පො.ස (සා.පෙළ)විභාගයේ දී මෙම පාඩම තුළින් බහුවර්ණ ප්‍රශ්න හා රචනා ප්‍රශ්න සකස් වන අතර ඒවාට සාර්ථකව මුහුණ දීමට මඟ පෙන්වීමක් හා පෙරහුරුවක් වශයෙන් පහත ගැටළු සකස් කර ඇත.



**බහුවරණ ප්‍රශ්න**

**54)** **සවිය කාන්තා සමිතිය වසර ගණනාවක සිට පැවත එන සාර්ථක සමිති සංවිධානයක් වන අතර 2020 වසරට අදාලව තොරතුරු කිපයක් පහත දක්වා ඇත.**

- ඉ/ගෙ ශේෂය රු.21,000 (මුදල්)
- ලද සාමාජික මුදල් ශේෂය රු.50,000
- පැළ විකිණීමෙන් ලද මුදල රු.10,000
- රෝගාතුර වූ සාමාජිකාවක් සඳහා දුන් මුදල රු.5,000
- අවුරුදු උත්සවයක් පවත්වා රැස්කර ගත් මුදල රු. 60,000
- අවුරුදු උත්සවය සඳහා දැරූ වියදම රු.45,000
- පරිත්‍යාග ලැබීම් රු. 30,000

**ලැබීම් හා ගෙවීම් ගිණුමේ නිවැරදි මුදල් ශේෂය දැක්වෙන්නේ,**

1. හර ශේෂය රු.97,000
2. බැර ශේෂය රු.121,000
3. හර ශේෂය රු.117,000
4. හර ශේෂය රු.121,000

**55)** **ශක්ති තරුණ සමිතියේ සාමාජිකයින් 100 දෙනෙකු සිටින අතර 2020 වසර ආරම්භයේදි ඉන් 5දෙනෙකු සමිතිය හැර ගියේ ය. එක් අයෙකු හට සාමාජික මුදල රු. 200ක් වූ අතර සාමාජිකයින් 10 දෙනෙකුගේ සාමාජික මුදල් වසර අවසානයේ ගෙවා නොතිබුණි. ඒ අනුව ලැබීම් හා ගෙවීම් ගිණුමේ දැක්විය යුතු සාමාජික මුදල් ශේෂය හා ආදායම් ප්‍රකාශයේ දැක්වි යුතු සාමාජික මුදල් ශේෂය පිලිවෙලින් දැක්වෙ පිලිතුර වන්නේ,**

1. 18,000 හා 20,000
2. 20,000 හා 18,000
3. 17,000 හා 19,000
4. 19,000 හා 17,000

**පහත තොරතුරු ආශ්‍රයෙන් පහත ප්‍රශ්න 56,57,58,59, හා 60 යන වලට පිලිතුරු සපයන්න.**

- දිලෙන තරු ක්‍රීඩා සමිතියේ සාමාජිකයින් 300 දෙනෙකු සිටින අතර සාමාජිකයෙකුගේ මාසික සාමාජික ගාස්තුව රු.50 කි. 2020.12.31 අවසන් වසර තුල සාමාජික මුදල් ලැබීම් හා අනෙකුත් තොරතුරු පහත පරිදි වේ.

- සාමාජිකයින් 50 දෙනෙකු මුදල් ගෙවා ඇත්තේ මාස 10 ක් සඳහා පමණි.
- සාමාජිකයින් 10 දෙදෙනෙකු ඉදිරි මාස 02 ක් සඳහාද වැඩිපුර මුදල් ගෙවා ඇත.
- සාමාජිකයින් 05 දෙනෙකු ජුනි මාසයේදි සමිතියෙන් ඉවත් වූ අතර ඒ වන තෙක් අදාල සාමාජික මුදල් නිසි පරිදි ගෙවා ඇත.
- සාමාජිකයින් 200 දෙනෙකු නිවැරදි ලෙස අදාළ මුළු සාමාජික මුදලම ගෙවා ඇත.
- වර්ෂය තුල මුදලින් දැරූ මුළු වියදම රු.80,000 කි.
- විදුලි බිල රු. 2,000 ක් උපචිත වේ

**56)** **ලැබීම් හා ගෙවීම් ගිණුමට අදාල සාමාජික මුදල් ශේෂය වන්නේ,**

1. රු.143,500 කි
2. රු.155,000 කි
3. රු.153,500 කි
4. රු.180,000 කි

**57)** **ආදායම් ප්‍රකාශයෙහි දැක්විය යුතු සාමාජික මුදල වන්නේ,**

1. රු.180,000 කි
2. රු.178,500 කි
3. රු. 153,500 කි
4. රු. 174,500 කි

**58)** **වර්ෂය තුල හිග සාමාජික මුදල වන්නේ,**

1. රු.6,500 කි
2. රු.11,500 කි
3. රු. 5,000 කි.
4. හිග සාමාජික මුදලක් නොමැත

**59)** **ආදායම් ප්‍රකාශයට අනුව ශුද්ධ අතිරික්තය කොපමණද?**

1. රු.71,500 කි
2. රු.180,000 කි
3. රු 73,500 කි
4. රු 151,500 කි

**60)** **ලැබීම් හා ගෙවීම් ගිණුමට අනුව අත ඉතිරි මුදල කොපමණද?**

1. රු.73,500 කි
2. රු.153 500 කි
3. රු. 71,500 කි.
4. රු.151,500 කි

**රචනා ප්‍රශ්න**

**01)** "සමගි" ක්‍රීඩා සමාජයේ 2020.12.31 න් අවසන් වසර තුල සිදුවු ගණුදෙනු පිලිබද සාරාංශ ගත තෙරතුරු පහත දක්වා ඇත.

| | | |
|---|---|---|
| 2020.01.01 ට මුදල් ශේෂය | = | 55,000 |
| ලද සාමාජික මුදල | = | 26,500 |
| ඇතුගත්වීමේ ගාස්තු ලැබීම් | = | 15,000 |
| සාමාන්‍ය පරිත්‍යාග | = | 10,000 |
| බැංකු ණය ලබා ගැනීම් | = | 50,000 |
| ක්‍රීඩා පාලක වැටුප් | = | 20,000 |
| විදුලි වියදම් | = | 6,000 |
| ක්‍රීඩා උපකරණ මිලට ගැනීම් | = | 10,000 |
| ණය වාරික | = | 2,000 |
| ක්‍රීඩා භුමි නඩත්තු වියදම් | = | 3,000 |

**අවශ්‍ය වන්නේ,**

ඉහත තොරතුර අශ්‍රෙයන් ලැබීම් හා ගෙවීම් ගිණුම පිලියෙළ කරන්න.

**02)** "ශක්ති" තරුණ සමිතියේ භාණ්ඩාගාරික විසින් 2020.12.31 දිනට අවසන් වර්ෂය සදහා සකස්කල ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දක්වා ඇත.

ශක්ති තරුණ සමිතියේ
2020.12.31 දිනට අවසන් වර්ෂය සදහා
ලැබීම් හා ගෙවීම් ගිණුම

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ ශේෂය | 35,000 | ආපනශාලා වියදම් | 18,000 |
| සාමාජික මුදල | 72,900 | ලිපි ද්‍රව්‍ය වියදම් | 8,000 |
| ඇතුලත් විමේ ගාස්තු | 10,500 | මුද්‍රණ ගාස්තු | 2,000 |
| ආපනශාලා විකුණුම් ආදායම් | 30,000 | සංගිත රාත්‍රියේ වියදම් | 3,000 |
| සංගිත රාත්‍රියෙන් ලද ආදායම | 25,000 | දුරකතන වියදම් | 2,000 |
| පරණ පත්‍ර විකුණන ලද | 5,000 | රක්ෂන ගාස්තු | 21,000 |
| ආදායම් | 100,000 | උපකරණ මිලදි ගැනිම් | 20,000 |
| බැංකු ණය | | ණය පොලි | 2,500 |
| | | ප/ගෙ/ ශේෂය | 197,400 |
| | 273,900 | | 273,900 |
| ඉ/ගෙ ශේෂය | 197,400 | | |

**අතිරේක තොරතුරු,**

- සමිතියේ සාමාජිකයින් 250 දෙනෙකු සිටි අතර එක් අයෙකුගේ සමාජික මුදල රු. 300 කි. පෙර වර්ෂයේ සාමාජිකයන් 3ගේ සාමාජික මුදල්ද මෙම වසරේ ලැබී ඇත.
- පරිත්‍යාග වශයෙන් වසර තුල සකස්කල ගොඩනැගිල්ලක් සමිතිය වෙත ලැබී ඇති අතර එයත් සමග අනෙකුත් වත්කම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2020.01.01 | 2020.12.31 |
|---|---|---|
| ගොඩනැගිලි වටිනාකම | 200,000 | 300,000 |
| උපකරණ | 100,000 | 120,000 |

- දේපල පිරියත උපකරණ වටිනාකම වන සරල මාර්ග ක්‍රමයට 5% බැගින් ක්ෂය කරනු ලබයි.
- මාසික රක්ෂණ වාරිකය රු.1,500 කි.
- වාරික ණය පොලිය 5% කි.

ඉහත තොරතුරු ආශ්‍රයෙන් ශක්ති තරුණ සමිතියේ 2020.12.31 න් අවසන් වර්ෂයට ආදායම් ප්‍රකාශය පිලියෙල කරන්න.

**03)** විද්‍යාර්ථ විද්‍යාලයේ විද්‍යා සංගමයේ භාණ්ඩාගාරික විසින් පිලියෙල කල ආදායම් ප්‍රකාශය පහත දැක්වේ.

විද්‍යාර්ථ විද්‍යාලයේ විද්‍යා සංගමයේ
2020.12.31 දිනට අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශය

| | | |
|---|---|---|
| **ආදායම්** | | |
| සාමාජික මුදල් | 25,000 | |
| කොඩි විකිණීමෙන් ලද ආදායම | 6,000 | |
| අධ්‍යාපන ප්‍රදර්ශණයෙන් | 20,000 | |
| පරිත්‍යාග ලැබීම් | 30,000 | |
| | | 81,000 |
| **වියදම්** | | |
| කොඩි සඳහා වන වියදම | 3,000 | |
| ප්‍රදර්ශණය සඳහා දැරූ වියදම | 5,000 | |
| සංග්‍රහ වියදම් | 500 | |
| සගරා මිලට ගැනීම් | 500 | |
| ගොඩනැගිලි කුලි | 3,000 | |
| ගොඩනැගිලි ක්ෂය | 5,000 | |
| ජල බිල්පත | 7,500 | 24,500 |
| අතිරික්තය | | |
| | | 56,500 |

**අතිරේක තොරතුරු:**

විද්‍යා සංගමයේ සාමාජිකයින් 250 දෙනෙකු සිටින අතර ඒක් අයෙකුගේ වාර්ෂක සාමාජික මුදල රු.100 කි. සාමාජිකයන් 10 දෙනෙකු මෙම වර්ෂය සඳහා ගෙවියයුතු සාමාජික මුදලින් අඩක් පමණ ගෙවා ඇති අතර සාමාජිකයන් 05 දෙනෙකු සම්පූර්ණ මුදලම ගෙවා නොමැත. සාමාජිකයන් 15 දෙනෙකු පෙර වර්ෂය සඳහා ගෙවිය යුතු සාමාජික මුදල මෙම වර්ෂයේදි ගෙවා ඇත. වාර්ෂික ගොඩනැගිලි කුලිය රු.3,000 ක් වන අතර ඒය මේ වන තෙක් ගෙවා නොමැත. ඉදිරියට ගෙවූ ජල බිල්පත් ගාස්තුව රු.2,500 කි.

**අවශ්‍ය වන්නේ,**

2020.12.31 න් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම සකස් කරන්න.

**07 පාඩම**

## නිෂ්පාදන පිරිවැය

### හැඳින්වීම

භාණ්ඩ නිෂ්පාදනය කර විකුණන ව්‍යාපාර ද වර්තමානයේ බහුලව දක්නට ලැබේ නිශ්පාදන ව්‍යාපාරයක ප්‍රධාන කාර්යය වන්නේ නිෂ්පාදන සම්පත් උපයෝගී කරගනිමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමයි. මෙම පරිච්ඡේදය මගින් නිෂ්පාදන පිරිවැය නිෂ්පාදන පිරිවැය මූලිකාංග පිළිබඳව මූලිකව ම පැහැදිළි කරයි. ඉන්පසු ප්‍රාථමික පිරිවැය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සහ මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සම්බන්ධව සාකච්ඡා කෙරේ ඒකකයක නිෂ්පාදන පිරිවැය ඒකක එක විකුණුම් මිල තීරණය කිරීම පිළිබඳ තවදුරටත් දැනුම ලබාදෙයි. එසේම පැතුරුම්පත් හෝ සුදුසු ක්‍රමයක් භාවිතයෙන් නිෂ්පාදන පිරිවැය සහ ඒකකයක විකුණුම් මිල ගණනය කරන ආකාරය සරලව ඉදිරිපත්කරයි. මෙම පරිච්ඡේදයට අදාළ ව පහතින් සකස් කර ඇති බහුවරණ සහ රචනා ප්‍රශ්න වලට සාර්ථකව පිළිතුරු සැපයීම තුලින් ඔබට නිෂ්පාදන පිරිවැය ලේඛනය සම්බන්ධව අවබෝධය වැඩි දියුණු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.



| බහුවරණ ප්‍රශ්න |
| --- |

**61) නිෂ්පාදන පිරිවැය නිර්වචනය කරන්න.**

………………………………………………………………………………………

………………………………………………………………………………………

**62) නිෂ්පාදන පිරිවැය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදයි. ඒ මොනවාද ?**

1. සෘජු නිෂ්පාදන පිරිවැය සහ වක්‍ර නිෂ්පාදන පිරිවැය
2. සෘජු ද්‍රව්‍ය පිරිවැය සහ වක්‍ර ද්‍රව්‍ය පිරිවැය
3. සෘජු ශ්‍රම පිරිවැය සහ වක්‍ර ශ්‍රම පිරිවැය
4. සෘජු ද්‍රව්‍ය පිරිවැය සහ සෘජු ශ්‍රම පිරිවැය

**63) සෘජු නිෂ්පාදන පිරිවැය  කොටස් කීපයකට හඳුනා ගත හැක. ඒවා මොනවාද ?**

………………………………………………………………………………………

………………………………………………………………………………………

**64) භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා දරන ලද සෘජු ද්‍රව්‍ය, ශ්‍රමය සහ වෙනත් සෘජු පිරිවැය එකතුව හඳුන්වන්නේ ,**

1. මුළු සෘජු ද්‍රව්‍ය පිරිවැය
2. නිෂ්පාදන පිරිවැය
3. ප්‍රාථමික පිරිවැය
4. විකුණුම් පිරිවැය

**65) නිෂ්පාදන ඒකකයකට අදාළව පැහැදිලිව හඳුනාගත නොහැකි සමස්ත නිෂ්පාදනය වෙනුවෙන් දරන පිරිවැය වන්නේ**

1. ප්‍රාථමික පිරිවැය
2. නිෂ්පාදන පිරිවැය
3. සෘජු ද්‍රව්‍ය පිරිවැය නිෂ්පාදන
4. පොදු කාර්ය පිරිවැය

**66) නිෂ්පාදිතයක මිල නියම කිරීමේ දී සලකා බැලිය යුතු ප්‍රධානතම සාධකය වන්නේ**

1. භාණ්ඩය සඳහා පවතින ඉල්ලුම
2. නිෂ්පාදිතයෙහි පිරිවැය
3. ආයතනයේ මිල තීරණය කිරීමේ පරමාර්ථ
4. නීතිමය සාධක

**67) නිෂ්පාදනය කරන කම්හලක මාර්තු මාසේ සඳහා අදාළ තොරතුරු පහත දැක්වේ.**

- මුළු නිෂ්පාදන පිරිවැය රු. 200,000
- නිපදවූ මේස ගණන 50
- මේසයකින් 10% ක ලාභාන්තිකය තබා අලෙවි කරයි

**1. මේසයක පිරිවැය කොපමණද ? ……………………………………**

**2. මේසයක  විකුණුම්ල කොපමණද ? ………………………………..**

**68) පහත තොරතුරු ඇසුරෙන් ප්‍රාථමික පිරිවැය සහ නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ගණනය කරන්න.**

- පුටු සෑදීමට යොදා ගන්නා දැව රු. 90,000
- නිෂ්පාදන වැටුප රු. 15,000
- කම්හල් කුලී රු. 4,000
- යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන රු. 6,000
- කම්හල් රක්ෂණ ගාස්තු රු. 3,000

**1. ප්‍රාථමික පිරිවැය කොපමණද ? ……………………………………….**

**2. නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය කොපමණද ? ………………………**

**69) නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය හි කොටස් ලෙස හඳුනාගත හැක්කේ,**

1. සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය, සෘජු වෙනත් පිරිවැය
2. වක්‍ර ද්‍රව්‍ය පිරිවැය ,වක්‍ර ශ්‍රම පිරිවැය, වක්‍ර වෙනත් පිරිවැය
3. වක්‍ර ද්‍රව්‍ය පිරිවැය , ප්‍රාථමික පිරිවැය ,වක්‍ර ශ්‍රම පිරිවැය
4. ප්‍රාථමික පිරිවැය ,වක්‍ර වෙනත් පිරිවැය ,වක්‍ර ද්‍රව්‍ය පිරිවැය

**70) සමන්ගෙ ව්‍යාපාරය කිසියම් නිෂ්පාදිතයට අදාළව තොරතුරු පහත දැක්වේ.**

- ප්‍රාථමික පිරිවැය රු. 100,000
- නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය රු. 60,000
- නිෂ්පාදනය කර ඇති මුළු ඒකක ගණන 100

**1. මුළු නිෂ්පාදන පිරිවැය කොපමණද ? ……………………………………**

**2. ඒකකයක පිරිවැය කොපමණද ? ………………………………………..**

**රචනා ප්‍රශ්න**

**01)** ලංකා අභ්‍යාස පොත් ආයතනයේ 2018.03:31 අවසන් වසරට අදාළ පහත නිෂ්පාදන දත්ත ශේෂ පිරික්සුමෙන් උපුටා ගෙන ඇත.

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය | 30,000 |
| කම්හල් වේතන | 6,000 |
| කම්හල් විදුලිය | 5,000 |
| යන්ත්‍ර අළුත්වැඩියා | 4,000 |
| යන්ත්‍ර රක්ෂණ | 3,500 |
| කම්හල් වරිපණම් සහ බදු | 2,300 |
| සෘජු නිෂ්පාදන වැටුප් | 10,000 |
| සෘජු වෙනත් | 1,000 |

**අතිරේක තොරතුරු**

- යන්ත්‍ර ක්ෂය රු. 3,000 කම්හල් පොදුකාර්ය වියදම් වලට ඇතුළත් කළ යුතුය.
- කාල පරිච්ඡේදය තුළ අභ්‍යාස පොත් 600 ක් නිපදවා වෙළඳ අංශය වෙත යවා තිබේ.

අවශ්‍යවන්නේ,

1. නිෂ්පාදන පිරිවැය ප්‍රකාශනය සහ එක් අභ්‍යාස පොතක නිෂ්පාදන පිරිවැය

**02)**පහත දැක්වෙන්නේ අල්මාරි නිෂ්පාදනය නිරතවන ව්‍යාපාරයක ජූලි මාසයට අදාල තොරතුරු වේ.

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය | 25,000 |
| සෘජු නිෂ්පාදන වැටුප් | 10,000 |
| කම්මල් කුලී | 3,000 |

| | |
|---|---|
| කම්හල් රක්ෂණ | 2,000 |
| අනෙකුත් සෘජු වියදම් | 1,500 |
| ඇණ සහ පොලිෂ් සඳහා වියදම් | 2,500 |
| සුපරීක්ෂක වේතන | 2,000 |
| යන්ත්‍ර සඳහා ඉන්ධන සහ විදුලිය | 3,500 |

අවශ්‍යවන්නේ

1. ජූලි මාසයට අදාල ප්‍රාථමික පිරිවැය සහ කම්හල් පොදු කාර්ය පිරිවැය ගණනය කරන්න.
2. මුළු නිෂ්පාදන පිරිවැය සොයන්න.
3. මාසය තුළ අල්මාරි 10 ක් නිපදවන ලදී .ඒකකයකින් 10% ක ලාභාන්තිකය තබා ගනී නම් එක අල්මාරියක විකුණුම් මිල සොයන්න.

**03)** පහතින් දැක්වෙන්නේ රණජය වානේ ව්‍යාපාරයක 2018 මාර්තු මාසය තුළ දරන ලද පිරිවැය දත්ත වේ.

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය වානේ | 300,000 |
| දුරකථන ගාස්තු | 2,000 |
| ප්‍රචාරණය | 1,500 |
| යන්ත්‍ර රක්ෂණය | 2,500 |
| යන්ත්‍ර අළුත්වැඩියා | 4,200 |
| යන්ත්‍ර ක්ෂය | 3,100 |
| ගණකාධිකාරී ගේ වැටුප | 6,000 |
| කම්හල් විදුලිය | 2,400 |
| සෘජු නිෂ්පාදන වැටුප් | 7,000 |
| කම්හල් කුලී | 3,600 |
| කම්හල් කළමනාකරුගේ වේතන | 2,000 |
| විකුණුම් සේවක වේතන | 2,500 |
| ණය පොලී | 1,000 |
| අනෙකුත් සෘජු වියදම් | 2,500 |

අවශ්‍ය වන්නේ ,

නිෂ්පාදන පිරිවැය වෙන් කර හඳුනා ගනිමින් මුළු නිෂ්පාදන පිරිවැය ලේඛනය සකස් කරන්න

# 08 පාඩම

## ආයෝජනය

### <u>හැඳින්වීම</u>

කුටුම්භයක, ආයතනයක ,හෝ ඕනෑම රටක දියුණුවට හේතුවන ප්‍රධානතම සාධකයක් ලෙස ආයෝජනය හඳුනා ගත හැක. පුද්ගලයකු, ආයතනයක් හෝ කිසියම් රටක් තමා උපයන ආදායමෙන් ඉතිරි කරගත් මුදල් ප්‍රමාණයක් යම් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායි මාර්ගයක යෙදවීම ආයෝජනය වේ. මෙම පාඩම මගින් ආයෝජනය වැදගත්කම හා කොටස් වෙළඳපළ ආයෝජනයේ වැදගත්කම විමර්ශනය කරයි.

මෙම පාඩම අධ්‍යනය අවසානයේ දී ආයෝජනයේ වැදගත්කම පැහැදිලි කිරීම, විවිධ ආයෝජන මාර්ග හඳුනා ගැනීම, සුදුසු ආයෝජන මාර්ග තෝරා ගැනීමේදී මූලික අවධානය යොමු කළ යුතු සාධක හඳුනාගැනීම, කොටස් වෙළඳපළ ආයෝජනය වැදගත්කම හඳුනා ගැනීම, සාමාන්‍ය කොටස් ආයෝජනයේ වැදගත්කම හඳුනා ගැනීම හා භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය වැදගත්කම හඳුනා ගැනීම පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීම මෙම පාඩමට අදාල ඉගෙනුම් ඵල වේ. එම ඉගෙනුම් ඵල සාර්ථකව ලඟාකර ගැනීම සඳහා මඟ පෙන්වන ආකාරයේ ගැටළු කිහිපයක් පහතින් සපයා ඇත.



**බහුවරණ ප්‍රශ්න**

**71) පහත දෑ අතුරින් පුද්ගලයෙකුට ආයෝජන මාර්ගයක් ලෙස තෝරා ගත නොහැක්කේ?**

1. කොටස් වෙළඳපොලේ කොටස් මිලදී ගැනීම
2. පාරිභෝජනය සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම
3. ඉඩම් හා ස්වර්ණාභරණ මිලදී ගැනීම
4. බැංකුවේ මුදල් තැන්පත් කිරීම

**72) කොටස් වෙළඳපළේ සාමාන්‍ය කොටස් වල ආයෝජනය කිරීමෙන් සාමාන්‍ය කොටස් හිමියෙකුට ලබාගත හැකි ප්‍රතිලාභය වන්නේ?**

1. පොලී ආදායම
2. ප්‍රාග්ධන ලාභ
3. ලාභාංශ ආදායම්
4. කොමිස් ආදායම

**73) සාමාන්‍යකොටස් වල ආයෝජනය කිරීමෙන් කොටස් හිමියෙකුට ලබාගත නොහැකි ප්‍රතිලාභයක් වන්නේ?**

1. සමාගමේ අයිතිකරුවෙකු බවට පත්වීම
2. අධ්‍යක්ෂක මණ්ඩලය පත්කර ගැනීම සඳහා ඡන්ද අයිතිය හිමිවීම
3. සමාගම සම්බන්ධ තීරණ ගැනීමේ අයිතිය ලැබීම
4. සෑම වසරකම ස්ථිර නිශ්චිත ලාභාංශ ප්‍රමාණයක් ලබා ගත හැකි වීම.

**74) කොළඹ කොටස් වෙළඳපළ කටයුතු අධීක්ෂණය කිරීම හා විධිමත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ආයතනය වන්නේ?**

1. ශ්‍රී ලංකා මහ බැංකුව
2. බලපත්‍රලාභී වාණිජ බැංකු
3. ශ්‍රී ලංකා විනිමය හා සුරකුම්පත් කොමිෂන් සභාව
4. ආයෝජන මණ්ඩලය

**75) රජයේ කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරනු ලබන කෙටිකාලීන සුරැකුම්පත් වර්ගය වන්නේ?**

1. වරණීය කොටස්
2. භාණ්ඩාගාර බිල්පත්
3. සාමාන්‍ය කොටස්
4. ණයකර

**76) භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් වන වැරදි ප්‍රකාශය වන්නේ**

1. ඕනෑම අවස්ථාවක මුදල් බවට පත් කළ හැකි වීම
2. ස්ථාවර ලාභාංශයක් වසර අවසානයේ දී ලැබීම
3. ආයෝජනය කළ මුදල ආපසු ලැබීම සම්බන්ධයෙන් පූර්ණ රාජ්‍ය ආරක්ෂාවක් හිමිවීම
4. පරිණත වීමේ කාල සීමාව මාස තුනක් හයක් හෝ වර්ෂයක් වීම

**77) සාමාන්‍ය කොටස් නිකුත් කරනු ලබන්නේ**

1. සීමාසහිත සමාගම් විසින්
2. ශ්‍රී ලංකා මහ බැංකුව විසින්
3. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින්
4. කේවල ස්වාමි ව්‍යාපාර විසින්

## රචනා ප්‍රශ්න

**01)** රණසිංහ මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියට අනුයුක්තව රාජකාරි කිරීමෙන් අනතුරුව විශ්‍රාම යෑමේ දී රුපියල් මිලියනයක මුදලක් ඔහු වෙත හිමි විය. එම මුදල ආයෝජන මාර්ගයක ආයෝජනය කිරීමට ඒ මහතා අදහස් කරයි. රණසිංහ මහතාගේ මුදල් ආයෝජනය කිරීම සඳහා සුදුසු ආයෝජන මාර්ග හතරක් දක්වා එම එක් එක් ආයෝජන මාර්ග වලින් ලැබෙන ප්‍රතිලාභ ලැයිස්තුගත කරන්න.

**02)** ඉතිරිකිරීම් ගිණුමක හා ස්ථාවර තැන්පතුවක් අතර ඇති වෙනස්කම් දක්වන්න

**03)** රණසිංහ මහතා මෙම ආයෝජනය සම්බන්ධයෙන් තම මිතුරන් දෙදෙනෙකු ගෙන් විමසූ විට එක් අයෙක් ඉඩම් කිහිපයක් මිලදී ගැනීම සඳහා මෙම මුදල් යොදවන ලෙසත් අනෙක් මිතුරා කොටස් වෙළඳපළ තුළ ආයෝජනය කිරීම සුදුසු බවත් පවසා සිටියේය. ඔබ සිතන ආකාරයට මේ අතරින් වඩාත් සුදුසු ආයොජන මාර්ගය කුමක්ද යන්න හදුන්වා එහි වාසි හා අනෙක් ආයෝජන මාර්ගයේ අවාසිද දක්වමින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

**04)** සාමාන්‍ය කොටස් හා භාණ්ඩාගාර බිල්පත් අතර ඇති වෙනස්කම් දක්වන්න

**05)** “ආයෝජනයෙන් පුද්ගලයෙකුට මෙන්ම රටකට ද හිතකර ප්‍රථිඵල අත්කර දෙයි.” පැහැදිලි කරන්න.

## බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු - **10** වසර

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 - 2 | 22 - 4 | 43 - 4 | 64 - 3 | 85 - 4 | 106 - 4 | 127 - 2 | 148 - 1 |
| 02 - 4 | 23 - 3 | 44 - 2 | 65 - 4 | 86 - 4 | 107 - 3 | 128 - 1 | 149 - 3 |
| 03 - 1 | 24 - 3 | 45 - 4 | 66 - 3 | 87 - 3 | 108 - 4 | 129 - 2 | 150 - 4 |
| 04 - 1 | 25 - 3 | 46 - 2 | 67 - 3 | 88 - 1 | 109 - 4 | 130 - 4 | 151 - 3 |
| 05 - 4 | 26 - 2 | 47 - 1 | 68 - 3 | 89 - 3 | 110 - | 131 - 4 | 152 - |
| 06 - 4 | 27 - 4 | 48 - 2 | 69 - 2 | 90 - 3 | 111 - 1 | 132 - 3 | 153 - |
| 07 - 2 | 28 - 3 | 49 - 3 | 70 - 3 | 91 a)3<br>b)2 c)1 | 112 - 2 | 133 - 1 | 154 - 2 |
| 08 - 4 | 29 - 2 | 50 - 2 | 71 - 1 | 92 - 1 | 113 - 2 | 134 - 4 | 155 - 4 |
| 09 - 1 | 30 - 3 | 51 - 1 | 72 - 2 | 93 - | 114 - 1 | 135 - 2 | 156 - |
| 10 - 3 | 31 - 3 | 52 - 4 | 73 - 2 | 94 - 2 | 115 - 1 | 136 - | 157 - 3 |
| 11 - 4 | 32 - 2 | 53 - 2 | 74 - 3 | 95 - 2 | 116 - 1 | 137 - 3 | 158 - |
| 12 - 4 | 33 - 3 | 54 - 3 | 75 - 4 | 96 - 1 | 117 - 4 | 138 - 2 | 159 - 3 |
| 13 - 3 | 34 - 3 | 55 - 2 | 76 - 4 | 97 - 4 | 118 - 3 | 139 - | 160 - 3 |
| 14 - 4 | 35 - 4 | 56 - 2 | 77 - 3 | 98 - 4 | 119 - 3 | 140 - 3 | 161 - |
| 15 - 3 | 36 - 1 | 57 - 3 | 78 - 2 | 99 - 1 | 120 - 4 | 141 - 4 | 162 - 3 |
| 16 - 4 | 37 - 3 | 58 - 1 | 79 - 3 | 100 - 2 | 121 - 1 | 142 - 4 | 163 - |
| 17 - 1 | 38 - 4 | 59 - 1 | 80 - 1 | 101 - 4 | 122 - 1 | 143 - 2 | 164 - 2 |
| 18 - 4 | 39 - 1 | 60 - 4 | 81 - | 102 - 2 | 123 - 4 | 144 - 4 | 165 - |
| 19 - 4 | 40 - 1 | 61 - 2 | 82 - | 103 - 2 | 124 - 4 | 145 - 2 | |
| 20i)ස<br>ii) අ | 41 - 2 | 62 - 2 | 83 - 2 | 104 - 4 | 125 - 2 | 146 - 3 | |
| 21 - 3 | 42 - 3 | 63 - 4 | 84 - 1 | 105 - 2 | 126 - 2 | 147 - | |

| | |
|---|---|
| 81 | අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වන අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන්නා වූ ව්‍යාපාරය විසින් පාලනය කෙරෙන සම්පත් වත්කම් ලෙස හැඳින්වේ. |
| 82 | අතීත ගනුදෙනුවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇති වන ව්‍යාපාරය විසින් ගෙවිය යුතු අගය වගකීම් ලෙස හැඳින්විය හැකිය. |

| 93 | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| i | වැඩිවේ | වෙනස් නොවේ | වැඩිවේ |
| ii | අඩුවේ | වෙනස් නොවේ | අඩුවේ |
| iii | අඩුවේ | අඩුවේ | අඩුවේ |
| iv | අඩුවේ | වෙනස් නොවේ | අඩුවේ |

| | |
|---|---|
| 110 | i. අසත්‍ය ii. සත්‍ය iii. සත්‍ය iv. සත්‍ය |
| 136 | i.රු.475000 ii.රු. 500000 |
| 139 | ගිණුමේ පවතින ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කළ විට බැංකුව එම චෙක්පත් වලට ගෙවීම් කිරීම නිසා ගිණුම් හිමියා බැංකුවට ණයගැති වන අගය බැංකු අයිරාව ලෙස හැඳින්වේ. |
| 147 | ගිණුම් වලට හර කර ඇති අගය සහ බැර කර ඇති අගය සමාන බව<br>ගිණුම් නිවැරදිව තුලනය කර ඇති බව |
| 152 | ගැනුම් ගිනුම හර 45000 ණයහිමි ගිණුම බැර 45000 |
| 153 | ජගත් (ණයගැති )ගිණුම හර 45000 විකුණුම් ගිණුම බැර 45000 |
| 156 | විකුණුම් ගිණුම හර 108000 ණයගැති ගිණුම බැර 108000 |
| 158 | මූලික සටහන් පොත් වල ගනුදෙනු සටහන් කිරීමේදී, මූලික සටහන් පොත් වලින් ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමේදී , ලෙජර ගිණුම් තුලනය කිරීමේදී , ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේදී |
| 161 | වරිපණම් ගිණුම හර 7000 විදුලි ගිණුම බැර 7000 |
| 163 | විකුණුම් ගිණුම හර 36000 අවිනිශ්චිත ගිණුම බැර 36000 |
| 165 | ශේෂ පිරික්සුමේ හර ශේෂ එකතුව සහ බැර ශේෂ එකතුව අතර වෙනසක් ඇති විටෙක ඊට හේතු වූ ගිණුම්කරණ වැරදි සොයා ඒවා නිවැරදි කරන තෙක් ශේෂ පිරික්සුමේ වෙනස තාවකාලිකව සටහන් කරන ගිණුම අවිනිශ්චිත ගිණුම නම් වේ. |

# බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු - 11 වසර

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 01 - 4 | 12 - 3 | 23 – 4 | 34 - 3 | 45 - | 56 - 3 | 67 - |
| 02 - | 13 - | 24 - 3 | 35 - 4 | 46 - 1 | 57 - 2 | 68 - |
| 03 - 3 | 14 - | 25 - | 36 - 2 | 47 - 3 | 58 - 3 | 69 - 2 |
| 04 - | 15 - 3 | 26 - 4 | 37 - 1 | 48 - 1 | 59 - 1 | 70 - |
| 05 - 4 | 16 - | 27 - 2 | 38 - 3 | 49 - 3 | 60 - 3 | 71 - 2 |
| 06 - 3 | 17 - | 28 - | 39 - 3 | 50 - 1 | 61 - | 72 - 3 |
| 07 - | 18 - | 29 - | 40 - 1 | 51 - | 62 - 1 | 73 - 4 |
| 08 - 4 | 19 - | 30 - 2 | 41 - 2 | 52 - | 63 - | 74 - 3 |
| 09 - 4 | 20 - | 31 - 3 | 42 - 3 | 53 - | 64 - 3 | 75 - 3 |
| 10 - 1 | 21 - | 32 - 3 | 43 - | 54 - 3 | 65 - 4 | 76 - 2 |
| 11 - 4 | 22 - | 33 - 4 | 44 - | 55 - 3 | 66 - 2 | 77 - 1 |

| | |
|---|---|
| 02 | i. දේශීය ii. සිල්ලර වෙළඳාම iii. අපනයන |
| 04 | i. සත්‍ය යි ii. අසත්‍ය යි iii. අසත්‍ය යි iv. අසත්‍ය යි |
| 07 | චෙක් පත් මගින් ගණුදෙනු කළ හැකි වීම, බැංකු අයිරා පහසුකම් , සෘජු ප්‍රේෂණ රැස්කිරීම.<br>ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම, බැංකු ප්‍රකාශනය ලැබීම. |
| 13 | භාණ්ඩයේ ස්වාභාවය, ප්‍රවාහන පිරිවැය ,ධාරිතාව ,ආරක්ෂාව, වේගය ,සුලභතාවය |
| 14 | චෙක්පත මුහුණත සඳහන් ආදායකයාගේ නම ඒ ආකාරයටම ඔහුගේ අත් අකුරින් චෙක්පත පිටුපස ලිවීමයි |
| 16 | කළමණාකරණය යනු ව්‍යාපාරඅරමුණක් සඵලදායීව ඉටුකර ගැනීම සඳහා පවතින සම්පත් කාර්යක්ෂමව යොදා ගනිමින් එම ව්‍යාපාරය සැලසුම් කිරීමට, සංවිධානය කිරීමට,මෙහෙයවීමට සහ පාලනය කිරීමට අදාළ වූ ක්‍රියාවලිය යි. |
| 17 | සැලසුම්කරණය ,සංවිධානකරනය, මෙහෙයවීම, සහ පාලනයයි |
| 18 | සැලසුම්කරණය යනු ව්‍යාපාරයක අරමුණු තීරණය කිරීම සහ අරමුණු ඉටුකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග තීරණය කිරීමේ ක්‍රියාවලියයි. |
| 19 | සංවිධානකරණය යනු ව්‍යාපාරයක අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සැලසුම් කරන ලද ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් ,තනතුරු සහ වැඩ බෙදාහැරීම සම්බන්ධ ක්‍රියාවලිය යි. |
| 20 | මෙහෙයවීම යනු සැලසුම් කරන ලද ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපාරය මානව සම්පත් නිසි ලෙස හැසිර වීමේ ක්‍රියාවලියයි. |
| 21 | පාලනය යනු ව්‍යාපාරය කටයුතු සැලසුම් කළ ආකාරයෙන්ම සිදු වේ දැයි සොයා බැලීම එසේත් නැත්නම් අඩුපාඩු සොයා ගෙන ඒවා නිවැරදි කිරීම සම්බන්ධ ක්‍රියාවලිය වේ. |
| 22 | i. අසත්‍ය යි ii. සත්‍ය යි iii. අසත්‍ය යි iv. සත්‍ය යි |
| 25 | මිනිස් අවශ්‍යතා සහ වුවමනා වඩාත් හොඳින් තෘප්තිමත් කළ හැකි වන භාණ්ඩයක් හෝ සේවාවක් නිර්මාණය කිරීම ,<br>නිර්මාණය කළ භාණ්ඩය හෝ සේවාව පාරිභෝගිකයන් වෙත ආකර්ෂණීය අයුරින් හඳුන්වාදීම,<br>සාධාරණ මිලක් ලකුණු කිරීම ,<br>වඩාත් සරල සහ යෝග්‍ය පරිදි භාණ්ඩය හෝ සේවාව පාරිභෝගිකයා අතට පත්කිරීම ,<br>භාණ්ඩය හෝ සේවාව පිළිබඳ පාරිභෝගික ප්‍රතිචාරසොයා බැලීම ,සහ අලෙවියෙන් පසු අවශ්‍ය සේවා සැපයීම. |
| 28 | i. √ ii.√ iii.× iv.√ |
| 29 | සෘජු බෙදාහැරීම, අතරමැදියන් මගින් බෙදා හැරීම |
| 43 | උපයාගත් ලාභය /මෙහෙයුම් ප්‍රතිඵලය ප්‍රමාණවත් මට්ටමක පවතින බවට සොයා බැලීම.<br>ව්‍යාපාරය මෙහෙයුම් ප්‍රතිඵලය හා මූල්‍ය තත්වය සම්බන්ධව අදහසක් ලබාගැනීම. |
| 44 | දළ ලාභය යනු විකුණුම් ආදායම විකුණුම් පිරිවැය වඩා දැඩි නම් ඒ වැඩිවූ ප්‍රමාණය දළ ලාභය වේ.<br>දළ ලාභය = විකුණුම් ආදායම් - විකුණුම් පිරිවැය |
| 45 | ලාභාලාභ ගිණුමක් යනු වෙළෙඳ ව්‍යාපාරය විසින් ගිණුම් කාලය තුල ඉපයූ ලාභය හෝ අලාභය ගණනය කර ඉදිරිපත් කිරීම සඳහා පිළියෙළ කර ඉදිරිපත් කරනු ලබන වාර්තාවයි |
| 51 | ලැබිය යුතු ආදායම් ගිණුම් හර<br>අදාල ආදායම් ගිණුම් බැර |
| 52 | අදාල වියදම් ගිණුම හර |

| | |
|---|---|
| | උපචිත වියදම් ගිණුම් බැර |
| 53 | ලෙජර් ගිනුම් වල සඳහන් වටිනාකම් ගිණුම් කාලච්ඡේදය අවසන් දිනට යාවත්කාලීන කල හැකි වීම.<br>ගිණුම් කාලච්ඡේදය තුළ ඉපැයූ ලාභය හෝ අලාභය හෙවත් මෙහෙයුම් ප්‍රතිඵලය නිවැරැදිව ගණනය කළ හැකි වීම.<br>ගිණුම් කාලච්ඡේදය අවසන් වන දිනට ව්‍යාපාරය වත්කම්, වගකීම් හා හිමිකම් හෙවත් මූල්‍ය තත්වය වඩාත් නිවරැදිව අනාවරනය කරගත හැකිවීම. |
| 61 | නිෂ්පාදන පිරිවැය යනු යම් නිශ්චිත කාල පරිච්ඡේදයක යම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය සඳහා දරන ලද වියදම් වල එකතුව ලෙස හැඳින්විය හැකිය. |
| 63 | සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය , සෘජු වෙනත් පිරිවැය |
| 67 | i. රු. 4000 ii. රු.4400 |
| 68 | i. රු. 105000 ii. රු.13000 |
| 70 | i. රු. 160000 ii. රු. 1600 |

## රචනා ප්‍රශ්න සඳහා පිළිතුරු - 10 වසර

### 01- ව්‍යාපාර පසුබිම, 02 - ව්‍යාපාර පරිසරය, 03 - ව්‍යාපාර සංවිධාන

**01)** 1. අධ්‍යාපනය, සෞඛ්‍යය, ආරක්ෂාව, ප්‍රවාහනය, සන්නිවේදනය, විනෝදය

2. විද්‍යුත් මුදල් යනු අන්තර්ජාලය හරහා ගනුදෙනු කරන මුදල් සඳහා වන යෙදුමයි. විද්‍යුත් මුදල් සෘජු බැර පැවරුම්, සෘජු හර පැවරුම්, ණය කාඩ්පත්, හරපත් ආදියෙන්සමන්විතවේ.

3. අන්තර්ජාලය උපයෝගී කරගෙන මුදල් ඉපයීම ද මෙලෙස හඳුන්වයි. ලෝකයේ වැඩිම ආදායම් ලබන පුද්ගලයින් මෙම අන්තර්ජාලය භාවිතා කරමින් ඔවුන්ගේ ව්‍යාපාර වැඩි දියුණු කර ගත්තෝය. ලොව අංක එකේ ධනවතා වන බිල් ගේට්ස් මහතා තමාගේ ආදායමෙන් විශාල ප්‍රමාණයක් මෙම අන්තර්ජාල මගින් ලබාගන්නා බව පැහැදිලිය. ව්‍යාපාර වල කටයුතු ඉතා පහසු කරවීමට විද්‍යුත් මුදල් බලපා ඇත. මුදල් ළඟ තබා නොගෙන අවශ්‍යතා සඳහා ඉතා පහසුවෙන් ඉතා සුරක්ෂිතව ගනුදෙනුකරුවන් පහසුවෙන් හසුරුවා ලීමට මෙමගින් හැකියාව ලැබී ඇත. ශක්තිමත් පාරිභෝගික පදනම, පිරිවැටුම ඉහළ යාම, විකුණුම් සඳහා ක්ෂණිකව මුදල් ලැබීම මෙයින් ලැබෙන තවත් වාසි ලෙස පෙන්විය හැකිය.

4. මිනිසාගේ පැවැත්ම සමාජීය වශයෙන් දියුණු වන විට ඔවුන්ගේ අවශ්‍යතා වුවමනා කෙමෙන් පුළුල් විය. එවිට ඔවුන්ට අවශ්‍ය සියලුම දෑ තනිව නිෂ්පාදනය කර ගැනීම අපහසු කාර්යයක් බවට පත් විය. එම ගැටළුවට විසඳුමක් ලෙස විවිධ පුද්ගලයෝ තමන්ගේ දක්ෂතාවය සහ තමන් සතු සම්පත් උපයෝගී කරගෙන තමන්ට වඩාත්, හොඳින් නිපදවිය හැකි භාණ්ඩ පමණක් විශාල ප්‍රමාණයෙන් නිෂ්පාදනය කළහ. එම නිසා භාණ්ඩ අතිරික්තයක් බිහි විය. පසුව මෙම භාණ්ඩ පුද්ගලයින් සමඟ හුවමාරු කර ගනිමින් ඔවුන්ට අවශ්‍ය අනෙකුත් භාණ්ඩ ලබා ගත්හ. මෙම භාණ්ඩ හුවමාරු ක්‍රමය හෙවත් බාටර් ක්‍රමය ලෙස හැඳින්වේ. භාණ්ඩ හුවමාරුව සඳහා මුදල් භාවිතය ආරම්භ වීමත් සමග වෙළඳාම ආරම්භ වූ බව කියවේ.

5.

- ඉහළ ගුණාත්මක බවින් යුතු භාණ්ඩ තරගකාරී මිලකට ලබාගත හැකිවීම.
- මිනිසුන්ගේ අවශ්‍යතා මනා කොට හඳුනාගෙන ව්‍යාපාර ආයතන කටයුතු කරන නිසා පාරිබෝගිකයන්ට ඉහළ තෘප්තියක් ලබා ගැනීමට හැකිවීම.
- පාරිභෝගික අයිතීන් සුරක්ෂිත වීම.

6. ව්‍යාපාර සංවිධාන ප්‍රධාන වශයෙන් වර්ග කල හැකි ආකාරයන් පහත වේ.

- හිමිකාරීත්වය අනුව වර්ග කීරීම(පෞද්ගලික අංශයේ ව්‍යාපාර, රාජ්‍ය අංශයේ ව්‍යාපාර)
- අරමුණ අනුව වර්ග කීරීම (ලාභ අරමුණු කරගත්, ලාභ අරමුණු නොගත්)

- පරිමාණය අනුව වර්ග කිරීම(සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාර)

7.

- තනි පුද්ගල ව්‍යාපාර
- හවුල් ව්‍යාපාර
- සංස්ථාපිත සමාගම්
- සමූපකාර
- සමිති සමාගම්

8.

- මධ්‍යම රජය යටතේ පවත්නා ව්‍යාපාර
- පලාත් සභා යටතේ පවත්නා ව්‍යාපාර
- පලාත් පාලන ආයතන යටතේ පවත්නා ව්‍යාපාර
  උදා. රාජ්‍ය දෙපාර්තතමේන්තු, සංස්ථා

9.

**අරමුණ අනුව වර්ග කිරීම**

- ලාභ අරමුණු කරගත්
  - පෞද්ගලික
    - -තනි පුද්ගල ව්‍යාපාර
    - -හවුල් ව්‍යාපාර
    - -සංස්ථාපිත සමාගම්
  - පොදු
    - -රාජ්‍ය සමාගම්
- ලාභ අරමුණු නොගත්
  - පෞද්ගලික
    - -සමූපකාර
    - -සමිති සමාගම්
  - පොදු
    - -රාජ්‍ය දෙපාර්තතමේන්තු
    - -සංස්ථා

**02)** 1.

- ආර්ථික පරිසරය
- ආර්ථික පරිසරය
- නෛතික පරිසරය
- සමාජ හා සංස්කෘතික පරිසරය

2. ව්‍යාපාර පරිසරය

- අභ්‍යන්තර පරිසරය
  - අයිතිකරුවන්
  - කළමනාකරුවන්
  - සේවකයන්
- බාහිර පරිසරය
  - ගනුදෙනුකරුවන්
  - සැපයුම්කරුවන්
  - තරගකරුවන්
  - දේශපාලන පරිසරය
  - නෛතික පරිසරය
  - ආර්ථික පරිසරය
  - ගෝලීය පරිසරය

3.

- දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ඉල්ලුම වැඩිවීම.
- ක්ෂණික ආහාර සඳහා වන ඉල්ලුම වැඩිවීම.
- කාන්තා කාර්යාලීය ඇඳුම් මෝස්තර සඳහා වන ඉල්ලුම වැඩිවීම.

4.

- රට තුළ ආර්ථික, සංස්කෘතික, සමාජීය සුරක්ෂිතතාවය තහවුරු කරගැනීම සඳහා
- නිදහස් ස්වෛරී රාජ්‍යයක්රටතුල තහවුරු කරගැනීමට
- ජනතාවගේ පවත්නා ස්වං විනය ඉහළ නැංවීමට
- සීමාව ඉක්මවා වැරදි කරන්නන්ට නිසි දඬුවම් ලබා දීමට
- පාරිභෝගිකයා, දේශීය වෙළඳුන්, දේශීය නිෂ්පාදකයින්, ව්‍යාපාරික ප්‍රජාව හා පරිසරය ආරක්ෂා කර ගැනීමට
- මෙම නීතිරීති නිසා ව්‍යාපාරිකයන්ට සිය අභිමතය පරිදි ව්‍යාපාරිකයින් ඒ හැකියාව සීමිත වේ

5.

- පොලී අනුපාතය - බැංකු තැන්පතු සඳහා ලබා දෙන සහ බැංකු ණය අයකරන පොලී අනුපාතය
- උද්ධමනය - භාණ්ඩ හා සේවා අලෙවියේදී තීරණය වන පොදු මිල ගනන් අඛන්ඩව ඉහල යාම
- ආදායම් ව්‍යාප්තිය - රටක ජාතික ආදායම් එරට ජනතාව අතර බෙදී ගොස් ඇති ආකාරය
- රැකියා නියුක්තිය - රටක රැකියා අපේක්ෂා කරන සියලු දෙනාටම ගැළපෙන රැකියාවක් ලැබීම
- ජාත්‍යන්තර සබඳතා - මෙය රටක් තවත් රටක් හෝ රටවල් කිහිපයක් සමග පවත්නා සබඳතා (වෙළඳ සබඳතා කලාපීය ගිවිසුම් ආදිය ලෙස දැක්විය හැකිය)

**03)**1.




2. සඳමාලිගෙ ව්‍යාපාරය අයත්වන්නේ කේවල ස්වාමි ව්‍යාපාර සංවිධාන වර්ගයටය

3. ව්‍යාපාර දැක්ම

"ගුණාත්මක සේවයක් සැපයීම උදෙසා ඉදිරියටම"

4.

- ඇඳුම් මැසීම පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම
- ඇඟළුම් කම්හලක වසර තුනක කාලයක් මහන මැෂින් ක්‍රියාකරවන්න ලෙස සේවය කර තිබීම
- සේවිකාවක් ලෙස පළපුරුදු ඇති තැනැත්තියක සම්බන්ධ කර ගැනීම

5.

- ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම පිළිබඳ අභියෝග
- ප්‍රාග්ධන මූල්‍ය ගැටලු / ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවීම
- වෙළෙඳපොළ ඉල්ලුම අඩුවීම

6.

1918 ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කර යුතුය

අයිතිකරු තමන්ගේ නමින් තොර වෙනත් නමකින් ව්‍යාපාර ඇරඹීමට අදහස් කරන නිසා එසේ කළ යුතුය.

7.

- ව්‍යාපාරය ලියාපදිංචි කිරීමෙන් ලැබෙන පහසුකම් නිසා මූල්‍ය පහසුකම් ලබා ගැනීමට පහසුවක් වීම
- පළපුරුදු සේවකයන් බඳවා ගැනීම
- වෙළඳපල අවස්ථා තාර්කිකව හඳුනාගැනීම
- ඉල්ලුමට සරිලන සැපයුමක් ලබාදීමට හැකි උපරිමයෙන් කටයුතු කිරීම

8.

- යටිතල පහසුකම් සංවර්ධනය
- යෙදවුම් සපයන සැපයුම්කරුවන්ගේ ද ව්‍යාපාර ඉහළ නැංවීම

9. ප්‍රාථමික, ද්විතීයික, තෘතීක ව්‍යාපාර මෙම ව්‍යාපාරය ද්විතීයික නිෂ්පාදනයට අයත් වේ

10. භාණ්ඩ සේවා හෝ අදහස්

මෙම ව්‍යාපාරයේ නිශ්පාදිතය භාණ්ඩ ලෙස පෙන්වා දිය හැකිය

**04)** 1.

- තනි පුද්ගල ව්‍යාපාර වලට වඩා වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත හැකිවීම
- වගකීම් සියලුම හවුල්කරුවන් අතර බෙදී යාම
- සාමූහිකව වඩාත් නිවැරදි තීරණ ගැනීමට හැකිවීම
- හවුල්කරුවන් සතු විවිධ දක්ෂතා වලින් උපරිම ප්‍රයෝජනයක් ලබාගත හැකිවීම

2.

- පහසුවෙන් ආරම්භ කිරීමට හැකිවීම
- ලාභය හවුල්කරුවන් අතර බෙදී යෑම
- හවුල්කරුවන් අතර මතභේද ඇතිවිය හැකි වීම
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම

3. ව්‍යාපාරයක නීතිමය පුද්ගලභාවය යනු යම්කිසි ව්‍යාපාරයක් නීතිය ඉදිරියේ කෘතිම පුද්ගලයකු වශයෙන් පිළිගැනීම නෛතික පුද්ගලභාවය හෙවත් නෛතික ස්වභාවය ලෙස හැඳින්වේ. මේ අනුව ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක් කට අනුව හඳුනාගත හැකිය. නෛතික පැවැත්මක් සහිත ව්‍යාපාර නෛතික පැවැත්මක් රහිත ව්‍යාපාර නෛතික පැවැත්මක් සහිත ව්‍යාපාර වන්නේ සංස්ථා, පොදු සමාගම්, සමුපකාර. නෛතික පැවැත්මක් නොමැති ව්‍යාපාර වන්නේ තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, දෙපාර්තමේන්තු.

4. 1918 ව්‍යාපාර නාම ආඥා පනත සහ 1890 හවුල් ආඥා පනත යටතේ ලියාපදිංචි කර යුතුය

5.

- අයදුම්පත්‍රය
- සාංගමික ව්‍යවස්ථාවලිය
- අධ්‍යක්ෂවරයෙක් ලෙස කටයුතු කිරීමට කැමැත්ත පළ කිරීමේ ප්‍රකාශය
- ලේකම්වරයෙකු ලෙස කටයුතු කිරීමට කැමැත්ත පළ කිරීමේ ප්‍රකාශයක්

**05)** 1. හවුල් ව්‍යාපාර වලට අයත් වේ
2. රුක්මල් උද්‍යානය ලියාපදිංචි කළ යුතු වේ. හවුල්කරුවන්ගේ නම් වලින් තොරව වෙනත් නමකින් එනම් "රුක්මල් උද්‍යානය" නමින් එම ව්‍යාපාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වන නිසා 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ එම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුය.

3. 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත

4. ශක්තීන් - රුක්ෂාන් පෙරාදෙනිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පිළිබඳ උපාධිධාරියෙක් වන අතර එම උපාධිය මගින් ගෙවතු අලංකරණය සම්බන්ධ දැනුම් සම්භාරයක් ඔහු වෙත එක් රැස් වී තිබීම /පෞද්ගලික ඉතුරුම් මුදල් එම ව්‍යාපාරය සඳහා භාවිතා කිරීම /අවට ප්‍රදේශවලින් ඉතාමත් පහසුවෙන් අමුද්‍රව්‍ය ලබාගත හැකිවීම
මාලඹේ නගරයේ වේගවත් ලෙස නිවාස ඉදිවෙමින් පවතින අතර මොහු ඒ නගරයේ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබයි. එය ව්‍යාපාරික අවස්ථාවක් ලෙස පෙන්වා දීමට හැකි ය
5.

- පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
- වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත හැකිවීම
- වගකීම හවුල්කරුවන් අතර අතර බෙදී යාම
- සාමූහික ව වඩාත් නිවැරදි තීරණවලට එළැඹීමට හැකි වීම
- හවුල්කරුවන්ගේ දක්ෂතා වලින් ප්‍රයෝජන ගත හැකි වීම

6.

- ලාභය හවුල් කරන්න අතර බෙදී යාම
- හවුල්කරුවන් අතර මතභේද ගැටලු ඇතිවිය හැකි වීම
- හවුල් කරුවන්ගේ වගකීම අසීමිත වීම
- නෛතික පුද්ගල භාවයක් නොමැති වීම
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම

7.

- හවුල් ව්‍යාපාරවලින් රැස් කරගත හැකි ප්‍රාග්ධනයට වඩා විශාල ප්‍රමණයක් රැස් කරගත හැකිවීම
- අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වීම
- වගකීම සීමිත වීම
- නෛතික පුද්ගල භාවයක් තිබීම
- අඛණ්ඩ පැවැත්මක් තිබීම

8.

- අයිතිකරුවන් - ව්‍යාපාරයේ ලාභය උපරිම කර ගැනීමට / ව්‍යාපාරයේ වර්ධනයට
- සේවකයන් - වැටුප් නිවරදිව ක්‍රමානුකූලව ලබාගැනීමට /රැකියාවේ සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීමට
- ගනුදෙනුකරුවන් - පරිබෝජනය සඳහා ගුණාත්මක නිෂ්පාදිත ලබා ගැනීමට /සාධාරණ මිලකට භාණ්ඩ ලබා ගැනීමට

9.

- ලාභය ඉහල නැංවීම
- ව්‍යාපාර කොටස වර්ධනය කිරීම
- තෘප්තිමත් ගනුදෙනුකරුවන් බිහිකරගැනීම
- පාරිභෝගික කීර්තිය ලභාකර ගැනීම

10. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවිධානයක් ලෙස පෙන්වා දීමට හැකි ය.

( එසේ වන්නේ කුඩා ප්‍රාග්ධනයක් ආයෝජනය කර ආරම්භ කර තිබීම, අඩු සේවක සංඛ්‍යාවක් සේවය කිරීම සහ වෙළෙඳපොළ කොටස කුඩා වීම නිසයි)

## 4 පාඩම
## ගිණුම්කරණය හැඳින්වීම

**01)** ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මැති පාර්ශව වල තීරණ ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමේ ක්‍රියාවලිය ගිණුම්කරණය ලෙස හැඳින්විය හැකිය.

එසේම ගිණුම්කරණයේ ප්‍රධානතම අරමුණ වෙන්නේ එම පාර්ශව වලට අවශ්‍යවිවිධ තොරතුරු සැපයීමයි. ඊට අමතරව මෙම ප්‍රධාන අරමුණ මත පදනම්ව තවත් අරමුණු ගණනාවක් හඳුනාගත හැකිය. ඒවා නම් ව්‍යාපාරය ප්‍රමාණවත් ලාභයක් උපයා තිබේ ද යන්න දැනගැනීම, ව්‍යාපාරයේ මූල් ඒ තත්ත්වය සතුටුදායක ද යන්න දැන ගැනීම, නීතිමය අවශ්‍යතා ඉටු කිරීම, ගනුදෙනු අමතක වීම සහ අතපසු වීම ආදිය තුළින් සිදුවිය හැකි අවාසි අවම කර ගැනීම හා මූල්‍ය කටයුතු ක්‍රමවත් කිරීමයි. එසේම මෙම ව්‍යාපාරයට ඇල්මැති සෑම පාර්ශවයක්ම විවිධ ස්වරූපයේ තීරණ ගන්නා අතර ඔවුන්ට ඒ සඳහා විවිධ තොරතුරු අවශ්‍යවේ. ඒ අනුව ගිණුම්කරණයේ අවශ්‍යතාවය පැන නගී.

**02)** අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වන අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභයක්ගලා එන්නාවූ ව්‍යාපාරය විසින් පාලනය කරන සම්පත් වත්කම් ලෙස හැඳින්විය හැකිය. මේ අනුව වත්කමක ලක්ෂණ පහත ලෙස සඳහන් කළ හැකිය. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවීම ,ව්‍යාපාරයේ පාලනයට යටත් වීම, අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම.

අතීත ගනුදෙනුවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇති වන ව්‍යාපාරය විසින් ගෙවිය යුතු අගය වගකීම ලෙස හැඳින්විය හැකිය. මේ අනුව වගකීමක ලක්ෂණ පහත දැක්වේ. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම, බේරුම් කිරීමේ දී ව්‍යාපාරය සම්පත් වලින් කොටසක් පිටතට ගලා යාම , වර්තමාන බැඳීමක් තිබීම.

**03)**

| අයිතම | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|
| | ජංගම වත්කම් | ජංගම නොවන වත්කම් | ජංගම වගකීම් | ජංගම නොවන වගකීම් |
| 1.දැව තොගය | √ | | | |
| 2.ණය පදනම මත මිලදී ගත් දැව සඳහා ගෙවිය යුතු මුදල | | | √ | |
| 3.ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු සඳහා ලබාගත් බැංකු ණය | | | | √ |
| 4.දැව කපන යන්ත්‍ර | | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| 5.ඉදිරියට ගෙවා ඇති දුරකථන ගාස්තු | √ | | | |
| 6.ව්‍යාපාරය පවත්වාගෙන යන ගොඩනැගිල්ල | | √ | | |
| 7.ගෙවිය යුතුව පවතින විදුලි ගාස්තු | | | √ | |
| 8.ලී බඩු ණයට විකුණුම් වලින් ලැබීමට ඇති මුදල | √ | | | |
| 9.ව්‍යාපාරය වැඩ කටයුතු සඳහා භාවිතා කරන මෝටර් රථය | | √ | | |
| 10.ගෙවිය යුතු රක්ෂණ ගාස්තු | | | √ | |

## 05 පාඩම

## ගිණුම්කරණ සමීකරණය

**01)**

| | වත්කම් = | වගකීම් + | හිමිකම් |
|---|---|---|---|
| i. | 470,000 | 180,000 | 290,000 |
| ii. 01 | − 15,000<br>+ 25,000<br>+ 15,000 | | + 25,000 |
| 02 | − 10,000 | − 10,000 | |
| 03 | | + 6,400<br>+ 4,500 | − 6,400<br>− 4,500 |
| 04 | − 8,000 | − 6,000 | − 2,000 |
| 05 | − 13,500 | − 15,000 | + 1,500 |
| 06 | + 28,000<br>− 28,000 | | |
| 07 | − 24,000 | | − 24,000 |
| 08 | + 50,000 | + 50,000 | |
| 09 | − 5,000 | | − 5,000 |
| 10 | − 3,500 | | − 3,500 |

**02)** i.

| | වත්කම් = | වගකීම් + | හිමිකම් |
|---|---|---|---|
| | 500,000 | 150,000 | 350,000 |
| 01 | + 60,000<br>− 50,000 | | + 10,000 |
| 02 | + 34,000 | + 34,000 | |
| 03 | − 13,000<br>+ 26,000 | | + 13,000 |
| 04 | − 40,000 | | − 40,000 |
| 05 | − 7,000 | | − 7,000 |
| 06 | − 5,000 | | − 5,000 |
| 07 | | + 2,000 | − 2,000 |
| 08 | + 2500<br>− 4,500 | | − 2,000 |
| 09 | − 4,000 | | − 4,000 |
| 10 | − 5,000<br>+ 3,600 | | − 1,400 |

ii. හිමිකම් = ( 350,000+10,000+13,000 ) −(40,000+7,000+5,000+2,000+2,000+4,000+1,400 )

= **රු. 311,600**

**03)**

1. හිමිකරු ප්‍රාග්ධනයලෙස රු 550,000 ව්‍යාපාරයට යෙදවීම
2. රු. 250,000ක් වටිනා ලී බඩු ණය පදනම මත ලබා ගැනීම
3. රු.12,000 ක් වටිනා තොග ණය පදනම මත ලබා ගැනීම
4. පිරිවැය රු. 20,000 වූ තොග රු. 50,000 කට ණයට විකිණීම
5. රු 4,500 ක ණයගැති අගයක් බොල් ණය ලෙස කපා හැරීම
6. ණය ගැතියන් ගෙන් රු. 65,000ක් මුදල් ලැබීම
7. ගෙවිය යුතුව තිබූ රු. 82,000 ණයහිමි අගයක් පියවීම
8. රු. 9,000 ක විදුලි ගාස්තු ගෙවීම
9. රු. 3,500ක ලී බඩු ක්ෂය වීම
10. රු. 2,000 පොලී ඇතුළත් රු. 10,000 ණය වාරිකය ගෙවීම

## 6 පාඩම
## ගනුදෙනු වල ද්විත්ව බලපෑම

**01)**

i. මුදල් පොත - හර රු.200,000
ප්‍රාග්ධන ගිණුම - බැර රු.200,000

ii. තොග ගිණුම - හර රු.100,000
ණය හිමි ගිණුම - බැර රු.100,000

iii. ණය ගැති ගිණුම - හර රු. 50,000
තොග ගිණුම - බැර රු. 50,000

iv. මුදල් පොත -හර රු. 80,000
තොග ගිණුම - බැර රු. 80,000

v. මුදල් පොත - හර රු. 100,000
බැංකු ණය ගිණුම - බැර රු. 100,000

vi. ණයගැති නිමල් ගිණුම - හර රු. 30,000
විකුණුම් ගිණුම - බැර රු. 30,000

vii.ගැනිලි ගිණුම - හර රු. 5,000
මුදල් පොත - බැර රු. 5,000

viii.ගොඩනැගිලි කුලී ගිණුම - හර රු. 10,000
මුදල් පොත - බැර රු. 10,000

ix. රක්ෂණ ගාස්තු ගිණුම - හර රු. 8,000
මුදල් පොත - බැර රු. 8,000

x. ණය පොලී ගිණුම - හර රු. 5,000
මුදල් පාත - බැර රු. 5,000

**02)**

මුදල් පොත

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම | දිනය | විස්තරය | ස.පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 2020.04.01 | ඉ/ගෙ/ශේෂය | | 100,000 | 2020.04.07 | ගැනුම් ගිණුම | | 50,000 |
| 2020.04.02 | ප්‍රාග්ධන ගිණුම | | 50,000 | 2020.04.06 | සේවක වැටුප් | | 20,000 |
| 2020.04.05 | විකුණුම් ගිණුම | | 30,000 | 2020.04.09 | ගිණුම | | 8,000 |
| 2020.04.10 | විකුණුම් ගිණුම | | 20,000 | 2020.04.19 | රක්ෂණය | | 10,000 |
| 2020.04.28 | විකුණුම් ගිණුම | | 50,000 | 2020.04.22 | වාරිකය | | 50,000 |
| | | | | 2020.04.30 | අලුත්වැඩියා | | 5,000 |
| | | | | | වියදම් | | 107,000 |
| | | | | | ස්ථාවර | | |
| | | | 250,000 | | තැන්පතුවක් | | 250,000 |
| | | | | | ගැනිලි ගිණුම | | |
| | | | | | ශේෂය ප/ගෙ | | |
| | | | 107,000 | | | | |
| | ශේෂය ඉ/ගෙ | | | | | | |

i.ප්‍රාග්ධන ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2020.04.31 | ශේෂය ප/ගෙ | | 200,000 | 2020.04.01 | ශේෂය ඉ/ගෙ | | 150,000 |
| | | | | 2020.04.02 | මුදල් පොත | | 50,000 |
| | | | 200,000 | | | | 200,000 |
| | | | | | ශේෂය ඉ/ගෙ | | 200,000 |

ii.විකුණුම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2020.04.31 | ශේෂය ප/ගෙ | | 100,000 | 2020.04.05 | මුදල් පොත | | 30,000 |
| | | | | 2020.04.10 | ණයගැති ගිණුම | | 20,000 |
| | | | | 2020.04.28 | මුදල් පොත | | 50,000 |
| | | | 100,000 | | | | 100,000 |
| | | | | | ශේෂය ඉ/ගෙ | | 100,000 |

iii.ගැනුම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2020.04.07<br>2020.04.16 | මුදල් පොත<br>ණය හිමි ගිණුම | | 50,000<br>15,000 | 2020.04.31 | ශේෂය ප/ගෙ | | 65,000 |
| | | | 65,000 | | | | 65,000 |
| | ශේෂය ඉ/ගෙ | | 65,000 | | | | |

iv.ණයගැති ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2020.04.01<br>2020.04.05 | ශේෂය ඉ/ගෙ<br>විකුණුම් ගිණුම | | 80,000<br>20,000 | 2020.04.31 | ශේෂය ප/ගෙ | | 100,000 |
| | | | 100,000 | | | | 100,000 |
| | ශේෂය ඉ/ගෙ | | 100,000 | | | | |

v.සේවක වැටුප් ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2020.04.15 | මුදල් පොත | | 20,000 | 2020.4.31 | ශේෂය ප/ගෙ | | 20,000 |
| | | | 20,000 | | | | 20,000 |
| | ශේෂය ඉ/ගෙ | | 20,000 | | | | |

viණය හිමි ගිණුම.

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2020.4.31 | ශේෂය ප/ගෙ | | 65,000 | 2020.04.01<br>2020.04.07 | ඉ/ගෙ/ශේෂය<br>ගැනුම් ගිණුම | | 50000,<br>15000, |
| | | | 65,000 | | | | 65,000 |
| | | | | | ඉ/ගෙ/ශේෂය | | 65,000 |

vii.රක්ෂණ වාරික ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2020.04.17 | මුදල් පොත | | 8,000 | 2020.4.31 | ශේෂය ප/ගෙ | | 8,000 |
| | | | 8000 | | | | 8000 |
| | ඉ/ගෙ/ශේෂය | | 8000 | | | | |

viii.අලුත්වැඩියා වියදම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2020.04.09 | මුදල් පොත | | 10,000 | 2020.4.31 | ශේෂය ප/ගෙ | | 10,000 |
| | | | 10,000 | | | | 10,000 |
| | ශේෂය පගෙ/ | | 10,000 | | | | |

ix.ස්ථාවර තැන්පතු

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2020.04.22 | මුදල් පොත | | 50,000 | 2020.4.31 | ශේෂය ප/ගෙ | | 50,000 |
| | | | 50,000 | | | | 50,000 |
| | ශේෂය ඉගෙ/ | | 50,000 | | | | |

xi.ගැනිලි ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2020.04.30 | මුදල් පොත | | 5,000 | 2020.4.31 | ශේෂය ප/ගෙ | | 5,000 |
| | | | 5,000 | | | | 5,000 |
| | ශේෂය ඉගෙ/ | | 5,000 | | | | |

**03)**

i. රු. 50,000ක අත්පිට විකුණුම් සිදු කිරිම.
ii. රු. 10,000ක භාණ්ඩ කමල්ට ණයට විකිණීම
iii.රු. 8,000ක භාණ්ඩ විමල්ට ණයට විකිණීම.
iv.රු.30,000ක භාණ්ඩ තොගයක් ණයට ලබා ගැනිම.
v. රු. 12,000ක තොගයක් අත්පිට මුදලට ලබා ගැනිම.
vi.රු. 40,000ක් වටිනා ලී බඩු තොගයක් මිලදී ගැනිම.
vii.රු.100,000ක බැංකු ණයක් ලබා ගැනිම.
viii. බැංකු ණය වාරිකය රු. 10,000ක් ගෙවීම.
ix. රු. 3,000 අයිතිකරුගේ ප්‍රයෝජනයට ලබා ගැනිම.
x.රු.1,500ක කොමිස් ආදායම් මුදලින් ලැබීම.
xi.ණයගැති කමල් රු. 2,500ක් මුදලින් ගෙවීම

**07 පාඩම**

**මූලික සටහන් පොත්**

**01)** ව්‍යාපාරයක සිදු වන සෑම ගනුදෙනුවක් ම ලෙජර ගිණුම්වල සටහන් කිරීමට ප්‍රථම එම ගනුදෙනු සිදු වූ අනුපිළිවෙලින් පොදුවේ පිළිගත් ක්‍රමයකටඅනුව පළමුවෙන් ම සටහන් කරන පොත් මූලික සටහන් පොත් යනුවෙන් හඳුන්වයි.

**02)**

| | **ගනුදෙනු** | **මූලික සටහන් පොත්** | **මූලාශ්‍ර ලේඛන** |
|---|---|---|---|
| i. | සුළු මුදල් ගනුදෙනු | සුළු මුදල් පොත | සුළු මුදල් ගෙවීම් වවුචර |
| ii. | වෙළඳ භාණ්ඩ ණයට ගැනීම | ගැනුම් ජ'නලය | ගැනුම් ඉන්වොයිසිය |
| iii. | භාණ්ඩ ණයට විකිණීම | විකුණුම් ජනලය | විකුණුම් ඉන්වොයිසිය |
| iv. | බැංකුව ජංගම ගිණුම මගින් සිදුකරන ගනුදෙනු | බැංකු ගිණුම | තැන්පත් කිරීමේ කුවිතාන්සි ,ගෙවීම් වවුචර බැංකු ප්‍රකාශය අගරු චෙක් දැනුම්දීමේ නිවේදනය |
| v. | මුදල් ලැබීම් සහ මුදල් ගෙවීම් සම්බන්ධ ගනුදෙනු | මුදල් පොත | ලදුපත් ,ගෙවීම් වවුචර |
| vi. | වෙනත් ගනුදෙනු | පොදු ජ'නලය | ජ'නල් වවුවරය |

**03)**

- කාලපරිච්ඡේදයකට අයත් එකම ස්වරූපයේ ගනුදෙනු වර්ග කර සටහන් කිරීමට අවශ්‍යවීම
- එක් එක් මූලික සටහන් පොත් පිළියෙල කිරීමේ වගකීම වෙන වෙනම පුද්ගලයන් වෙත නිශ්චිතව පැවරිය හැකි වීම හා එමඟින් ඇතිවිය හැකි වැරදි සහ වංචා අවම කරගත හැකි වීම.
- මූලික සටහන් පොත් වල වටිනාකම් වල එකතු ගිණුම් වලට පිටපත් කළ හැකි නිසා ලෙජර් ගිණුම් තුළ තබන සටහන් සංඛ්‍යාවඅඩුවීම මගින් ලෙජර පවත්වා ගැනීම පහසු වීම.
- මූලික සටහන් පොත් වල ගනුදෙනු සටහන් කළ පසු ඒවා ලෙජර් ගිනුම් වලට පිටපත් කිරීම විධිමත් වීම හා පහසු වීම.
- ගිණුම්කරණ දෝෂ අඩු වීම සහ සිදුවන දෝෂ හඳුනාගැනීම පහසු වීම

**04)** ව්‍යාපාර ගනුදෙනු සිදු වූ විට එම ගනුදෙනුවට මුල් වී ක්‍රියා කරන අංශය විසින් ගනුදෙනුව පිළිබඳ සියලු විස්තර අන්තර්ගත කොට වගකිවයුතු නිලධාරියකු විසින් අත්සන් කර පිළියෙල කරන ලියවිලි මූලාශ්‍ර ලියවිලි ලෙස හැඳින්වේ.

**05)**

- ගනුදෙනුවට අදාළ ආරම්භක ලියවිල්ල ලෙස යොදාගත හැකිවීම
- ගනුදෙනුව පිළිබඳ අතිරේක විස්තර ලබා ගත හැකි වීම
- ගනුදෙනු මූලික සටහන් පොත් වල ලිවීමේදී යොදා ගත හැකි වීම
- ගණුදෙනුව සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂියක් ලෙස භාවිතා කළ හැකි වීම
- වගකිවයුතු නිලධාරියෙකු අත්සන් කර ඇති නිසා වගකීම නිශ්චිතව පැවරිය හැකි වීම.

## 08 පාඩම

**01.** **මුදල් පොත සහ සුළු මුදල් පොත**

| මුදල් පොතේ හර පැත්තේ සටහන් කරන ගනුදෙනු | මුදල් පොතේ බැර පැත්තේ සටහන් කරන ගනුදෙනු | මුදල් පොතේ සටහන් නොකරන ගනුදෙනු |
|---|---|---|
| 1.අයිතිකරු ප්‍රාග්ධනය යෙදවීම<br>2.අත්පිට විකුණුම් සිදුවීම<br>3.පොලී ආදායම් ලැබීම<br>4.දුන් වට්ටම්<br>5.ණයගැතියන්ගෙන් මුදල් ලැබීම | 1.අත්පිට ගැනුම් සිදුකිරීම<br>2.ලද වට්ටම්<br>3.විදුලි බිල ගෙවීම<br>4.ණය හිමියන්ට මුදල් ගෙවීම | 1.ණයට විකුණුම් සිදුවීම<br>2.වෙළඳ වට්ටම්<br>3.ණයට ගැනුම්<br>4.ව්‍යාපාරයටඅයත් ගොඩනැගිල්ලෙන් කොටසක් ණයට විකිණීම |

**02)**

මුදල් පොත

| දිනය | විස්තරය | ල.අ. | දුන් වට්ටම් | වටිනාකම | දිනය | විස්තරය | ව.අ. | ලද වට්ටම් | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01.05.20 | ඉ/ගෙ/ශේෂය | | | 80000 | | ගැනුම් ගිණුම | 01 | | 40000 |
| 01.05.20 | ප්‍රාග්ධන | 01 | | 100000 | | බැංකු ණය | 02 | | 7000 |
| 02.05.20 | ගිණුම | 02 | | 50000 | | වාරිකය | 02 | | 3000 |
| 05.05.20 | බැංකු ණය | 03 | | 50000 | | බැංකු | 03 | | 2000 |
| 09.05.20 | ගිණුම | 04 | 3000 | 5000 | 15. | ණයපොලිය | 04 | | 9500 |
| 15.05.20 | විකුණුම් | 05 | | | 05. | ගැනිලි ගිණුම | 05 | 500 | 5000 |
| | ගිණුම | | | | 20 | ණය හිමි සුනිල් | | 300 | |
| | කොමිස් | | | 27000 | | ණය හිමි අමල් | | | 245,500 |
| | ආදායම | | 3, 000 | | | | | | |
| | ණයගැති | | | | | | | | |
| | සුජාතා | | | 312,000 | | ශේෂය ප/ගෙ | | 800 | 312,000 |
| | ශේෂය ඉ/ගෙ | | | 245,500 | | | | | |

ප්‍රාග්ධනය ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම | දිනය | විස්තරය | ස.පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | ශේෂය ප/ගෙ | | 292000 | 2020.05.01 | ශේෂය ඉ/ගෙ | | 150000 |
| | | | | 2020.05.01 | මුදල් පොත | | 100000 |
| | | | 292000 | | | | 292000 |
| | | | | | ශේෂය ඉ/ගෙ | | 292000 |

බැංකු ණය ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම | දිනය | විස්තරය | ස.පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | මුදල් පොත | | 7000 | 2020.05.01 | මුදල් පොත | | 50,000 |
| | ශේෂය ප/ගෙ | | 43,000 | 2020.05.01 | | | |
| | | | 50,000 | | | | 50000 |
| | | | | | ශේෂය ඉ/ගෙ | | |

## ගැනුම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2020.05.03 | මුදල් පොත | | 40,000 | | ශේෂය ප/ගෙ | | 75,000 |
| 2020.05.07 | ණය හිමි අමල් ගිණුම | | 20,000 | | | | |
